# කඩතිර ඉරා...



**කඩතිර ඉරා...**

**© නිදහස් මාධ්‍ය ව්‍යාපාරය - 2023 ජූනි**

ISBN 978-624-0000-00-0

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශයන් ගේ නිසි අවසරයකින් තොරව මෙම වාර්තාව සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක් උපුටා දැක්වීම, මුද්‍රිත, ලිඛිත, ඉලෙක්ට්‍රොනික් ආදි කවර මාධ්‍යයකින් හෝ පිටපත් කිරීම විකාශනය කිරීම අනුවර්තනය කිරීම හා ව්‍යාජ ලෙස සැකසූ පිටපත් අලෙවි කිරීම, බෙදා හැරීම සම්පූර්ණයෙන්ම තහනම් වේ.

**ප්‍රකාශනය**
**නිදහස් මාධ්‍ය ව්‍යාපාරය**
**අංක 96 බර්නාඩ් සොයිසා මාවත,**
**කොළඹ 05**
දුරකතනය: 011 236 8895
විද්‍යුත් තැපෑල: fmmsrilanka@gmail.com
අන්තර්ජාලය: www.fmmsrilanla.lk

**චීනය හා ඉන්දියාව අභිබවා මහ රෑ මෙහෙයුමකින් ශ්‍රී ලංකාවේ විදුලි බලාගාරවලට ගෑස් සැපයීමේ ඒකාධිකාරය ලබාගත් ඇමරිකාව** - ලසන්ත රුහුණගේ 5

**සැහැල්ලු දුම්රිය අහෝසි කළේ කාගේ වුවමනාවටද?** - බිඟුන් මේනක ගමගේ 9

**ත්‍රිකුණාමල වරාය සහ තෙල් ටැංකි පර්යන්තය** - හර්ෂණ තුෂාර සිල්වා 14

**චීන උගුලට හසුව ගලායන යාන්ඔය කඳුළු** - ලක්මාල් කේ. බදුගේ 17

**නෙළුම් කුළුණේ උස හා එහි පාදමේ දිග පළල** - සුනිල් ජයසේකර 21

**ණය වතුරේ ගිලී ගිය උමා ඔය සිහිනය** - ඩී.එන්. කුමාරගේ 24

**හම්බන්තොට වරාය ගිලගත් චීන ණය උගුල** - රාහුල් සමන්ත හෙට්ටිආරච්චි 28

**අති විශාල බදු සහ තීරු බදු සහන දෙමින් ඩොලර් වෙනුවට රුපියල්වලට විකිණෙන කොළඹ පෝර්ට් සිටි හෙවත් චීන කොළණිය** - ලසන්ත රුහුණගේ 36

**ලංකාවට තවත් ණය බරක් එකතු කරපු (ASMPh) ඩොලර් මිලියන 61.19 කට කරපු දේ?** - රාහුල් සමන්ත හෙට්ටිආරච්චි 40

**'මත්තල ගුවන් තොටුපල' ශක්‍යතා අධ්‍යයනය ඉදිකිරීම් සහ මෙහෙයුම් වසර දහයක් තුළ මිලියන 58,136 ක පාඩුවක්** - ආර්. රාම් 49

**නොරොච්චෝලේ තාප විදුලි ව්‍යාපෘතිය: ශ්‍රී ලංකාව උගුලකට හසු වීද ?** - වී. ප්‍රියදර්ශන් 57

# චීනය හා ඉන්දියාව අභිබවා මහ රෑ මෙහෙයුමකින් ශ්‍රී ලංකාවේ විදුලි බලාගාරවලට ගෑස් සැපයීමේ ඒකාධිකාරය ලබාගත් ඇමරිකාව

ලසාන්ත රුහුණගේ

'සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී විනිවිදභාවය හා ආයෝජනය කරනු ලබන මුදලට සරිලන වටිනාකමක් ලැබෙන බව (value for money) සහතික කිරීම පිනිස තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය කිරීම රජය විසින් අවධාරණය කරනු ලබන අතර, ස්වකැමැත්තෙන් ඉදිරිපත් කරනු ලබන අනාරාධිත යෝජනා (Unsolicited Proposals) අධෛර්යවත් කිරීම සිදු කරනු ලබයි. එසේ වුවද, ආයෝජකයින් විසින් අනාරාධිතව ඉදිරිපත් කරනු ලබන යෝජනාවල අන්තර්ගත සාම්ප්‍රදායික තාක්ෂණයෙන් බැහැර වූ හා මෙතෙක් අවධානය යොමු නොවූ විභවතාවන් අනාවරණය කරගැනීම වැනි සාධනීය ලක්ෂණ සැලකිල්ලට ගෙන ලොවපුරා බොහෝ රටවල් එවන් යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ස්විස් විමසුම් ක්‍රමවේදය (Swiss Challenge Procedure) අනුගමනය කරයි. එබැවින් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කාරක සභාවේ නිර්දේශය පරිදි, ස්වකැමැත්තෙන් ඉදිරිපත් කරනු ලබන අනාරාධිත යෝජනා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය විසින් පිළියෙල කරන ලද ස්විස් විමසුම් කාර්ය පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ (Guidelines on Swiss Challenge Procedure), රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වශයෙන් ඇතුලත් කිරීම පිණිස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වශයෙන් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කරන ලදී.'

2016.08.09 දිනැති ස්විස් විමසුම් කාර්ය පටිපාටිය පිළිබඳ මාර්ගෝපදේශ සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණයේ එසේ සඳහන් කර ඇත.

එම ප්‍රතිපත්තියේ සඳහන් ස්විස් විමසුම් යෝජනාවක් මුලින්ම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වන්නේ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ යෝජනාවක් ලෙස 2016 වර්ෂයේ ජූලි මාසයේදීය. එම යෝජනාවම නැවත 2017 ඔක්තෝබර් මාසයේදී ඉදිරිපත් වන්නේ එවක විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති ඇමති රංජිත් සියඹලාපිටියගේ හා විශේෂ කාර්ය භාර ඇමති සරත් අමුණුගමගේ ගේ ඒකාබද්ධ යෝජනාවක් ලෙසය. එම යෝජනාව ඉදිරිපත් කර තිබුණේ කොරියාවේ SK E & S නම් සමාගමක්ය. එම සමාගම ස්වෙච්ඡා යෝජනාවක් (Unsolicited Proposals) ඉදිරිපත් කර තිබුනේ කොළඹ අවට මුහුදේ ද්‍රවිකෘත ස්වභාවික ගෑස් නැවත පරිවර්තනය කිරීමේ හා ගබඩා කිරීමේ පර්යන්තයක් ඉදිකිරීම සහ ඊට අදාළ නළ මාර්ග ඉදිකිරීම හා දැනට ක්‍රියාත්මක ශ්‍රී ලංකාවේ ගෑස් බවට පරිවර්තනය කිරීමට නියමිත විදුලි බලාගාරවලට හා අලුතින් ඉදිකිරීමට නියමිත විදුලි බලාගාරවලට ස්වභාවික ගෑස් සැපයීම සඳහාය. ඒ සඳහා දකුණු කොරියාවේ එක්සිම් බැංකුව මූල්‍ය ආධාර සපයන බව සඳහන් විය.

කොරියානු සමාගම එම යෝජනාව ඉදිරිපත් කර තිබුනේ ඉදිකර, පවත්වාගෙන ගොස් පැවරීමේ හෙවත් බොට් (Build Oparate and Transfer) ක්‍රමය යටතේය. ඒ අනුව කොරියානු සමාගම පාවෙන ගෑස් පර්යන්තය හා නල මාර්ග ඉදිකර යම් කාලයක් ක්‍රියාත්මක කර නැවත ශ්‍රී ලංකාවට පැවරීමට එකඟවී තිබුණි.

කැබිනට් මණ්ඩලයට මෙම යෝජනාව ඉදිරිපත් වූ අවස්ථාවේදී විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයා එම යෝජනාව ඇගැයීමට ලක්කරන ලෙස විදුලි බල මණ්ඩලය විසින් පත්කරන ලද විදුලි බල උත්පාදන, ප්‍රසම්පාදන හා සංවර්ධනය පිළිබඳ මෙහෙයුම් කමිටුවට යොමුකර තිබුණි. එම මෙහෙයුම් කමිටුව ඒ සම්බන්ධයෙන් වූ සිය වාර්තාව 2019 ජනවාරි 02 දින අමාත්‍යාංශ ලේකම්වරයාට යොමු කරමින් සඳහන් කර තිබුණේ, ඇමරිකානු ඩොලර්

බිලියන 07ක් වැය වන මෙම ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව තුළ සිදුකරන්නට යන විශාලතම ව්‍යාපෘතිය බවයි. ඒ නිසාම ව්‍යාපෘතියේ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතු බවයි.

එම කමිටුව අවධාරණයට ලක්කර තිබූ අනෙක් කරුණු අතර තවත් වැදගත් කරුණක් වූයේ පාවෙන ගෑස් පර්යන්තයක් ඉදි කිරීම සහ විදුලි බලාගාරවලට අදාළ ගෑස් මිලදී ගැනීම වෙනම ව්‍යාපෘති දෙකක් වශයෙන් ක්‍රියාත්මක කළ යුතු බවයි. එමෙන්ම නිශ්චිත ගෑස් ප්‍රමාණයක් මිලදී ගන්නා බවට එකඟ නොවිය යුතු බවයි. එසේ වුවහොත් එකඟ වූ ප්‍රමාණයට ගෑස් මිලදී ගත්තත් නැතත් එකඟ වූ ප්‍රමාණයටම මුදල් ගෙවීමට සිදුවනු ඇති බවයි. තවද යෝජනාව තුළ සඳහන් කර ඇති කෙරවලපිටිය ප්‍රදේශයේ අනාගතයේ ඉදිකිරීමට නියමිත බලාගාර ඉදිකරනවාද නැද්ද යන්න නිශ්චිත නැති බවයි. කැලණිතිස්ස චක්‍රීය බලාගාරයට යෝජනාවේ සඳහන් ප්‍රමාණයට ගෑස් අවශ්‍ය නැති බවයි. ශ්‍රී ලංකාවේ ඉදිරි ගෑස් අවශ්‍යතාවය යෝජනාවේ සඳහන් ප්‍රමාණය මෙන් සියයට 50ක් පමණ විය හැකි බවයි.

ගෑස් මිලදී ගැනීම සඳහා වසර 20ක ගිවිසුමක් ව්‍යාපෘතියෙන් යෝජනා කර ඇති බවත්, තවත් වසර 10ක් වැනි කාලයකදී මන්නාරම් ද්‍රෝනියෙන් ගෑස් ලබා ගැනීමේ ඉහළ විභවතාවයක් පවතින බවත්, එසේ වුවහොත් එම ගෑස් විදුලි බලාගාරවලට භාවිතයට ගැනීමේ හැකියාව ඇති බවත් එම කමිටුව පෙන්වා දී තිබුණි.

ඉන්පසු මෙම යෝජනා සම්බන්ධයෙන් විරෝධය පළකළේ ලංකා විදුලි බල මණ්ඩලයේ ඉංජිනේරු සංගමයයි. ඒ 2019 ජනවාරි 17 දින සහිතව විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම්වරයාට ලිපියක් යොමු කරමින්ය. එහිදී ඉංජිනේරු සංගමය සඳහන් කළේ, ස්වභාවික ද්‍රවිකෘත ගෑස් ව්‍යාපෘති පිළිබඳ යෝජනා ඇගැයීමේදී එහි අවදානම හා ප්‍රතිලාභ ගැනත්, නීතිමය කරුණු හා වානිජමය කරුණු ගැනත් අවධානය යොමුකළ යුතු බවයි. එමෙන්ම විනිවිද හා සාධාරණ තරගකාරිත්වයකට අවකාශ සැලසිය යුතු බවයි. මෙවැනි ක්ෂේවල යෝජනා සාධාරණ තරගකාරිත්වයකට බාධා පමුණුවන බවයි. තවද ගෑස් පිළිබඳ යටිතල පහසුකම් හා ගෑස් මිලදී ගැනීමේ කටයුතු වෙන වෙනම ගිවිසුම් යටතේ සිදුකළ යුතු බවයි. ගෑස් මිලදී ගැනීමේ ගිවිසුම් වසර 10කට වැඩි කාලයක් සඳහා නොවිය යුතු බවයි.

එම විරෝධතා හා නිරීක්ෂණයන් එසේ ඉදිරිපත් වී තිබියදී ඉන්පසු සිදුවූයේ කොරියානු සමාගමේ ස්වෙච්ඡා යෝජනාව ස්විස් විමසුම් ක්‍රමයට අභියෝග කිරීම සඳහා පුවත්පත් දැන්වීමක් පලකිරීමය. ඊට අදාළ පුවත්පත් දැන්වීම 2018 නොවැම්බර් 05 දින ඩේලි නිව්ස් පුවත්පතේ පලවිය. එම දැන්වීමට අනුව විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ජාත්‍යන්තර මිල ගණන් යෝජනා කැඳවීමක් සිදුකර තිබුණි. ඒ ස්විස් චැලේන්ජ් හෙවත් ස්විස් විමසුම් ක්‍රමවේදය යටතේ කොළඹ වරාය අවට මුහුදේ ද්‍රවිකෘත ස්වභාවික ගෑස් ගබඩා කිරීමේ හා නැවත ගෑස් බවට පරිවර්තනය කිරීමේ පර්යන්තයක් ඉදිකිරීම සහ ඊට අදාළ නල මාර්ග සකස් කිරීම හා ගෑස් සැපයීම සම්බන්ධයෙන්ය. එහිදී සිදුකෙරුණේ ඉහතින් සඳහන් කරන ලද කොරියානු යෝජනාවට ප්‍රතිවිරුද්ධ යෝජනා කැඳවීමය. නැත්නම් කොරියානු යෝජනාවට අභියෝග කළ හැකි යෝජනා කැඳවීමය. ශ්‍රී ලංකාව එම ක්‍රමවේදය යටතේ ව්‍යාපෘතියක් සඳහා යෝජනා කැඳවූ පළමු අවස්ථාව එය විය.

නමුත් එම ප්‍රතිවිරුද්ධ යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබුණේ සීමිත දින ගණනකි.ඒ දෙසැම්බර් 12 දින දක්වා දින 35ක පමණ කාලයක්ය. කොරියානු සමාගමටම එම ව්‍යාපෘතිය ලබාදීම එහි අරමුණ වූ බව සීමිත දින ගණනක කාලයක් අභියෝග කරන්නන්ට ලබාදීමෙන් පැහැදිලි විය. එම ස්විස් විමසුම් ක්‍රමවේදය ඔස්සේ යෝජනා කැඳවූයේ ස්වෙච්ඡා යෝජනා සම්බන්ධයෙන් රාපක්ෂවරුන්ට වඩා බොරු විනිවිදභාවයක් පෙන්නීම සඳහා පමණය. එහිදී ස්විස් විමසුම් ක්‍රමවේදයේදී සිදුකළ යුතු මුල් යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් කොරියානු සමාගමේ ව්‍යාපෘති යෝජනාවේ මිල ගණන් අභියෝග කරන්නන්ට ඉදිරිපත් කළේ නැත. ස්විස් විමසුම් යෝජනාවකදී තවත් සමාගමකට එම ව්‍යාපෘතිය ලබාගත හැක්කේ මුල් යෝජනාකරුගේ යෝජනාවට වඩා හොඳ සහ ලාභදායි යෝජනාවක් ඉදිරිපත් කළහොත් පමණය. එසේ හොඳ සහ ලාභදායි යෝජනාවක් ඉදිරිපත් කර යම් සමාගමක් එම ව්‍යාපෘතිය හිමිකර ගත්තද, මුල් ස්වෙච්ඡා යෝජනාව ඉදිරිපත් කළ සමාගමට එම යෝජනාව සංවර්ධනය කිරීම සඳහා වැයවූ මුදල අභියෝග කර ව්‍යාපෘතිය ලබා ගන්නා සමාගම ගෙවිය යුතුය.

එම කොරියානු සමාගමේ යෝජනාව එසේ අභියෝගයට ලක්වෙමින් තිබියදී සිදුවූයේ කුමක්ද? එවක ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනියගේ මැදිහත් වීමෙන් කෙරවලපිටිය යුගදනවි බලාගාරයේ ආණ්ඩුවට හිමි සියයට 51ක කොටස් අයිතියෙන් සියයට 27ක කොටස් අයිතිය ඇමරිකාවේ නිව් ෆෝට්රස් නම් සමාගමකට ලබාදීම සඳහා හා තවත් කරුණු ඇතුලත් යෝජනාවක් භාණ්ඩාගාර ලේකම්වරයාට යොමු වීමය. ඒ සම්බන්ධයෙන් විරෝධය පළකරන බව දන්වමින් ලංකා විදුලි බල මණ්ඩලයේ ඉංජිනේරු සංගමය 2021 වර්ෂයේ ජුලි මාසයේදී එවක විදුලි බල හා බලශක්ති ඇමති ඩලස් අලහප්පෙරුමට ලිපියක් යවමින් දැනුම් දුන්හ.

එම ලිපියේ සඳහන් කර තිබුනේ මෙගාවොට් 300ක ධාරිතාවෙන් යුත් යුගදනවි විදුලි බලාගාරය ස්වභාවික ගෑස් හෙවත් එල්එන්ජී වලින් ක්‍රියාත්මක කිරීම සඳහා පරිවර්තනය කිරීමත්, ඒ සඳහා අවශ්‍ය ස්වභාවික ගෑස් සැපයීම නිව් ෆෝට්රස් එනර්ජි සමාගම සිදු කිරීමට යන බවටත් එම යෝජනාව සම්බන්ධයෙන් අවබෝධයක් ඇති බවය. එසේම ඒ සඳහා බලාගාරය අවට මුහුදේ ද්‍රවිකෘත ගෑස් පරිවර්තනය කිරීමේ පාවෙන පර්යන්තයක් ඉදිකිරිම හා එහි සිට විදුලි බලාගාරයට ගෑස් සැපයීමට ගොඩබිමට නල මාර්ගයක් ඉදිකිරීමේ ව්‍යාපෘතියක්ද

මෙම යෝජනාවට අයත් බව ලංකා විදුලි බල මණ්ඩල ඉංජිනේරු සංගමය දක්වා තිබුණි.

එය යථාර්ථයක් බවට පත්වූයේ එවක මුදල් ඇමති බැසිල් රාජපක්ෂ 2021 සැප්තැම්බර් 06 දින සහිතව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාව අනුවය. එහි උධෘතය වූයේ ' විදුලි බල උත්පාදන පිරිවැය අඩු කිරීම සඳහා වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාග මේ ආයෝජනය කිරීම' යන්නය.

එහි ආරම්භයේ සඳහන් කරන්නේ නිව් ෆෝට්රස් සමාගම හා ශ්‍රී ලංකා රජය අතර රාමුගත ගිවිසුමකට එළඹීම සඳහා 2021.05.07 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් මගින් මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාට බලය පවරා ඇති බවත්, ඒ අනුව රාමුගත ගිවිසුම 2021.07.07 දින අත්සන් කර ඇති බවත්ය.

එම රාමුගත ගිවිසුමේ සඳහන් කරුණු ලෙස එහි සඳහන් කරන්නේ, කෙරවළපිටිය යුගදනවි බලාග ාරය අයත් වෙස්ට් කෝස්ට් සමාගමේ සියයට 40ක කොටස් විකිණීම, නැවත ගෑස් බවට පරිවර්තනය කිරීම සහිත පාවෙන ගෑස් ගබඩා ඒකකයක් සහිත පර්යන්ත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම, නල මාර්ග ඇතුලත් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා වෙස්ට් කෝස්ට් සමාගම හා වෙනත් ඕනෑම බලාගාරයක් වෙත ස්වභාවික ද්‍රවිකෘත ගෑස් සැපයීම යන ඒවාය.

එමෙන්ම එම කැබිනට් පත්‍රිකාවේ සඳහන් කර ඇත්තේ මහා භාණ්ඩාගාර ලේකම් විසින් නිව් ෆෝට්රස් සමාගම සමඟ සාකච්ඡා කිරීම සඳහා භාන්ඩාගාරයේ, විදුලි බල අමාත්‍යාංශයේ, ලංකා විදුලි බල මණ්ඩලයේ හා ගෑස් ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් සමන්විත කමිටු දෙකක් පත්කර ඇති බවයි.

එසේම එහි තවදුරටත් සඳහන් වන්නේ, රාමුගත ගිවිසුමෙන් එකඟ වූ පරිදි වෙස්ට් කෝස්ට් සමාගමේ සියයට 40ක කොටස් අයිතිය ඇමරිකානු ඩොලර් මිලියන 250ක මුදලකට මිලදී ගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, එය ශ්‍රී ලංකා රජයේ තක්සේරුකරු ඉදිරිපත් කර ඇති තක්සේරුවට දළ වශයෙන් අනුකූල වන බවය.

තවද රාමුගත ගිවිසුම යටතේ දක්වා ඇති බදු සහන හා ආයෝජන දිරි දීමනා ලබාදීමට ශ්‍රී ලංකා රජව එකඟ වී ඇති බවත් හා ඒ අනුව 2008 අංක 14 දරන උපායමාර්ග ික සංවර්ධන පනත යටතේ දිරි දීමනා ලබාදීමට සුදුසුකම් ඇති ව්‍යාපෘතියක් ලෙස එය සලකන බවත්ය.

ඒ වනවිටත් විරෝධයට ලක්වී තිබුණ පාවෙන ගෑස් බලාගාර ව්‍යාපෘතිය හා එහි නල පද්ධතිය සම්බන්ධයෙන් වූ කරුණු එම කැබිනට් පත්‍රිකාවේ සඳහන් වන්නේ ' විදුලි බලාගාර වෙත ද්‍රවිකෘත ස්වභාවික ගෑස් සැපයීම සහ පර්යන්ත ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු' ලෙසය.

ඒ යටතේ සඳහන් කරන්නේ රාමුගත ගිවිසුම මගින් නිව් ෆෝට්රස් සමාගමට වසර 5ක කාලයක් සඳහා වෙස්ට් කෝස්ට් සමාගම වෙත ද්‍රවිකෘත ස්වභාවික ගෑස් සැපයීමට අවස්ථාව ලබාදී ඇති බවය. එමෙන්ම කෙරවළපිටිය යුගදනවි බලාගාරය ආසන්නයේම ඉදිකිරීමට නියමිත මෙගාවොට් 350ක සොබාදනවි බලාගාරය සඳහාද ද්‍රවිකෘත ස්වභාවික ගෑස් සැපයීම නිව් ෆෝට්රස් සමාගමට ලබාදීම සහතික කිරීම භාණ්ඩාගාර ලේකම්වරයාට පවරා ඇති වගකීමක් බවය. එමෙන්ම එහි අවධාරණය කර ඇත්තේ නිව් ෆෝට්රස් සමාගම ස්වභාවික ගෑස් සපයන්නා වශයෙන් රැඳී සිටින වසර 5ක කාල සීමාව තුළ කෙරවළපිටිය ප්‍රදේශයේ තවත් ද්‍රවිකෘත ස්වභාවික වායු බලාගාරයක් ස්ථාපිත කළහොත් හෝ එම ප්‍රදේශයේ ඉදිවිය හැකි වෙනත් ඕනෑම බලාගාරයක් සඳහා ගෑස් සැපයීමේ පූර්ව අයිතිය නිව් ෆෝට්රස් සමාග මට ලැබෙන බවයි.

එසේම එම වසර 5ක ගිවිසුම් කාලය අවසන් වීමට පෙර එනම් වසර 4ක කාලය අවසන් වීමට පෙර ගෑස් සැපයීමේ ගිවිසුම අතිරේක කාලයක් සඳහා දීර්ඝ කිරීමේ විකල්පය ශ්‍රී ලංකා රජය වෙත හිමිවන බවයි.

නිව් ෆෝට්රස් සමාගම සපයනු ලබන ද්‍රවිකෘත ස්වභාවික ගෑස් සඳහා මිල නියම කිරීම සඳහා සූත්‍ර දෙකක්ද එහි සඳහන් කර ඇති අතර ඉන් එක් සූත්‍රයක් තෝරා ගැනීමේ අවස්ථාව ශ්‍රී ලංකා රජයට හෝ මෙහෙයුම්කරුට ලබාදී ඇත.

රාමුගත ගිවිසුමේ සඳහන් පරිදි පර්යන්ත ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමේ මුළු පිරිවැය නිව් ෆෝට්රස් සමාගම දරනු ඇති අතර එයට ගෑස් නැවත වායු බවට පරිවර්තනය කිරීම් සහිත පාවෙන ගබඩා ඒකකය, නැව් නවැත්වීමේ පද්ධතිය, සැපයුම් නල මාර්ග සහ ඒ ආශ්‍රිත පහසුකම් හා යටිතල පහසුකම් ඇතුලත් වේ.

තවදුරටත් වසර 5ක කාල සීමාවක් සඳහා ලබාගත යුතු ගෑස් ප්‍රමාණයද, එම ගෑස් සඳහා ගෙවිය යුතු මිලද එහි සඳහන් කර ඇත.

එම කැබිනට් පත්‍රිකාවෙන් අනුමැතිය ඉල්ලා ඇත්තේ, සියයට 40ක කොටස් විකිණීමේ ගිවිසුමට එළැඹීමට භාණ්ඩගාර ලේකම්වරයාට බලය පැවරීමට, (එම ගිවිසුම අත්සක් කිරීමෙන් පසු කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන බව සඳහන්කර ඇත) රාමුගත ගිවිසුම සංශෝධනය කිරීමට භාණ්ඩාගාර ලේකම්ට බලය පැවරීම, කොටස් විකිණීමේ ගිවිසුමේ කොටසක් ලෙස හෝ ස්වාධීන ලේඛනයක් ලෙස ද්‍රවිකෘත ස්වභාවික ගෑස් සැපයුම් කොන්දේසි පත්‍රයකට එළැඹීමට, පර්යන්ත ව්‍යාපෘතිය වෙත බදු සහන ලබාදීමට පහසුකම් සපයන ලෙස අදාළ අමාත්‍යවරුන්ට හා අමාත්‍යාංශ හා ආයතනවලට උපදෙස් ලබාදීමටය.

බැසිල් රාජපක්ෂගේ කැබිනට් පත්‍රිකාවෙන් දින කිහිපයකට පසු එනම් 2021 සැප්තැම්බර් 17 වැනිදා රාත්‍රියේ අපූරු දෙයක් සිදුවෙයි. එදින මධ්‍යම රාත්‍රී 12 පසුවී ඊට පසුදාට එළඹෙන අවස්ථාවේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විකුණුම්කරු සහ එන්එෆ්ඊ ශ්‍රී ලංකා පවර් හෝල්ඩිංග්ස් එල්එල්සී ගැනුම්කරුවා ලෙස සඳහන් ගිවිසුමක් අත්සන් කිරීමය. එම ගිවිසුම හඳුන්වා තිබුණේ වෙස්ට් කෝස්ට් පවර් ප්‍රයිවට් ලිමිටඩ්හි (කෙරවළපිටිය යුග දනවි ලබාගාරය) සියයට 40ක කොටස් අයිතිය

විකිණීමේ හා මිලදී ගැනීමේ ගිවිසුම වශයෙන්ය.

ඉතාමත් රහසිගතව හොර රහසේ මධ්‍යම රාත්‍රිය පසුවී එළිවන යාමයේ අත්සන් කරන ලද මෙම ගිවිසුමට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ, එක්සත් ජාතික පක්ෂය, සමගි ජන බලවේගය, කාදිනල් මැල්කම් රංජිත් හිමි, ඇල්ලේ ගුණවංශ හිමි හා සමාජ ක්‍රියාකාරීන් කිහිප දෙනෙකු මූලික අයිතිවාසිකම් පෙත්සම් ඉදිරිපත් කළ අතර එහි අතරමැදි පෙත්සම්කරුවන් ලෙස කැබිනට් මණ්ඩල සාමාජිකයින් ලෙස කටයුතු කළ වාසුදේව නානායක්කාර, විමල් වීරවංශ හා උදය ගම්මන්පිල ඉදිරිපත් වෙමින් ප්‍රකාශ කළේ ඉහත සඳහන් බැසිල් රාජපක්ෂගේ කැබිනට් මණ්ඩල පත්‍රිකාව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් වූ එකක් නොවන බවයි.

අත්සන් කරන ලද එම ගිවිසුම අනුව වෙස්ට් කෝස්ට් සමාගමේ සියයට 40ක කොටස් විකිණීමේ ගනුදෙනුවේ අගය ඇමරිකානු ඩොලර් මිලියන 250කි. එම ගිවිසුමේ සඳහන් වන්නේ මෙම ඇමරිකානු ඩොලර් මිලියන 250න් පළමු වාරිකය වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 187.5ක මුදලක් ගෙවන බවයි. දෙවන වාරිකය වශයෙන් ඉතිරි ඇමරිකානු ඩොලර් මිලියන 62.5ක මුදල ගෙවන බවයි. එසේ කොටස් විකිණීමේ ගනුදෙනුවේ එම වාරික ගෙවීම සඳහා අදාළ වන කොන්දේසි එම ගිවිසුම තුළ පළමු අදියරේ කොන්දේසි හා දෙවන අදියරේ කොන්දේසි වශයෙන් සඳහන් කර ඇත. එම පළමු අදියරේ කොන්දේසි අතර එකක් වන්නේ ශ්‍රී ලංකා රජය එල්එන්ජී සමාගමක් හෙවත් බලාගාරවලට ගෑස් සැපයීමේ සමාගමක් පිහිටුවිය යුතු අතර එම ශ්‍රී ලංකා රජයේ ගෑස් සමාගම නිව් ෆෝට්රස් සමාගමෙන් ගෑස් ලබාගත යුතු බවයි. එහි තවත් කොන්දේසියක් වන්නේ මිලදී ගන්නා වන එන්එෆ්ඊ ශ්‍රී ලංකා පවර් හෝල්ඩිංග ්ස් එල්එල්සී සමාගමට හෝ අනුබද්ධ සමාගම්වලට ගෑස් ආනයනයට, ගබඩා කිරීමට, සැපයීමට හා විකිණීමට අවසර ලැබෙන බව හා රජයේ එල්එන්ජී සමාගමට පර්යන්තයේ උපරිම ධාරිතාවෙන් ගෑස් සැපයෙන බවයි. අතිරික්ත ගෑස් ප්‍රතිඅපනයනය කරන බවයි. එමෙන්ම ගෑස් පර්යන්ත ව්‍යාපෘතියට ශ්‍රී ලංකාවේ උපායමාර්ගික සංවර්ධන පනත යටතේ සියලු බදු සහන ලබාදිය යුතු බවද එහි සඳහන් වේ.

එහි දෙවන අදියරේ කොන්දේසිවල දැක්වෙන්නේ රජයේ එල්එන්ජී ගෑස් සමාගම සමඟ සොබා දනව් බලාගාරය හා අනෙකුත් බලාගාර ගෑස් ලබාගැනීම සම්බන්ධයෙන් ගැනුම්කරු හෙවත් ඇමරිකානු සමාග මට එකඟවිය හැකි ගිවිසුම්වලට එළැඹිය යුතු බවයි. එමෙන්ම පාවෙන ගෑස් පරිවර්තන ඒකකයට ශ්‍රී ලංකා මුහුදු තීරයට පැමිණීමට හා නැංගුරම් ලෑමට අවසර දිය යුතු බවයි. ගෑස් පර්යන්තය ඉදිකිරීමට අවසර දීම, නල මාර්ගය මුහුදේ සහ ගොඩබිම එළීමට අවසර දීම ආදිය ඊට ඇතුලත් වේ.

ඒ අනුව ඇමරිකානු ආයෝජනයක් යැයි කියනු ලබන මෙම ගනුදෙනුව මගින් ශ්‍රී ලංකාවට මුදල් ලැබෙන්නේ වෙස්ට් කොස්ට් සමාගමේ සියයට 40ක කොටස් ලබාදීමෙන් පමණක් නොවේ. ඉහත සඳහන් කළ හා නොකළ පළමු අදියරේ හා දෙවන අදියරේ කොන්දේසි ඉටු කිරීම මගින්ය. නරකම නැත. ආයෝජනයක් නාමයෙන් ගන්නේ සමාගමක කොටස් අයිතියයි. එහෙත් කොන්දේසි වන්නේ එම සමාගමට සෘජු සම්බන්ධයක් නැති ශ්‍රී ලංකා ආණ්ඩුව ඉටුකළ යුතු වෙනත් ඉල්ලීම්ය. එම ඉල්ලීම්ද නිකම්ම නිකම් ඉල්ලීම් නොවේ. ශ්‍රී ලංකාවේ විදුලි බලාගාරවලට ගෑස් සැපයීම පිළිබඳ ඒකාධිකාරිත්වයක් ලබාගන්නා ඉල්ලීම්ය. එම ගිවිසුමට අනුව දැනට ක්‍රියාත්මක වන කෙරවළපිටිය යුගදනව් බලාගාරය, එහිම දිගුවක් ලෙස ඉදිකිරීමට නියමිත සොභාදනව් බලාගාරය, ශ්‍රී ලංකා, ඉන්දීය හා ජපාන ඒකතාබද්ධතාවයෙන් කෙරවළපිටිය ප්‍රදේශයේම ඉදිකිරීමට අවබෝධතා ගිවිසුම් අත්සන් කර ඇති බලාගාරය, කැලණිතිස්ස සංකීර්ණයේ ඇති චක්‍රීය බලාගාරය හා සොජිට් බලාගාරය යන ඒවාට ඇමරිකානු නිව් ෆෝට්රස් සමාගමෙන් අනිවාර්යෙන්ම ගෑස් මිලදී ගැනීමට සිදුවනු ඇත.

එහි තේරුම වන්නේ ශ්‍රී ලංකාවේ අනාගත ගෑස් මගින් ධාවනය කිරීමට නියමිත විදුලි බලාගාරවලට ගෑස් සැපයීමේ ඒකාධිකාරය විනිවිදභාවයෙන් තොර ගනුදෙනුවක් මගින් ඇමරිකානු සමාගමක් සතුකරගෙන ඇති බවයි. මේ ගැන අවධානය යොමු කිරීමේදී පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ විදුලි බල ක්ෂේත්‍රයේ චීන හා ඉන්දියානු ආයෝජන සඳහා ඉදිරිපත් වූ ස්වෙච්ඡා යෝජනාවලටත් වඩා සටකපට ආකාරයට රාජ්‍ය තාන්ත්‍රික මැදිහත්වීමක් මගින් මෙම ගනුදෙනුව සිදුවී ඇති බවයි. එමෙන්ම අභියෝගයට ලක්කිරීම සඳහා ජාත්‍යන්තර යෝජනා කැඳවා තිබූ ව්‍යාපෘතියක් ඒ සඳහා කිසිඳු යෝජනාවක් ඉදිරිපත් නොකර ඇමරිකානු සමාග මක් ලබාගෙන ඇති බවයි.

මේ අනුව අවසානයේ සිදුවී ඇත්තේ කෙරවළපිටිය හා ඒ අවට ප්‍රදේශයේ අනාගතයේ ගෑස් මගින් ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා, චීන, ඉන්දීය හෝ වෙනත් ඕනෑම රටක බලාගාරයක් ඉදි වුවහොත් ඔවුන්ට ඇමරිකානු සමාගමේ බලාධිකාරිය යටතේ කටයුතු කරන්නට සිදුවන බවයි.

# සැහැල්ලු දුම්රිය අහෝසි කළේ කාගේ වුවමනාවටද?

බිඳුන් මේනක හමගේ

ඩොලර් බිලියන 1.5ක ජපාන සහනදායී ණය ක්‍රමයකින් නිමකිරීමට කොළඹ සිට මාළඹේ දක්වා වූ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියක් සැලසුම් කෙරුණේ 2016 ජුනි මාසයේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අනුවය. එහෙත් ආණ්ඩු මාරුවෙන් පසුව බලයට පැමිණි ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව එම ව්‍යාපෘතිය ඒකපාර්ශ්විකව අවසන් කිරීමට තීරණය කළේය. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියට එල්ල වූ චෝදනාව වූයේ එය මිල අධික හා පිරිවැය ඵලදායී නොවන ව්‍යාපෘතියක් යන්නය. ඒ වනවිටත් එහි ප්‍රධාන උපදේශන කාර්යන් ඔරියන්ටල් කන්සල්ටන්ට් ග්ලෝබල් කම්පැනි ලිමිටඩ් නමැති ජපන් ආයතනය විසින් කරනු ලැබෙමින් පැවැතිණි. ශ්‍රී ලංකා රජයේ මේ හදිසි ඒකපාර්ශ්වික තීරණය ගැන ජපානය මවිතය පළ කළේය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ නියෝගය අනුව හිටපු ජනාධිපති ලේකම් පී.බී ජයසුන්දර මහතා ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් එන්. බී. මොන්ටි රණතුංග මහතාට ඒ බව ලිඛිතව දන්වා තිබුණි. එහි සඳහන් වූයේ මෙම ව්‍යාපෘතිය අවසන් කර වහාම ක්‍රියාත්මක වන පරිදි ව්‍යාපෘති කාර්යාලය වසා දමන ලෙසයි. එහෙත් ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රතිචාරය වූයේ කැබිනට් තීන්දුවක් අනුව ආරම්භ කළ ව්‍යාපෘතියක් නතර කිරීමට තමාට බලයක් නැති බවය. ප්‍රවාහන අමාත්‍යාංශයට මෙම විෂය මැතකදී පැවරු නමුත් ඒ සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකාව මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු බව රණතුංග මහතාගේ අදහස විය. 2020 සැප්තැම්බර් 28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ව්‍යාපෘතිය නතර කෙරුණේ ඉන්පසුවය.

අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දෙන මාධ්‍ය හමුවේදී මේ බව පැවැසූ එවක හිටපු ජනමාධ්‍ය ඇමැති කෙහෙළිය රඹුක්වැල්ල මාධ්‍යවේදීන්ට වැඩිදුරටත් පැවසුවේ සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතියට විකල්පයක් සොයාබැලීමට රජය තීරණය කර ඇති බවය. රජය මෙසේ විකල්පයක් තෝරන බව කීවද ඒ වනවිටත් ව්‍යාපෘතියේ මූලික ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ අතර ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කරගැනීම ද අවසන් වී තිබිණ. ජයිකා ආයතනය විසින් නිකුත් කරන ලද නිවේදනයක සඳහන් වූ ආකාරයට එහි පළමු අදියරට මුදල් යෙදවීම සඳහා යෙන් බිලියන 30 ක (ඩොලර් මිලියන 285 ක) ණය ගිවිසුමට ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (ජයිකා) හා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් අත්සන් තබා තිබුණේ 2019 වසරේ මාර්තුවේය. මේ නිසා ගෝඨාභය රාජපක්ෂ ජනපතිගේ තීන්දුව ගැන ජපාන රජය දැනුවත් කිරීම ද සංකීර්ණ කටයුත්තක් විය. එවකට ප්‍රවාහන ඇමැතිවරයාව සිටි ගාමිණී ලොකුගේ 2020 සැප්තැම්බර් 8 වැනිදා ජපාන තානාපති අකිරා සුගියාමාට මේ ගැන කිසියම් සංඥාවක් කිරීමට උත්සාහ කිරීම ඊට නිදසුනකි.

## ව්‍යාපෘතිය ආරම්භයට වූ තාන්ත්‍රිකභාවය

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අහෝසි කිරීමේ තීන්දුව කඩිනමින් ඒකපාර්ශ්විකව ගෙන තිබුණ ද එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකා ජපාන රාජ්‍යතාන්ත්‍රික ගනුදෙනු බලපෑ බවට සාක්ෂි කීපයක්ම වේ. සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතිය සඳහා ලංකා රජය ජපානයෙන් මූල්‍යාධාර නිල වශයෙන් ඉල්ලාතිබුණේ 2016 පෙබරවාරි 5 පැවැති ශ්‍රී ලංකා ජපන් ආර්ථික සහයෝගිතා ප්‍රතිපත්ති සාකච්ඡාවෙන් පසුය. එවක අගමැති රනිල් වික්‍රමසිංහ මහතා 2015 දී කළ ජපන් සංචාරයේදී බස්නාහිර පළාතේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ආයෝජනය සඳහා මුදල් යෙදවීමේ හැකියාව සම්බන්ධයෙන් ජපාන රජය සමග සාකච්ඡා කර තිබූ

බව 2016 ජුනි 16 දාතමයෙන් යුතු කැබිනට් සංදේශයක සඳහන් වේ. ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතන (ජයිකා) මූල්‍යාධාර යටතේ නිල සංවර්ධන ආධාර හරහා ව්‍යාපෘතිය ඉදිරියට ගෙනයාමටත් ඊට නීතිමය වශයෙන් ස්ථාවර ආයතනයක් හඳුනාගැනීමටත් ලංකා රජයේ ඇමැති මණ්ඩල අනුමැතිය ඉල්ලීම ඉන්පසුව සිදුව තිබේ. කොළඹ කොටුව සිට මාලබේ දක්වා ප්‍රවේශයට ප්‍රමුඛතාවය දීමට පදනම් කරගෙන තිබුණේ 2014 හා 2016දී ජයිකා මූල්‍යාධාර යටතේ කළ සමීක්ෂණක ප්‍රතිඵලයි. තනි පීල්ලක ගමන් කරන මොනෝ රේල් දුම්රිය හා සැහැල්ලු දුම්රිය යන දුම්රිය දෙක සසඳා සැහැල්ලු දුම්රිය උචිත බව තීරණය කර තිබුණි. එවකට අග්‍රාමාත්‍ය ලේකම් ඊ.එම්.එස්.බී ඒකනායක විසින් 2016 පෙබරවාරි 18 දාතමයෙන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාට යොමුකරන ලද ලිපියෙන් මේ කරුණු තහවුරුවේ.

අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ ලිපියට අවධානය යොමුකරමින් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙනුවට අධ්‍යක්ෂ(සැලසුම්) ආචාර්ය එම්.එම්.එස්.එස්.බී යාලේගම 2016 පෙබරවාරි 19 දාතමයෙන් ලිපියක් යොමුකරන්නේ ඉන්පසුවය. ව්‍යාපෘතිය සඳහා සහනදායී කොන්දේසි යටතේ ණය ලබාගැනීමට ජපන් තානාපති කාර්යාලයෙන් ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය ඉල්ලීමක් කළේ ඒ අනුවය. කෙසේ වෙතත් මීට අදාළ ලේඛන පිරික්සද්දී සැහැල්ලු දුම්රිය වෙනුවට තනි පීල්ලේ මොනෝ රේල් දුම්රිය ලංකාවට වඩා හිතකර බවට ජපාන නියෝජිතත්වයෙන් ලංකාවට යෝජනා වූ අවස්ථා ද දකින්නට ඇත. 2016 ජුනි 29 හා ජූලි 27 ආර්ථික කළමනාකරණ කමිටු වාර්තාවල මෙම කරුණු සඳහන් වේ. ජපානයේ ආර්ථික, වෙළෙඳ හා කර්මාන්ත අමාත්‍යාශයේ නියෝජිතයකු ලංකාවේ නාගරික ප්‍රවාහන පද්ධතිය දියුණු කිරීමට ණය ලබාදීමට කැමැත්ත පළ කර ඇතැයි ද එහිදී ජපානය කළ ශක්‍යතා අධ්‍යයනයක් අනුව ලංකාවට වඩා ගැලපෙන්නේ තනි පීල්ල දුම්රිය යැයි එම නියෝජිතයා කරන යෝජනාව ගැන ඒවායේ සඳහන් වේ. 2016 අගෝස්තු 3 වැනි දින අමාත්‍ය මණ්ඩල සටහනක් මගින් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතියට අදාළ ඉදිරි පියවර තීරණය කරන්නේ ඉන්පසුය. ඒ අනුව ව්‍යාපෘතියට මූලිකත්වය ගන්නා රාජ්‍ය නියෝජිතයා වන්නේ මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයයි.

## විගණකාධිපතිවරයාගෙන් විශේෂ වාර්තාවක්

මීට අදාළව විගණකාධිපතිවරයා 2022 නොවැම්බර් 23 නිකුත් කළ නිරීක්ෂණ 24කින් හා නිර්දේශ 9කින් සමන්විත විශේෂ විගණන වාර්තාව මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය අනුගමනය කළ අදූරදර්ශී පිළිවෙත මනාව තහවුරු කරන්නකි. එම විගණන වාර්තාව සකසද්දී සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ඵලදායී නොවන ව්‍යාපෘතියක් ලෙස සලකා අවලංගු කිරීම කුමන පදනමකින් සිදුකළේද යන්න තහවුරු වන ලේඛන විගණනයට ඉදිරිපත් නොවී යැයි විගණකාධිපතිවරයා කියයි. ව්‍යාපෘතිය අවසන් කිරීම ගැන එවක මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්.ආර් ආටිගල මහතා බීබීසී සිංහල සේවයට ප්‍රකාශයක් දී තිබුණි. මෙම ව්‍යාපෘතිය තුළින් රටේ විදේශ විනිමය නිරාවරණය වීමක් සිදුවන බැවින් එය රජය මගින් ක්‍රියාත්මක නොකිරීමට තීරණය කර ඇති බවත් පෞද්ගලික පාර්ශ්වයක් එය ක්‍රියාත්මක කරන්නේ නම් ඊට විරුද්ධ නොවන බවත් ඔහු පවසා තිබේ. මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා මෙම ප්‍රකාශ මාධ්‍යට කළේ මහ බැංකුව හෝ වෙනත් රාජ්‍ය සංස්ථාවක වගකිව යුතු නිරීක්ෂණ අනුව නම් ඒවා ලිඛිතව සඳහන් විය යුතුමය. එහෙත් එකී වාචික ප්‍රකාශවලින් කෙරෙන අවධාරණයන් තහවුරු කිරීමට විගණකාධිපතිවරයාට සාක්ෂිමය ලේඛන කිසිවක් ඉදිරිපත්ව තිබුණේ නැත.

එසේම කොවිඩ් 19 වසංගත තත්ත්ව මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බැවින් ගිවිසුම අවසන් කරන බව ජපන් රජය වෙත දන්වා තිබූ නමුත් එය රාජ්‍යන් අතර ගනුදෙනුවලදී පැවැතිය යුතු අන්‍යෝන්‍ය විශ්වාසය හා අවංකභාවය පලුදුවීමට හේතු විය හැකි බව නිරීක්ෂණය වී යැයි ද මෙම ණය ව්‍යාපෘතිය හෝ ණය ගිවිසුම අවසන් කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතන අතර හෝ නිවැරැදි අවබෝධයක් හා එකඟතාවයක් නොමැති බව නිරීක්ෂණය වී යැයි ද විගණන වාර්තාවේ සඳහන් වේ. ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමක් හෝ ඊට මේ වනවිටත් (2022 නොවැම්බර් වනවිට) වැය කර ඇති රුපියල් මිලියන 5977ක වියදම්වලින් අත්පත් කරගෙන ඇති ප්‍රතිඵලද උපයෝගී කරගෙන මෙම ව්‍යාපෘතිය හෝ විකල්ප ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට කටයුතු නොකරන්නේ නම් මෙම වියදම ශ්‍රී ලංකා රජය සිදුකළ අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය වන බව ද විගණකාධිපති වාර්තාව සිය නිරීක්ෂණ හැටියට දක්වා ඇත. තවද ඔරියන්ටල් කන්සල්ටන්ට් ග්ලෝබල් කම්පැනි ලිමිටඩ් වන ප්‍රධාන උපදේශක සමාගම විසින් ඉල්ලුම් කරන ලද ලාභ අහිමි වීමේ වන්දිය රුපියල් මිලියන 5169ක හිමිකම් මුදල හෝ එම ඉල්ලීම වෙනුවෙන් ගෙවන ලද මුදල මෙන්ම ඉදිරියේදී ගෙවීමට සිදුවියහැකි වන්දි, ප්‍රමාද පොළී හෝ වෙනයම් ඕනෑම ගෙවීමක් ශ්‍රී ලංකා රජයට නියත ලෙසම සිදුවන අනාර්ථික වියදමක් යැයි විගණකාධිපතිවරයා අවධාරණය කර ඇත.

## විශේෂඥ මත නොතකා හළ සමයක්

ගෝඨාභය රාජපක්ෂ පාලන සමය ආරම්භයට වියතුන්ගේ මතවාද පාර කැපුව ද පාලන කාලයේදී ඔහුට එල්ල වූ ප්‍රධාන චෝදනාවක් වූයේ ප්‍රතිපත්තිමය තීන්දු ගැනීමේදී දක්වන පාර්ශ්විකභාවයයි. මෙම පාර්ශ්විකභාවයන් විසින් විද්‍යාත්මක පදනමින් තොර ප්‍රතිපත්තිමය තීන්දුවලට පාර කපනු ලැබූ අතර කාබනික කෘෂිකර්මය සම්බන්ධයෙන් වූ වැරැදි එළඹුම ඊට හොඳම නිදසුන විය. ජපන් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ද එවැනිම තත්ත්වයක්

ඊට අදාළ සාහිත්‍ය විමර්ශනයේදී දැකගත හැකිය. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ආපසුහැරවීමේ තීරණය ගැන දෙවරක් සිතන්නැයි ආර්ථික විද්‍යාඥයන් එවක රජයට අවධාරණය නොකළා නොවේ. කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ප්‍රියංග දුනුසිංහ යනු මෙම ව්‍යාපෘතිය ආපසු හැරවීමේ ආර්ථික මෙන්ම තාන්ත්‍රිකමය අනර්ථකාරීත්වය ගැන එසේ කල්තියා අනතුරු ඇඟවූවෙකි. එහෙත් එවක පැවැති රජය මහාචාර්යවරයා අතුළුව ඒ සම්බන්ධයෙන් විචාරාත්මකව අදහස් දැක් වූ ප්‍රවීණයන්ගේ අදහස් විමර්ශනයට භාජනය කළේ නැත.

> *''මම මේ සම්බන්ධයෙන් රජයේ අවධානය යොමුකරන්නැයි එම තීරණය ගනිමින් සිටින අවස්ථාවේදීම කිව්වා. සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය අහෝසි කිරීම දේශපාලනික අරමුණු පදනම් කරගත් වැරැදි තීන්දුවක්. ඊළඟ සියවස සඳහා රට සූදානම් කරන නවීකාරක ව්‍යාපෘතියක් හැටියට හඳුන්වන්න පුළුවන් වැඩක් ඒක. එවැනි ව්‍යාපෘතියක් තනි මතයට අහෝසි කිරීමේ ආර්ථික හා දේශපාලනික ප්‍රතිවිපාකවලට ලංකාව ඉදිරියේදී ගොදුරු වෙන්න පුළුවන් බව මම කිව්වා. නමුත් මගේ මතදැක්වීමෙන් පසුව වුණේ රජයට සම්බන්ධ ඇතැම් මතවාදී ප්‍රාමාණිකයන් මට එරෙහිව අවි අමෝරාගැනීම. පැවැති ආණ්ඩුව සමයේ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය අහෝසි කිරීමට ආණ්ඩුව දක්වන තර්ක පදනම් විරහිත බව ඒ අවස්ථාවේම පෙනුණා. දේශපාලන පදනමින් විදේශ ව්‍යාපෘති බැහැර කිරීම ප්‍රතිපත්තිය කරගත්තොත් ආධාර දෙන රටවල් ඉදිරියේදී ලංකාව බැහැර කරාවි කියල මම පෙන්වාදුන්නා. එහෙත් ඔවුන් ඊට සවන්දුන්නේ නෑ. ජපානය කියන්නේ ලංකාවට වැඩිම මූලාධාර ප්‍රමාණයක් දුන් රටක්. අඩු පොලී අනුපාත යටතේ දීර්ඝකාලීනව සහනදායී පදනමින් ණය ලබාදුන් ලංකාවේ හිතවතෙක්. එවැනි රාජ්‍යක් සම්බන්ධයෙන් මේ ව්‍යාපෘතියට අදාළව ලංකාව ගත් තීන්දුව ආර්ථික විද්‍යාත්මකව විතරක් නෙවෙයි දුර්වල තාන්ත්‍රිකභාවයටත් නිදසුනක්''*

මෙම ව්‍යාපෘතිය අහෝසි කිරීමට මුල් වූ බවට පසුකාලීනව චෝදනා එල්ල වූ එක් චරිතයක් වූයේ ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩු පාලන සමයේ ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට උපදෙස් දුන් කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතාය. ඊට හේතු වූයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ සමග පැවැති සාකච්ඡාවකදී කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතියේ කැළණිවැලි දුම්රිය මාර්ග නවීකරණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔහු පළ කළ විවේචනාත්මක අදහස් ඇතුළත් වීඩියෝවකි. සමාජ මාධ්‍යයේ ප්‍රචාරය වූ එම වීඩියෝව ප්‍රචාරය වන්නට වූයේ සැහැල්ලු දුම්රියට එරෙහිව ඔහු අදහස් පළ කළ බවට වැරැදි අර්ථකතනයක් සමගිනි. මේ නිසා තමා සහභාගී වූ සාකච්ඡාව කුමක්ද යන්නත් ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව යටතේ ප්‍රවාහන ක්ෂේත්‍රයට අදාළව තමාට පැවරුණු රාජකාරිය කුමක්ද යන්න ගැනත් පැහැදිලි කිරීමට මහාචාර්යවරයා කටයුතු කළේය. මහාචාර්යවරයාගේ මේ මැදිහත්වීම විසින් නිරාවරණය කරනු ලැබුවේ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අවසානාත්මක තීන්දුවක් ගැනීම කෙතරම් සැහැල්ලුවෙන් වීද යන්නයි.

## රාජ්‍ය ආයෝජන සමාලෝචන කමිටුව

2020 ඔක්තෝබර් 21 වැනිදා හිරු නාළිකාවට සම්මුඛ සාකච්ඡාවක් දෙමින් මහාචාර්ය ගුණරුවන් පැවසුවේ රජයේ ප්‍රාග්ධන ව්‍යාපෘති ගැන යළි සමාලෝචනයක් කිරීම සඳහා තමා ඇතුළු ත්‍රිපුද්ගල කමිටුවකට පැවරුණු බවයි. එම ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට කැළණිවැලි දුම්රිය මාර්ග නවීකරණ ව්‍යාපෘතිය අයත් වූ නමුත් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ඇතුළත් නොවී යැයි ද ඔහු එහිදී කීවේය. කෙසේ වෙතත් මෙහිදී මහාචාර්ය ගුණරුවන්ගේ විත්තිවාචකයෙන් මතුවන වැදගත් කරුණක් තිබේ. එය නම් ගෝඨාභය රාජපක්ෂ පාලනය යටතේ මහා පරිමාණ ව්‍යාපෘති අධ්‍යයනය ගුණරුවන් කමිටුවට පැවරුණේ නම් ඊට සැහැල්ලු දුම්රිය අයත් නොවුණේ මන්ද යන්නයි. මේ සම්බන්ධයෙන් මහාචාර්ය ගුණරුවන්ගෙන් එක් මාධ්‍යවේදියකු විමසූ විට ඔහු ඊට පිළිතුරු ලෙස පැවසුවේ මෙවැන්නකි. ''රටේ ඉන්න සියලුම ලෙඩ්ඩු නෙවෙයිනේ දොස්තර මහත්තයා ලගට ගෙනියන්නේ. සමහර ලෙඩ්ඩුන්ට ගොඩබේත් දෙනවා. සමහරු රෝහලට ගෙනියනවා. සමහරු මැරෙන්න අරිනවා'' යනුවෙනි. එහෙත් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ද්විපාර්ශ්වීය මූල්‍ය) සම්පත් මන්ත්‍රීනායක මහතා 2022 ඔක්තෝබර් 12 දාතමයෙන් ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපතිවරයාට යොමුකළ ලිපියක මීට පැහැදිලි පිළිතුර සඳහන් වේ. ඊට අනුව ගුණරුවන් කමිටුවේ අවසන් වාර්තාවක් සිය දෙපාර්තමේන්තුවට ලැබී නැතැයි පවසන මන්ත්‍රීනායක මහතා නාගරික ප්‍රවාහනයට අදාළ ව්‍යාපෘති අධීක්ෂණය මෙම කමිටුව මගින් සිදුකරන අවස්ථාව වන විට එවක ජනාධිපතිවරයා විසින් සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය අවලංගු කිරීම සම්බන්ධයෙන් තීරණය කර තිබූ බව කියයි. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අකුලාදැමුණු සමයේ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය වාර්තා සැලකිය යුතු මට්ටමින් පරිශීලනය කළ ද ඒ කිසිදු තැනකදී සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අතරමැද එකඟතාවයකට පැමිණීමට රජයක් හැටියට

දැරූ සාධාරණ උත්සාහයන් ගැන සඳහන් වූයේ නැත. ඒ අනුව සැහැල්ලු දුම්රිය ඒකපාර්ශ්විකව නතර කිරීම විද්‍යාත්මක පදනමකින් ගත් තීන්දුවක් නොවන බව පැහැදිලිය.

කෙසේ වෙතත් 2022 ජුනි 9 වැනිදා රැස් වූ රජයේ ගිණුම් කාරක සභාවේදී මෙම තීන්දුව ගැන පාර්ලිමේන්තුව හැටියට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න කර තිබේ. තීන්දුව ප්‍රශ්නසහගත අවස්ථාවේදී රජයේ නිලධාරින් ඒ ගැන සිය මතය ප්‍රකාශ නොකළේ මන්දැයි කාරක සභාව ප්‍රශ්න කර ඇති අතර එහිදී නිලධාරින්ගේ පිළිතුර වී තිබුණේ "අතිගරු ජනාධිපතිතුමා ලබාදුන් නියෝග යකට හා අමාත්‍ය මණ්ඩල තීරණයකට විරුද්ධවීමට රාජ්‍ය නිලධාරින් වන තමන්ට හැකියාවක් නැහැ" යනුවෙනි. විධායකයේ නියෝගයන් ඒ ආකාරයෙන්ම පිළිපැදීම වෙනුවට වඩාත් නිවැරදි නිර්දේශ හා මගපෙන්වීම් ලබාදීමට හැකි නිලධාරින්ගෙන් සමන්විත රාජ්‍ය යාන්ත්‍රණ පද්ධතියක අවශ්‍යතාව පිළිබඳව කාරක සභාව එහිදී අවධාරණය කර ඇත. එසේම අප රට ණය ගිවිසුම්වලට එළඹ ක්‍රියාත්මක කරන්නේ ජාතික භෞතික සැලැස්මට අනුකූල රටට අත්‍යවශ්‍ය ව්‍යාපෘතිම ද යන්න පිළිබඳව විමසා බැලිය යුතු බව ද කාරක සභාව සිය මතය හැටියට දක්වා තිබේ. එහිදී විදේශ සම්පත් දෙපාර්තමේන්තු නිලධාරින් අවධාරණය කර තිබුණේ ලංකාවට වසර 10ක පමණ කාලයක් සඳහා නිශ්චිතව හඳුනාගත් සංවර්ධන සැලැස්මක් නොමැතිවීම විශාල පාඩුවක් බවයි. එමෙන්ම ආසියානු සංවර්ධන බැංකුව හා ලෝක බැංකුව වැනි ආයතන හා එක්ව එවැනි නිශ්චිත සැලැස්මක් සකසා එය පාර්ලිමේන්තුවෙන් සම්මත කර ක්‍රියාවට නැගිය හැකි නම් ව්‍යාපෘති සම්බන්ධයෙන් මතු වන ගැටලුවට විසඳුමක් වනු ඇතැයි විදේශ සම්පත් දෙපාර්තමේන්තුව යෝජනා කර තිබුණි. රාජ්‍ය ගිණුම් කාරක සභාව එම යෝජනාව අනුමත කර තිබුණේ හැකි උපරිමයෙන් ඊට සහාය දෙන බව කියමිනි.

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නැවත කොළ එළියක් දැල්වෙන බව පෙනුණේ එකී කාරක සභා රැස්වීමෙන් මාස කීපයක් යද්දී පසුගිය වසරේ දෙසැම්බරයේය. සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය යළිත් මෙරටට ලබාදීමට ජපාන රජය කැමැත්ත පළ කර ඇතැයි ද ශ්‍රී ලංකා රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ පවත්වන සාකච්ඡාවල එකඟතාවය ලද විගස නැවත එය ක්‍රියාත්මක කළ හැකි බව ජපන් තානාපති මිසුකොෂි හිදෙනකි මහතා දේශගුණික විපර්යාස පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක රුවන් විජයවර්ධන මහතා හමුවේ සඳහන් කර ඇතැයි ද මාධ්‍ය වාර්තා කර තිබුණි. මාධ්‍ය වාර්තාවලට අනුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එකඟතා ගිවිසුම අත්සන් කළ පසු යළිත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකි බවද ඔහු කියා තිබේ. ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ද සිය ජපන් සංචාරයේදී මේ කාරණය ගැන සාකච්ඡා කළ බවත් එහිදී ද ජපන් රජය මෙම ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමට කැමැත්ත පළ කළ බව රුවන් විජයවර්ධන මහතා කීවේ යැයි එම වාර්තා අතර විය. එහෙත් වාර්තා වන ආකාරයට ආයෝජනය සම්බන්ධයෙන් බිඳවැටුණු ජපන් විශ්වාසය යළි පිරියම් කිරීම පහසු නොවේ. එතැන් සිට තවත් මාස පහක පමණ කාලයක් යනතුරු එකී ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයෙන් කිසියම් සංඥාවක් නොවීමෙන්ම එය පැහැදිලිය. අවසන් වරට නැවතත් රජය ඒ ගැන කතා කළේ පසුගිය මැයි 30 වැනිදා ජනපතිගේ ජපාන සංචාරයෙන් පසුය. ඒ කැබිනට් තීරණ දැනුම් දෙන මාධ්‍ය හමුවේදීය.

එයින් කියවුණේ ද සැහැල්ලු දුම්රිය සංක්‍රමණ (එල්.ආර්.ටී.) ව්‍යාපෘතිය යළි ආරම්භ කිරීම සඳහා සාකච්ඡා ඇරැඹීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වූ බවය. මෙම කැබිනට් අනුමැතිය හිමිවූයේ ජනාධිපතිවරයා ජපානයේ සිදුකළ සංචාරයට පෙර යැයි කැබිනට් මාධ්‍ය ප්‍රකාශක අමාත්‍ය බන්දුල ගුණවර්ධන කැබිනට් තීන්දු දැනුම් දෙමින් පැවැසීය. ජපානය ලංකාවට ආධාර සපයන ප්‍රධාන රට බවට පත්වී තිබූ නමුත් මෑත ඉතිහාසය තුළදී ඇතැම් යෝජනා හා ආධාර ව්‍යාපෘති ක්ෂණිකව නතර කිරීම නිසා ජපන් රජයට ලංකාව සම්බන්ධයෙන් පැවැතියේ කනස්සලු හැඟීමක් යැයි අමාත්‍යවරයා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මෙවර ජපාන සංචාරයේ නිරත වූයේ එම තත්ත්වය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පසුතලය සකස් කරගෙන යැයි ද කීය. දෙරටක් අතර යම් ගිවිසුමක් අත්සන් කරන්නේ නම් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් යම් හෙයකින් එය නතර කරන්නේ නම් පාර්ලිමේන්තු අනුමැතියෙන් තොරව එය සිදු කිරීමට නොහැකි ලෙසත් විශ්වසනීයත්වය පිළිබඳ සහතිකයක් කැබිනට් මණ්ඩලයේදී ගනු ලැබූ බවද ඔහු සඳහන් කළේය. ආයෝජන සම්බන්ධයෙන් යළිත් ලංකාව පිළිබඳව අන්තර්ජාතික වශයෙන් විශ්වසනීයත්වයක් ඇති කිරීම සඳහා මෙම තීරණය ගනු ලැබී යැයිද ඔහු වැඩිදුරටත් පැවැසුවේය.

## තීරණය කාගේදැයි සෙවීමට නම්

සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වත්මන් ආණ්ඩුවේ මේ ප්‍රතිචාර ආණ්ඩුකරණයට අදාළව විමර්ශනය කරන්නෙකු වුව පැටලෙන්නේ පඹ ගාලකය. මන්දයත් මේ ආණ්ඩුවේ වත්මන් කැබිනට්ටුව නියෝජනය කරන බොහෝ දෙනෙක් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අහෝසි කෙරුණු 2020 සැප්තැම්බර් 28 වැනි දා ද කැබිනට්ටුවේ අසුන්ගෙන සිටි බැවිනි. ඊට එක් නිදසුනක් හැටියට නාගරික සංවර්ධන හා නිවාස ඇමැතිවරයා හැටියට ප්‍රසන්න රණතුංග මහතා මෙම ක්‍රියාවලියට අදාළව කරන මැදිහත්වීම දැක්විය හැකිය. රාජ්‍ය ප්‍රතිපත්තිමය තීන්දුව බූමරංගයක් වීමෙන් පසුව 2022 ජුනි 28 දාතමයෙන් අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා නිකුත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය එහිදී වැදගත්ය. එහි සඳහන් වන්නේ ව්‍යාපෘතියට අදාළ ජපාන උපදේශන සමාගම වූ ඕ.සී.ජී ජේ.වී සමාගම ව්‍යාපෘතිය

අත්හිටුවීම වෙනුවෙන් ඉල්ලන ඩොලර් මිලියන 31කට අධික හිමිකම්, ඊට අදාළව රජයෙන් පත්කළ සාකච්ඡා කමිටු යෝජනා හා ඒවාට සමාගම දක්වන ප්‍රතිචාරයයි.

එම සංදේශයේ යෝජනාවල පළමු යෝජනාව ලෙස සඳහන් වන්නේ සමාගම සිදුකළ කාර්යන් වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් 2 930 307.48ක් ගෙවීමයි. දෙවැනි යෝජනාව නම් වැට් බදු ප්‍රතිපූර්ණය කිරීම පමාවීම නිසා පමා වූ මුදලට අදාළ පොලී මුදල ලෙස ඉල්ලා ඇති රුපියල් 3 733 128.00ක මුදල ගෙවීමයි. ව්‍යාපෘතිය අත්හිටුවීමෙන් සමාගමේ කාර්ය මණ්ඩලයේ සේවය අවසන් කිරීම ඇතුළු පොදු කාර්ය පිරිවැය සඳහා වැය වූ වියදම් ලෙස ඉල්ලා තිබූ මුදලින් ඇමෙරිකානු ඩොලර් 492 749.54ක් ගෙවීම තෙවැනි යෝජනාවයි. ඉතාම උත්ප්‍රාසජනක යෝජනාව අවසානයේ සඳහන් වන්නේ මෙසේය. ' ඉහත යෝජනා යටතේ ඉදිරිපත් කර ඇති ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍ය වන මුදල් ශ්‍රී ලංකා රජය හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර ඇති කරගත් ගිවිසුම ප්‍රකාරව ලබා දී ඇති ණය මුදලින් ප්‍රතිපූර්ණය කිරීමට ඇති හැකියාව සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට නියෝග කිරීම' යනුවෙනි. නාගරික සංවර්ධන හා නිවාස ඇමැතිවරයා ලෙස ප්‍රසන්න රණතුංග මහතා ඉදිරිපත් කළ මේ සංදේශය අනුව ඉදිරි වැඩකටයුතු සිදුවන්නේ නම් ඇත්තටම සිදුවන්නේ සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය දියත් කිරීමට ජපානයෙන් ලැබුණු ණය ජපාන සමාග මට හිමිකම් සඳහා වැය කිරීමේ උත්ප්‍රාසජනක වැඩකි.

කෙසේ වෙතත් සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය ඉදිරියට තල්ලුවන්නේ නම් එය ලංකාව රජයක් හැටියට සිය සිරස බිමටම බර කරගන්නා පිළිවෙතකින් මිස ඉදිරියට යනු ඇතැයි සිතිය නොහැකිය. අවසානයේදී සිදුව තිබෙන්නේ 2025 දී අවසන් කරන්නට නියමිතව තිබී ආරම්භ නොකළ ව්‍යාපෘතියකට 2025 පටන් වන්දි ගෙවීම විය නොහැකිද? එහිදී ඉතාමත්ම වැදගත් කරුණ හැටියට අවධාරණය කළහැක්කේ මෙම කුප්‍රකට ව්‍යාපෘති හැරවුම ගැන විගණකාධිපතිවරයාගේ විශේෂ වාර්තාවේ අවසන් නිර්දේශයයි. එනම් විධිමත් අධ්‍යයනයකින් පසුව ගෙන ඇති පූර්ව තීරණ නැවත සංශෝධනයට හෝ අවලංගු කිරීමට කටයුතු කිරීමේදී පූර්ව තීරණ සඳහා වූ අධ්‍යයනවලට දායක වූ පාර්ශ්වයන්ගෙන් ඒ පිළිබඳව විමසා ලැබෙන තොරතුරු වෘත්තියමය ඇගයීමකට ලක්කළ යුතුය යන්නයි. ගරුගාම්භීර වචනවලින් ලේඛනගත වී තිබුණ ද මෙහි යට අවසන ඇත්තේ ඩොලර් මිලියන ගණනින් මහජන බදු මුදල් විනාශ කළ කතාවකි. එනයින් ගත්කළ අපරාධයකි. එනිසා සැබැවින්ම සැහැල්ලු දුම්රිය ව්‍යාපෘතිය අහෝසි කළේ කාගේ වුවමනාවටද යන්න අනාවරණය කරගැනීමට නම් ව්‍යාපෘතිය අහෝසි කරන අවස්ථාවේ කැබිනට් මණ්ඩලයේ සිටි සියලු දෙනාටම මෙම නිර්දේශය අදාළ කරගත යුතුය.

# ත්‍රිකුණාමල වරාය සහ තෙල් ටැංකි පර්යන්තය

හර්ෂන තුෂාර සිල්වා

දීර්ඝ ඉතිහාසයක් තිබෙන ත්‍රිකුණාමලය වරාය සහ තෙල් ටැංකි පර්යන්තය සම්බන්ධයෙන් පසුගිය දශකයක දෙකක කාලයේ දී නිරන්තරයෙන් සාකච්ඡා ඇති විය. ඒ සම්බන්ධයෙන් කලින් කලට මාධ්‍ය වාර්තා පළ වූ අතර පසුගිය දශක දෙකක කාලයේ දී පැවැති සෑම ආණ්ඩුවක් යටතේ ම ඒ සම්බන්ධයෙන් කතාබහ ඇති විය. ඒ ආකාරයෙන් ම පසුගිය ගෝඨාභය රාජපක්ෂ ආණ්ඩුව යටතේත් වත්මන් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව යටතේත් ඒ සම්බන්ධයෙන් කතාබහ ඇති විය.

ඉහළ පෙළේ ඉන්දීය දූත පිරිසක් ඉකුත් මාර්තු මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වූ අතර එහිදි ත්‍රිකුණාමල වරාය සහ තෙල් ටැංකි පර්යන්තය සම්බන්ධයෙන් සාකච්ඡාවට ලක්ව තිබිණි. මෙම දූත පිරිසේ සංචාරයට පෙර ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා මාර්තු මස මුලදී ලංකා අයි.ඕ.සී. තෙල් ටැංකි හා ගබඩා පර්යන්තයේ සංචාරයක නිරත වූ අතර ත්‍රිකුණාමලයේ තෙල් ටැංකි පද්ධතිය නැවත සක්‍රීය කර ජාතික ආර්ථිකයට එක් කිරීමේ කඩිනම් වැඩපිළිවෙළ ක්‍රියාවට නංවන්නැයි ද ජනාධිපතිවරයා එහිදි පවසා තිබිණි.

මෙවැනි පසුබිමක් තුළ අප්‍රේල් මස මුල් සතියේ දී ත්‍රිකුණාමලය වරාය සහ තෙල් ටැංකි සම්බන්ධයෙන් ඉරිදා පුවත්පත් වාර්තා කර තිබිණි. "ත්‍රිකුණාමලයේ තෙල් පිරිපහදුවකට ඉන්දියාවෙන් යෝජනාවක් යැයි" ලංකාදීප පුවත්පතත් "චීනය-ජපානය-ඉන්දියාව ලංකාවේ යෝධ පිරිපහදු 2ක් තනයි - හම්බන්තොට පිරිපහදුව චීනයට" යැයි ඉරිදා අරුණ පුවත්පතත් අප්‍රේල් 2 වැනිදා වාර්තා කර තිබිණි.

මේ කතාබහ ඇති වීමට පෙර ඉකුත් ජනවාරියේ දී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සම්බන්ධයෙන් ඉන්දියාව සමඟ ගිවිසුමකට පැමිණියේ යැයි එවකට බලශක්ති අමාත්‍යවරයා වශයෙන් කටයුතු කළ උදය ගම්මන්පිල මහතා පවසා තිබිණි. අමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට අනුමැතිය ලැබීමෙන් පසු ඔහු ඒ බව ප්‍රකාශ කර තිබිණි.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය සංවර්ධන ව්‍යාපෘතිය යනුවෙන් අමාත්‍යවරයා යෝජනාවක් ඉදිරිපත් කර තිබූ අතර ඊට අනුමැතිය ලැබී ඇතැයි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2022 ජනවාරි මස 04 වැනිදා නිකුත් කළ නිවේදනයේ දැක්විණි. ජනවාරි මස 3 වැනිදා පැවැති කැබිනට් මණ්ඩල හමුවේ දී උදය ගම්මන්පිල මහතාගේ යෝජනාවට අනුමැතිය ලැබී තිබිණි.

ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයට අදාළව දැනට ඉන්දීය රජය සමඟ පවතින ගිවිසුම් ත්‍රිත්වය රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා මගින් සමාලෝචනය කර ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට දෙරට විසින් එකඟතාවකට එළැඹ ඇති බව අදාළ නිවේදනයේ දැක්විණි. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ව්‍යාපාර කටයුතු සඳහා තෙල් ටැංකි 24ක් වෙන් කිරීමටත් ලංකා අයි.ඕ.සී. සමාගම දැනටමත් භාවිතයට ගනිමින් පවතින පහළ තෙල් ටැංකි සංකීර්ණයේ ටැංකි 14 එම සමාග මේ ව්‍යාපාර කටයුතු සඳහා වෙන් කිරීමටත්, ඉතිරි තෙල් ටැංකි 61 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට සියයට 51ක් සහ ලංකා අයි.ඕ.සී. සමාගමට සියයට 49ක් කොටස් අයිතිය හිමිවන පරිදි ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් (ප්‍රයිවට්) ලිමිටඩ් නමින් ස්ථාපිත කර තිබෙන සමාගම මඟින් සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමටත් බලශක්ති අමාත්‍යවරයා යෝජනාවක් ඉදිරිපත් කළේ යැයි ද ඊට අනුමැතිය ලැබුණේ යැයි ද එහි දැක්විණි.

එහෙත් ඊට පෙර ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර 2017 වසරේ දී ත්‍රිකුණාමලය තෙල් ටැංකි සම්බන්ධයෙන් අවබෝධතා ගිවිසුමකට අත්සන් තබා තිබිණි. ඒ අවස්ථාවේ දී ඊට විරෝධය පළ කරමින් ඛනිජ තෙල්

සංස්ථාවේ සේවකයෝ විරෝධතාවයක නිරත වූහ. ඉන්දියාව සමඟ අත්සන් කෙරෙන අවබෝධතා ගිවිසුම මගින් තෙල් මිල ගණන් තීරණය කිරීමේදී ඉන්දියාවට වැඩි බලයක් ලැබෙන්නේ යැයි ඔවුහු චෝදනා කළහ.

මෙම අවබෝධතා ගිවිසුම සම්බන්ධයෙන් මුලින්ම නිවේදනය කෙරුණේ 2015 වසරේ මාර්තු මාසයේදී ය. ත්‍රිකුණාමලයේ උපායමාර්ගික ඉන්ධන ගබඩා පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ඉන්දියන් ඔයිල් සමාගමේ, ශ්‍රී ලංකා සමාගම වන ලංකා අයි.ඕ.සී. සමඟ එකඟතාවයකට පැමිණ ඇතැයි ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත වෙමින් ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි නිවේදනය කළේ ය.

බටහිර ආසියාව හා සිංගප්පූරුව අතර ඇති විශාලතම තෙල් ගබඩා සංකීර්ණය මෙය යැයි ද පැවසේ. එමෙන්ම ගල්ෆ් කලාපීය තෙල් අපනයනකරුවන් සහ ආසියානු පරිභෝජකයන් අතර ශ්‍රී ලංකාව උපායමාර්ගිකව පිහිටා ඇත. බ්‍රිතාන්‍යයන් විසින් 1920 දශකයේ දී මෙහි ඉදි කිරීම් ආරම්භ කළ බවත් 1930 දශකය වනවිට මෙහි ඉදි කිරීම් අවසන් කළ බවත් පැවසේ. මෙහි ඇති උපායමාර්ගික වටිනාකම නිසා ම 1942 වසරේ අප්‍රේල් මස 9 වැනිදා ජපන් හමුදා ත්‍රිකුණාමල තෙල් ටැංකි ඉලක්ක කරගනිමින් ප්‍රහාරයක් එල්ල කළේ ය. එම ප්‍රහාරයෙන් එක් තෙල් ටැංකියක් විනාශ වූ බව පැවසේ.

2017 වසරේ අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුමට පෙර මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා එවකට අග්‍රාමාත්‍ය ධුරය හෙබ වූ වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා එම වසරේ අප්‍රේල් මාසයේ දී ඉන්දියාවේ සංචාරයක නිරත විය. අත්සන් කර තිබෙන ආර්ථික ව්‍යාපෘතිවල සම්බන්ධයෙන් සහයෝගීතාව වර්ධනය කරගැනීම සහ ආර්ථික ව්‍යාපෘති සම්බන්ධයෙන් නව සහයෝගීතා ඇති කරගැනීම සම්බන්ධයෙන් මෙම සංචාරයේ දී අවබෝධතා ගිවිසුමකට එළැඹිණි. රනිල් වික්‍රමසිංහ මහතාගේ සංචාරයෙන් පසු ඉන්දීය අග්‍රාමාත්‍යවරයා මැයි මාසයේ දී ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම සංචාර දෙකේ ප්‍රධාන කරුණක් වූයේ ත්‍රිකුණාමල වරාය සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම ය. උපායමාර්ගික තෙල් ටැංකි සංකීර්ණයක් සංවර්ධනය කිරීම සඳහා ඛනිජ තෙල් සංස්ථාවත් ලංකා අයි.ඕ.සී. සමාගමත් එකඟතාවයකට පැමිණීමත් ඒ සඳහා අවශ්‍ය ඉඩම්වලට බදු ගිවිසුම්වලට පැමිණීමත් එහි ප්‍රධාන කරුණක් විය.

ගෝලීය දේශපාලනයේ බල කේන්ද්‍රීය ගැටලු සහ භූ දේශපාලන මුල් කරගනිමින් ඉන්දියාව 1980 දශකයේ දී ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු කර තිබේ. විශේෂයෙන්ම ත්‍රිකුණාමල වරාය සහ අනෙකුත් වරාය මෙන්ම එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ බටහිර හිතවාදී ප්‍රතිපත්තියත් ඉන්දියාව සෝවියට් සමූහාණ්ඩුවට වඩාත් හිතවාදී වීමත් ඉන්දු-පාකිස්තාන අර්බුද සහ චීනය යන කරුණු මුල් කරගනිමින් මෙම කතාබහ සාකච්ඡා සිදුව තිබේ.

උපායමාර්ගිකව ඉතා වැදගත් වන ත්‍රිකුණාමලය වරාය සම්බන්ධයෙන් ඉන්දියාව 1985 වසරේ දී යෝජනාවක් ඉදිරිපත් කර ඇත. කෙසේ නමුත් ශ්‍රී ලංකාව ඊට යහපත් ප්‍රතිචාරයක් දක්වා නොමැත. මේ අතර එවකට පැවැති භූදේශපාලනික තත්ත්ව සහ ඉන්දියානු බලපෑම සහ මැදිහත් වීම නිසා ම හිටපු ජනාධිපති ජේ.ආර්.ජයවර්ධන මහතා, සිලෝනය හා බ්‍රිතාන්‍ය අතර පැවැති ආරක්ෂක ගිවිසුම සම්බන්ධයෙන් එවකට බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය මාග්‍රට් තැචර්ට සිහි කැඳවීමක් ද කර ඇත. මේ අතරම හිටපු ඉන්දීය අග්‍රාමාත්‍ය ඉන්දිරා ගාන්ධි, ශ්‍රී ලංකාවට උපකාර නොකරන්නැයි මාග්‍රට් තැචර්ගෙන් ඉල්ලීමක් කර ඇති බව ද සඳහන් ය.

කෙසේ නමුත් මෙවැනි පසුබිමක් තුළ ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා සහ ඉන්දීය අග්‍රාමාත්‍ය රජීව් ගාන්ධි 1987 වසරේ දී ඉන්දු ලංකා ගිවිසුමට අත්සන් තැබූහ. එම ගිවිසුම හා සම්බන්ධව දෙරටේ නායකයන් ලිපි හුවමාරු කරගෙන ඇති අතර ඉන්දියාවේ අභිලාෂවලට බලපෑම් එල්ල කරන පරිද්දෙන් ත්‍රිකුණාමලය හෝ ශ්‍රී ලංකාවේ කිසිදු වරායක් හෝ හමුදාවක භාවිතයකට නොගත යුතු බවටත් ත්‍රිකුණාමලය තෙල් ටැංකි පර්යන්තය සංවර්ධනය කිරීම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස සිදුවිය යුතු බවටත් එහිදී එකඟතා ඇති කර ගෙන තිබේ.

කෙසේ නමුත් ඉකුත් දශකයක වනවිට ඉන්දියාවේ ස්ථාවරය වෙනස් වූ අතර ඉන්දියාව, ත්‍රිකුණාමලය සංවර්ධනය කිරීමේ දී ඇමෙරිකා එක්සත් ජනපදයට හා ජපානයට විවෘත වීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කළේ ය.

තෙල් ටැංකි සම්බන්ධයෙන් එලෙස 1987 වසරේ දී එකඟතාවක් ඇති කරගත්ත ද එය ක්‍රියාවට නැංවුණේ 2003 වසරේ දී ය. එහිදී ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව වසර 35ක් සඳහා තෙල් ටැංකි 99කින් සමන්විත ත්‍රිකුණාමල තෙල් ටැංකි පර්යන්තය ඉන්දියන් ඔයිල් සමාගමට බදු දුන් අතර එතැන් පටන් එහි මෙහෙයුම් කටයුතු සිදුවිය. ඒ අනුව ලංකා අයි.ඕ.සී. සමාගම ආරම්භ වූ අතර එම සමාගම තෙල් ටැංකි 14ක මෙහෙයුම් කටයුතු සිදු කරගෙන ගියේ ය.

නව අවබෝධතා ගිවිසුමක් සම්බන්ධයෙන් 2015 දීත් 2017 දීත් කතාබහක් ඇති වන්නේ එවැනි පසුබිමක ය. දැනට පවතින ද්විපාර්ශවීය අවබෝධතා සහ 2017 වසරේ අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුම පදනම් කරගනිමින් ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධනය කිරීම සහ ඒවායේ මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සම්බන්ධයෙන් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සාකච්ඡා පවත්වන බව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයේ ප්‍රකාශකයෙක් 2021 දී නිවේදනය කළේ ය. ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධනය කිරීම සහ ඒවායේ මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සම්බන්ධයෙන් වන සාකච්ඡා දැනට පවතින ද්විපාර්ශවීය අවබෝධතා සහ 2017 වසරේ අත්සන් තැබුණු අවබෝධතා ගිවිසුම පදනම්

කරගනිමින් පවත්වන නමුත් ඒ අවබෝධතා හෝ ගිවිසුම් යැපෙන්නේ නැති ඒ අවස්ථාවේ දී ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය සඳහන් කළේ ය.

මෙම සාකච්ඡාවලදී දෙරටටම ප්‍රතිලාභ ගෙනෙන දෙපාර්ශවයටම පිළිගත හැකි මොඩලයකට ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංවර්ධනය කිරීම සහ ඒවායේ මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සම්බන්ධයෙන් දෙරටම සාකච්ඡා කළ බව ද එහිදි කියැවිණි. මේ අනුව අදාළ සාකච්ඡා 2021 වසරේ පෙබරවාරි මාසයේ දී පවත්වා තිබූ අතර මේ අනුව ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණයේ ඉහළ කොටසේ පිහිටි තෙල් ටැංකි මෙලෙස සංවර්ධනය කර මෙහෙයුම් කටයුතු ආරම්භ කරන බව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය එම අවස්ථාවේ දී නිවේදනය කළේ ය.

මෙහි අවසන් ප්‍රතිඵලයක් වශයෙන් ඉකුත් වසරේ ජනවාරි මාසයේ දී ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ගිවිසුමකට එළැඹිණි. අදාළ ගිවිසුමට අනුව තෙල් ටැංකි සංකීරණයේ තෙල් 24ක් ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට හිමි වූ අතර ලංකා අයි.ඕ.සී. සමාගමට තෙල් ටැංකි 14ක් හිමි විය. අදාළ ගිවිසුම යටතේ ට්‍රින්කෝ පෙට්‍රෝලියම් ටර්මිනල් කම්පනි (ඔෂඔක) සමාගමට තෙල් ටැංකි 61ක් ලැබිණි.

උපායමාර්ගිකව ඉතා වැදගත් භූගෝලීය ස්ථානයක පිහිටා ඇති, දේශීය සහ විදේශීය වශයෙන් වැඩි අවධානයක් සහ වැදගත්කමක් ඇති, භූගෝලීය වශයෙන් ඉතා ඉහළ වැදගත් කමක් උසුළන ත්‍රිකුණාමල වරාය තවමත් ඇත්තේ අවසංවර්ධිත මට්ටමේ ය. පළමු ලෝක යුද්ධයෙන් පසු ඉදිවුණු දෙවැනි ලෝක යුද්ධය සමයේ දී මිත්‍ර හමුදාවලට විශාල පහසුකම් සැපයූ මෙම ත්‍රිකුණාමලය වරාය මෙන්ම බ්‍රිතාන්‍යයන් විසින් ඉදි කළ තෙල් ටැංකි පර්යන්තය ද ඇත්තේ අවසංවර්ධිත මට්ටමක ය.

# චීන උගුලට හසුව ගලායන යාන්ඔය කඳුළු

**ලක්මාල් කේ. බදුගේ**

මහින්ද චින්තනය තුල මහින්ද රාජපක්ෂ රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය වුයේ කෘෂිකාර්මික වශයෙන් ස්වයංපෝෂිත රටක් නිර්මාණය කිරීමය. ඒ අනුව ත්‍රිකුණාමලය හා අනුරාධපුර දිස්ත්‍රික්කයන් හි ඊසාන දිග මායිමේ ජීවත්වන ජනතාවගේ ආර්ථිකය ඉහළ නංවා එම ප්‍රදේශ මිරිදිය ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තය ඇසුරෙන් ස්වයංපෝෂිත කිරීමට සැළසුම් කෙරිණි. ඒ අනුව හෙළ රජ සමයෙන් පසු මෙරට ඉදිවු දිගම හා වැඩිම වේලි සහිත ජලාශය වන යාන් ඔය ජලාශය ඉදිකිරීමට මහින්ද රාජපක්ෂ රජය මහා ධන සම්භාරයක් වැය කලේය. වැඩ නිමවීමෙන් පසු එය මෙරට ඉදිවු තුන්වන විශාලතම ජලාශය මෙන්ම අපේක්ෂිත ඉලක්ක ඉටු නොවු අසාර්ථකම වාරි ව්‍යාපෘතිය විය.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ වාරිමාර්ග සංවර්ධන සැළසුමට අනුව ජලාශයේ ඉදිකිරීම් කටයුතු චීන ඉදිකිරීම් සමාගමක් වු චයිනා ක්ඵක ඉංජිනේරු පුද්ගලික සමාගම විසින් කරනු ලැබීය. ඒ අනුව ජලාශයේ වම් ඇල හා ප්‍රධාන වේල්ල ඉදිකිරීම චීන සමාගම සිදුකල අතර සෙසු ඉදිකිරීම් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් කර තිබුණි. ඒ සඳහා ඇස්තමේන්තු කල මුදල ඇමරිකානු ඩොලර් මිලියන 210 කි. මෙපමණ මුදල් සම්බාරයක් වැය කලද මේ මහා ව්‍යාපෘතිය හරහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව අපේක්ෂා කල ඉලක්ක නිසියාකාරව ඉටුකරගත් බවක් පෙනෙන්නට නැත.

## ව්‍යාපෘතියට චීන අරමුදල්

රිටිගල අවට දිය කඳුරකින් ගලාවිත් කල්ලරාවෙන් මුහුදට වැටෙන යාන්ඔය ගෝමරන්කඩවල, පඹුරුගස්වැව දී වේල්ලක් බැඳ හරස්කර ජලාශයක් තනා උතුරුමැද හා නැගෙනහිර පළාත් වල ජල සම්පත සංවර්ධනය කිරීම ජලාශය තැනීමේ මුලික අරමුණ වී තිබුණි. මෙම ජලාශය මගින් ඊසාන දිග ප්‍රදේශයේ තරුණ තරුණියන් 7200 කට සෘජු හා වක්‍ර රැකියා අවස්ථා ලැබෙන බවත් සියයට 85% ක චීනයේ අරමුදල් මත ඉදිවන ජලාශය හරහා ගොවි පවුල් 10,000 කට ප්‍රතිලාභ හිමිව හෙක්ටයාර් 9500 කට ජලය සැපයෙන බව 2012 වසරේ දී යාන්ඔය ජලාශයේ වැඩ ආරම්භ කරමින් එවකට ජනපති මහින්ද රාජපක්ෂ කියා තිබුණි.

ඒ අනුව යාන්ඔය ජලාශයේ වම් ඉවුර ප්‍රධාන ඇළ සැළසුම් කර ඉදිකිරීම සඳහා ඉංජිනේරුමය, ප්‍රසම්පාදන හා ඉදිකිරීම් (ඇජක) කොන්ත්‍රාත් පදනම මත දෙවසරක කාලයක් තුල අවසන් කිරීමට චීන සමාගම වෙතින් තාක්ෂණික හා මුල්‍ය යෝජනා කැඳවීමට 2017 පෙබරවාරි මස අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවුයේය. කිලෝමීටර පහක යටි උමං මාර්ගයක් හා කොන්ක්‍රීට් ආස්තරණ සහිත සංකීර්ණ නිර්මිත රාශියක් ඉදිකිරීමට සිදුවනු ඇතැයි කියමින් වාරිමාර්ග හා ජලසම්පත් කළමණාකරන අමාත්‍ය විජිත් විජයමුණි සොයිසා මෙකී යෝජනාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි.

එහිදි ඔහු කියා තිබුණේ ඉහළ ගුණාත්මකභාවයකින් සැලසුම්කර ඉදිකිරීම සඳහා තාක්ෂණය අතින් පිරිපුන් ජාත්‍යන්තර මට්ටමේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහය ලබා ගැනීම සුදුසු බව නිරීක්ෂණ වී ඇති හෙයින් ඒ සඳහා විවෘත, ජාත්‍යන්තර, තරගකාරි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කිරීම සඳහා ගතවන කාලය සැලකිල්ලට ගැනීමේ දී ප්‍රදේශයේ ජනතාවට ජලය සැපයීම අපේක්ෂිත කාලයට වඩා වසරකින් පමණ ප්‍රමාද වනු ඇති බවත් එමනිසා යාන්ඔය ජලාශය සැළසුම් කර ඉදිකිරීම කරන ප්‍රධාන කොනන්ත්‍රාත්කරු වන කයසබ් ක්ඵකෑබටසබැුරසබට ආයතනයේ සේවය වම් ඉවුරු ඇළ

සැළසුම් කර ඉදිකිරිම සඳහා ලබා ගැනීම තාක්ෂණික හා ආර්ථික වශයෙන් වඩා ඵලදායි හා ප්‍රායෝගික වනු ඇතැයි පවසමිනි.

## ඉදිකිරීම් චීනයට - අමාත්‍ය මණ්ඩල අනුමැතිය

මෙකී කරුණු සැලකිල්ලට ගනිමින් යාන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වම් ඉවුර ප්‍රධාන ඇළ ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත්තුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද සාකච්ඡා සම්මුති කමිටුවේ නිර්දේශය පරිදි, ඇමරිකානු ඩොලර් මිලියන 39.5 ක මුදලකට සැළසුම් කර ඉදිකිරීමේ පදනම මත චීන ඝ්ජ්ක සමාගමටම ලබා දීමට කටයුතු කරන ලෙස ඉල්ලා වාරිමාර්ග ජලසම්පත් කළමනාකරණ අමාත්‍ය විජිත් විජයමුණි සොයිසා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කල යෝජනාවට 2017 දෙසැම්බර් මස අනුමැතිය හිමිවුයේය.

කෙසේ නමුත් මහින්ද රජපක්ෂ පැවැසු පරිදි 85% ක චීන අරමුදල් මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී ඇති බවක් පෙනෙන්නට නැත. ජලාශ ව්‍යාපෘතිය සඳහා චීන ණය හෝ ආධාර අරමුදල් ලැබී තිබුණේ ද යන්න පිළිබඳව මහ බැංකුවෙන් හා විදෙස් සම්පත් දෙපාර්තමේන්තුවෙන් කල විමසුම් වලදී, එකී තොරතුරු තමන් සතුව නැති බවත් මුදල් අමාත්‍යාංශය සන්තකයේ ඇතැයි විශ්වාස කරන බව මහ බැංකුව දන්වා සිටියේය. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව පැවැසුවේ යාන්ඔය ව්‍යාපෘතිය දේශීය අරමුදල් පමණක් භාවිත කර සිදුකර ඇති බැවින් ඒ සම්බන්ධ තොරතුරු තමන් සතුව නොමැති බවයි.

ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු කල ඝ්ජ්ක සමාගම සම්පූර්ණ ව්‍යාපෘතිය ඇමරිකානු ඩොලර් මිලියන 176 කට ඉදිකිරීමට ඉදිරිපත් වීමෙන් පසුව ඩොලර් මිලියන 150 ක මුදලකට ප්‍රධාන වේල්ලේ වැඩ ඉදිකර ඇති නමුත් චීන අරමුදල් සපයන ආයතන සම්පූර්ණ කොන්ත්‍රාත්තුවට මුදල් ලබානොදුන් බව "ඉකොනොමි නෙක්ස්ට්" වෙබ් අඩවිය 2017 වසරේ දී වාර්තා කලේය. මුළු ව්‍යාපෘතියම ඩොලර් මිලියන 176 කට අවසන් කිරීමට හැකිව තිබුණේ නම් ව්‍යාපෘතියේ කොටසක් වු වම් ඉවුරු ඇළ සඳහා තවත් ඩොලර් මිලියන 39.5 ක මුදලක් ලබාදීමෙන් ඩොලර් මිලියන 189.5 ක් චීන සමාග මට නිකරුනේ පිදීමට ආණ්ඩුව කටයුතු කර ඇත්තේ චීන අරමුදල් ද ජලාශය ඉදිකිරීමට නොලැබී ඇති මොහොතක බව පෙනේ.

## යාන්ඔය චීන ආර්ථික මෙහෙයුමක්

චීන අරමුදල් නොලැබීම හා දේශීය අරමුදල් රුපියල් මිලියන 34,000 ක් ජලාශය ඉදිකිරීමට වැය කිරීමෙන් එකී මුදල උපක්‍රමිකව චීන සමාගම විසින් ගිලගත් බව පෙනීයන්නේ විවෘත, ජාත්‍යන්තර, තරගකාරි ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය නොකරමින් ජලාශය ඉදිකිරීමේ ප්‍රධාන කොන්ත්‍රාත්තුව චීන ඝ්ජ්ක සමාගම ලබාගෙන තිබු හෙයිනි. එය අහම්බයක් හෝ රාජපක්ෂ ආණ්ඩුවේ චීන හිතවාදි පිළිවෙත මත සිදුවුවක් නොවේ. එය ඉතා සැළසුම් සහගත ආර්ථික මෙහෙයුම් ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

1992 මුල් භාගයේ දී මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය (කැක්) විසින් යාන්ඔය ජලාශය සම්බන්ධයෙන් පෙර ශක්‍යතා අධ්‍යනය සිදුකර තිබු අතර ඉන් සොයාගනු ලැබුවේ පදවිය ජලාශය අවට වගාකරන ප්‍රදේශ ආශ්‍රිතව වාරිකටයුතු උසස් කිරීමට යාන්ඔයේ ජලය හැරවිය හැකි බවයි. එහි ප්‍රතිඵලයක් මත පදනම්ව 1992 මැද භාගයේ දී ප්‍රාදේශීය සම්පත් හා විශේෂඥයින් යොදා ගනිමින් යාන්ඔය - පදවිය කෘෂිකාර්මික දීර්ඝ කරන ව්‍යාපෘතියේ දෙවන අධ්‍යයනය සිදුකරනු ලැබු අතර 1994 ජනවාරියේ දී වෙලුම් පහකින් යුතු අධ්‍යයන වාර්ථාව අවසන් කරනු ලැබීය.

කෘෂිකර්ම, වාරිමාර්ග හා මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ 2006 පෙබරවාරි මාසයේ දී කැක් ය විසින් සකසන ලද පෙරටු වාර්ථාව මත ශක්‍යතා අධ්‍යනය යාවත්කාලීන කරනු ලැබ තිබුණි. මේ අයුරින් විශාල මුදලක් හා මිනිස් ශ්‍රමය ද වැය කරමින් යාන්ඔය ව්‍යාපෘතිය සඳහා දශක දෙකකට පෙර මෙරට වියතුන් සකසනු ලැබු ශක්‍යතා අධ්‍යයන වාර්තාව දැනගත් චීන ඝ්ජ්ක සමාගම සිදුකලේ 169 පජප ධාරිතාවකින් යුත් යාන්ඔය ජලාශය ඉදිකිරීම සඳහා වන තාක්ෂණික යෝජනාවක් 2010 ඔක්තෝබර් මාසයේ දී මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට කඩිනමින් ඉදිරිපත් කිරීමය. චීන හිතවාදි රාජපක්ෂ ආණ්ඩුව එය පිළිගත්තා පමණක් නොව ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව ප්‍රධාන කොන්ත්‍රාත්තුව පවා චීනයට ලබාදුන්නේය.

## වැඩබිමේ චීන කම්කරුවන්

"ෂින්හුආනෙට්" වෙබ් අඩවිය මේ පිළිබඳව සඳහන් කර තිබුණේ යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය "දේශීය ගොවින්ගේ ජීවිත වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව හා චීනය සහයෝගීතා වාරි ව්‍යාපෘතිය" ලෙසිනි. 2015 පෙබරවාරි සිට 2018 ජුනි අවසන් කිරීමට නියමිත මෙම වාරි ව්‍යාපෘතිය මහජන සුබ සාධනය ඉලක්ක කරගත් ව්‍යාපෘතියක් යැයි එහි සඳහන් කර තිබුණි.

ජලාශය ඉදිවන සිව් අවුරුදු ඉදිකිරීම් කාලය තුල 5200 ක් පමණ වු සහය සේවාවන් හි යෙදෙන්නන් හටද රැකියා අවස්ථා සැළසෙනු ඇතැයි පැවැසුන ද චීන කම්කරුවන් සැලකිය යුතු ප්‍රමාණයක් ජලාශය ඉදි කිරීමේ දී සේවය කලේය. "ෂින්හුආනෙට්" වෙබ් අඩවියෙහි දැක්වුනේ ජලාශය ඉදිකරන කම්කරුවන් 1200 කින් දහසකට ආසන්න පිරිසක් අවට පුද්ගලයන් වන හෙයින් ඔවුන්ගේ ආර්ථික තත්වයද වඩා ඉහළ මට්ටමකට පැමිණ ඇති බවයි.

චීන කම්කරුවන් මෙරටට පැමිණීම පිළිබඳව

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ඉල්ලා සිටිය දී ඔවුන් කියා සිටියේ එකී තොරතුරු තමන් සතුව නැති බවත් තමන්ගේ විෂය පථයට අදාල නොවන බවත්ය. එසේ කියා ඔවුන් එකී තොරතුරු ඉල්ලීම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට යොමු කරනු ලැබ ඇත්තේ චීන කම්කරුවන් පිළිබඳ තොරතුරු ඇතොත් ලබාදෙන්නයි පවසමිනි. නමුත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවද එකී ව්‍යාපෘතියට අදාල තොරතුරු තමන් සතුව නැතැයි පවසමින් එම ඉල්ලීම වාරිමාර්ග අමාත්‍යාංශය වෙත යොමුකර තිබේ. අමාත්‍යාංශයද අදාල තොරතුරු ඉල්ලා ජලසම්පත් සංවර්ධන අතිරේක ලේකම් වෙත යොමුකර ඇතත් මෙතෙක් තොරතුරු නොලැබීම කුතුසට කරුණකි.

## මහා පරිසර හානියක්

මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්) සමාගම ජලාශය ඉදි කරන ප්‍රදේශය තුල ඊට අදාල පාරිසරික බලපෑම් ඇගයීම් වාර්ථාව සකසා 2013 වසරේ පෙබරවාරි මාසය වනවිට වාරිමාර්ග හා ජල සම්පත් කළමණාකාරන අමාත්‍යාංශය වෙත භාර දී තිබුණි. ඊට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිර්දේශ ඇතුලත් පුරාවිද්‍යා හානි ඇගයුම් වාර්ථාව ද එක්කර තිබුණේ ඍජු හා වක්‍ර බලපෑමට නතුවන පුරාවිද්‍යා ස්ථාන 49 ක් ගැනද සඳහන් කරමිනි.

එකී වාර්ථාවන්ට අනුව මේ ව්‍යාපෘතිය නිසා සිදුවන පාරිසරික හානිය සුළුපටු එකක් නොවේ. ජලය පිරවීමේ දී වැව් 21 ජලයෙන් යටව ගොස් සත්ව විශේෂ 255 කට හා ශාක විශේෂ 79 කට ඍජු හෝ වක්‍ර බලපෑම් සිදුවන බව කියා තිබුණි. ඒ පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව කිසිදු ආකාරයේ තැකීමක් නොදැක්වීය.

පරිසරවේදී සජීව චාමිකර පවසනුයේ "යෝජිත ජලාශය හේතුවෙන් පුල්මුඩේ ඛණිජ වැලි නිධිය අවට ස්වභාවික සම්පත් වලට වන බලපෑම පාරිසරික බලපෑම් ඇගයීම් වාර්ථාව තුල තක්සේරු නොතිබු බවයි" ඔහු වැඩිදුරටත් කියා සිටියේ යාන්ඔය ද්‍රෝණියේ නිමැවුමක් වන පුල්මුඩේ ඛණිජ වැලි නිධිය නොසලකා හැරීම සුළුපටු කරුණක් නොවන බවයි.

නමුත් මේ කිසිවක් තඹයකට මායිම් නොකර ජලාශය ඉදි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩවම කරගෙන ගියේය. නමුත් දැන් තත්වය උග්‍රව තිබේ. වන සතුන් හා මිනිසුන් අතර ගැටුම ඇරඹී තිබේ. පසුගියදා ගෝමරන්කඩවල කෝනාබැඳිවැව පුද්ගලයකු වන අලි ප්‍රහාරයකින් මිය ගියේය. ගතවු මාස දෙක තුල ගෝමරන්කඩවල ප්‍රදේශයේ පුද්ගලයන් සිව්දෙනෙකු වන අලි ප්‍රහාර නිසා මිය ගොස් සිටිති.

වන අලින්ට, දිවියන්ට හා වලසුන්ට නිජබිම වු නොයිඳුල් වනාන්තර අක්කර 6000 ක් ජලාශයේ ජලයෙන් පිරවෙන ප්‍රමාණය සඳහා රජයේ රක්ෂිතයෙන් ලබාගත් අතර සෙසු ඉඩම් පදිංචිව සිටි ජනයාගෙන් අත්පත් කර ගත්තේය. ඊට පරම්පරා ගණනාවක් ගොවිතැන් කල ඉඩම් හා මිනිසුන් ජීවත් වු ගම්මාන 9 ක් ඇතුලත් විය. මෙම ඉඩම් ජලාශයකට යට කිරීම යනු වනසතුන් ජීවත්වු නිජබිම් බලහත්කාරයෙන් උදුරා ගැනීමකි. එවිට නිජබිම්, ආහාර හා වාසස්ථාන අහිමිව යන වන සතුන්ටද මිනිසුන්ගේ භූමි වලට පය ගැසීමට සිදුවනු ඇත. එය වැළැක්විය නොහැකි එකකි.

එසේ තිබියදී ජලාශය නිසා ඉවත් කල ජනයා නැවත පදිංචි කිරීම වෙනුවෙන් ගෝමරන්කඩවල කජුවත්ත ප්‍රදේශයෙන් තවත් අක්කර 700 ක කැලයක් යලි කැපීමට ආණ්ඩුවට සිදුවුයේ මහා පරිසර හානියක් ද සමාජ ප්‍රශ්ණ රැසක් ද ඇති කරමිනි. ඉන් සිදුවුයේ වන අලින්ගේ වාසස්ථාන උන්ට අහිමිව යාමය. ඒ පිළිබඳව මෑතකදී ඉදිරිපත් වු පරිපුරක පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ සමාලෝචනයක් මගින් ප්‍රකාශ වුයේ යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කරවීම නිසා උතුරුමැද පලාත තුල අලි මිනිස් ගැටුම දැඩිලෙස වැඩි වීමට ඉඩ ඇති බවය.

## වන්දිත් නෑ.. කුඹුරුත් නෑ..

පාරම්පරික ඉඩම් ගම්බිම් අහිමිවන ජනතාවට වන්දි ලබාදී ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කිරීම සංවර්ධන ව්‍යාපෘතියක් ඇරඹීමේ දී පළමුව සිදුකල යුතු ප්‍රධානතම කාර්ය වුවද මෙම ව්‍යාපෘතිය තුල සිදුවුයේ එහි අනිත් පැත්තය. ජලාශයේ කටයුතු හිතුමතේ ආරම්භ කල නමුත් බලපෑමට ලක්වන ජනයා ගැන හෝ ආර්ථික හා පරිසර හානිය ගැන නොසිතීය. අවතැන්වන ජනයා වෙනත් ස්ථානවල පදිංචි කිරීමට සුදුසු ස්ථාන හඳුනාගෙන තිබු නමුත් ඒවා හඳුනාගැනීමේ දී ජනතාව ඊට සහභාගිකර නොගැනීම නිසා ආණ්ඩුව පෙන්වූ විකල්ප ස්ථානවලට යාමට මිනිසුන් අකමැති වීමෙන් නැවත අර්බුදයක් නිර්මාණය වුයේය.

මෙසේ තිබියදී පරිපුරක පාරිසරික බලපෑම් තක්සේරුකරණයේ සමාලෝචනයක් මගින් ප්‍රකාශ වුයේ 1389 දෙනෙකුට නිවාස හෝ කෘෂි ඉඩම් හෝ දෙකම අහිමිවනු ඇති බවය. මෙයින් අදහස් කරනුයේ පාරිසරික බලපෑම් තක්සේරුකරන වාර්තාවේ හඳුනාගෙන ඇති නැවත පදිංචි කිරීමේ ස්ථාන තුන තවදුරටත් ප්‍රමාණවත් නොවන බවයි. ඒ අනුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව නැවත පදිංචි කිරීමේ ස්ථාන හතරක් හා නව වාරිමාර්ග ප්‍රදේශ හයක් නම්කරනු ලැබීය. එබැවින් නැවත පදිංචි කිරීම සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

ජලාශයට යටව යාම නිසා ඉන් අවතැන්ව ඉවත් කල පවුල් 131 ක් සඳහා ගොඩ ඉඩම් අක්කරයක් හා මඩ ඉඩම් අක්කර 1 ෳ ක් හා ඉවත් කල නිවාස සඳහා වන්දි ලබාදී දකුණු ඉවුර යටතේ මල්පෝරුව, මයිලවැව හා කජුවත්ත ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය

කර යලි පදිංචිකර ඇත. නමුත් හොරොව්පොතාන, ගෝමරන්කඩවල හා පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල පවසන්නේ අවතැන්වූවන් ගෙන් බොහෝ පිරිසකට තවමත් වන්දි හා කුඹුරු ඉඩම් ලබා දීමට නොහැකිව ඇති බවයි.

"ජලාශයට යටව යන ඉඩම් හා කුඹුරු වලට නියමිත කාලය තුල වෙනත් තැන් දුන්නෙ නෑ ඒ නිසා වැව් බැම්ම ඉදිවන කාලේ පුරාවටම අපිට කන්න හයක ගොවිතැන් කරගන්න බැරිවුණා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කලේ අපිට බොරු පොරොන්දු දීලා ජලාශය ඉදිකරපු එක අන්තිමට අපිට උන්හිටි තැන් නැතිවුණා.." යැයි පහළ යාන්ඔය පීඩාවටපත් ජනතා එකමුතුවේ ජනතා සම්බන්ධීකාරක ඒ. කරුණාරත්න පවසයි.

මේ නිසා කරුණාරත්න ඇතුළු පස්දෙනෙකු යාන්ඔය ජලාශය නිසා මුහුණ පා ඇති ගැටලුවට යුක්තිය ඉල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේ මූලික අයිතිවාසිකම් නඩුවක් ගොණු කර තිබේ.

## අපේක්ෂිත ඉලක්ක ඉටු නොවීම

කිලෝ මීටර 3.59 ක දිගින් යුතු සඳැලි වේලි හතරකින් හා කිලෝ මීටර 2.35 කින් යුතු ප්‍රධාන වේල්ලකින් යුතු ජලාශයේ අක්කර අඩි 140,000 ජලධාරිතාවක් ජලාශය නිම කිරීමෙන් පසු රඳවා ගැනීමට අපේක්ෂා කලද ජලය පිරවීමේදී නොසිතූ ලෙස අක්කර අඩි 149,000 දක්වා ධාරිතාවය ඉහල ගියේ සැළසුමේ සඳහන් ගම්මාන නවයට අමතරව මාවතගම, අලියාකඩ, මරදන්මඩුව හා වාගොල්ගාකඩ යන ගම්මාන තුලට ද ජලය ගලා එමිනි.

මෙවන් ගැටලු රැසක් ඇති කරමින් ඇරඹි යාන්ඔය ජලාශ ව්‍යාපෘතිය තුලින් බහුකාර්යන් රැසක් ඉටු කෙරෙන බව මූලික සැළසුමේ සඳහන් වුවද ඉන් අඩක් හෝ නිසියාකාරව ඉටුකර ගැනීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත්ව තිබීම කණගාටුවට කරුණකි.

හෙක්ටයාර් 17,814 ක වගාබිම් ප්‍රමාණයක් අස්වද්දවා ඉන් පවුල් 14,000 ගේ පමණ ආර්ථිකය නංවාලීමට කටයුතු කෙරෙන හෙයින් මෙම ප්‍රදේශයේ දරිද්‍රතාවය අවම වනබව පැවැසුණ ද එය පුස්සක් වී ඇත්තේ ගම්වැදි අලි එලවා දැමීමට කාලය මිඩංගු කිරීමට ගොවීන්ට සිදුව ඇති හෙයිනි.

අනික් පසින් ත්‍රිකුණාමලය නගරය, කුච්චවේලිය, ගෝමරන්කඩවල, පදවිය හා පුල්මුඩේ වැනි ප්‍රදේශවල පවුල් ලක්ෂ පහක ජනයා සඳහා පිරිසිදු පානීය ජලය ලබාදීමට අපේක්ෂා කරන බව පැවැසුන ද මුදල් නොමැති හෙයින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවන බව ජලසම්පාදන මණ්ඩලය පවසන්නේය.

ජලාශයේ මිරිදිය ධීවර කටයුතු සංවර්ධනය කිරීමෙන් තවත් පවුල් 2000 කට සෘජු රැකියා අවස්ථා ලැබෙනු ඇති බවට ගණන් බලා තිබූ නමුත් මිරිදිය ධීවර කර්මාන්තය හෝ ගොවිතැන අපේක්ෂා කල ආකාරයට ඉහළ නංවා ගැනීමට ආණ්ඩුව අපොහොසත්ව තිබේ.

කෙසේ වෙතත් වී වගාකල හෙක්ටයාර 1677 කට ආසන්න කෘෂි බිම් ප්‍රමාණයක් විනාශ කරමින් කුඩා හා මහ වැව් රැසක් ද සැලකිය යුතු පුරාවිද්‍යා බිම් ප්‍රමාණයක් ද පාරම්පරිකව ජීවත්වූ ගම්මාන රැසක්ද ඇතුළු අක්කර 10,000 ක පමණ මහ වනයක් වනසමින් නිමැවුණු යාන්ඔය යලි උපයාගත නොහැකි පිරිවැයක් දැරූ ව්‍යාපෘතියක් විය. ඒ සඳහා රුපියල් මිලියන 36,000 ක දේශීය අරමුදල් වැය කිරීමෙන් එක් පසෙකින් අධික ණය බරක් රටේ ආර්ථිකයට එක්වුයේය.

දේශපාලකයන්ගේ අසාර්ථක ව්‍යාපෘතින්හි බර එක් පසෙකින් රටේ පොදුජන කරමත වැටී තිබේ. එකී පීඩාවන් ගෝමරන්කඩවල පඹුරුගස්වැව, මාවතවැව ජනයා විදිමින් සිටිති. අනෙක් පසින් නිජබිම් අහිමිව අසරණ වූ වනසතුන්ය. නොබෝ දිනකින්ම අලි - මිනිස් දෙපාර්ශවය අතර නොනවතින යුද්දය ඇරඹෙනු ඇත. ඉන් කිසිවෙකුත් ජය නොලබනු ඇත. නමුත් චීනය තවත් ව්‍යාපෘතියකට අත තබනු ඇත.

# නෙළුම් කුළුණේ
# උස හා චීන පාදමේ දිග පළල

සුනිල් ජයසේකර

අද ශ්‍රී ලංකාව තම බංකොලොත් බව නිල වශයෙන් පිළිගෙන ඇති රටකි. ඇමරිකානු ඩොලර් බිලියන 38.1 ක් පමණ වන ශ්‍රී ලංකාව දරණ විදේශීය ණය ප්‍රමාණයෙන් ඩොලර් බිලියන 26 ක ප්‍රමාණයක් ගෙවීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇතැයි ශ්‍රී ලංකාව නිල වශයෙන් ප්‍රකාශයට පත්කිරීමත් සමග රටක් වශයෙන් එම තත්වය උරුම කරගෙන තිබේ.

බී.බී.සී ලෝක සේවයේ නිවුස් නයිට් ආර්ථික සංස්කාරක වෙත් චූ 2023 ජනවාරි මාසයේදී වාර්තා කර ඇති ආකාරයට මෙන්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශිත කරුණු කාරණා අනුව මෙම සමස්ත ණය ප්‍රමාණය අතරින් ඩොලර් මිලියන 7 ක ප්‍රමාණයක් ලබා දී ඇත්තේ චීන රාජ්‍යයෙනි. එමෙන්ම ෆිච් රේටින්ස් ආයතනය ප්‍රකාශ කර ඇති ආකාරයට හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වාර්තාවන්ට අනුව ශ්‍රී ලංකාවේ කර මත ඇති සමස්ත ණය ප්‍රමාණයෙන් 13% ක් අයත් වන්නේ චීන ද්විපාර්ශවීය නිල ණය සහ චීන සංවර්ධන බැංකුවේ සහ එහි අපනයන ආනයන බැංකුවලින් ලබාගෙන ඇති ණය මුදල්වලටය.

චීනය මගින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති ණය පිළිබඳව විග්‍රහයක යෙදී ඇති ඇමරිකානු ආධාර නියෝජිත ආයතනයේ පරිපාලිකා සමන්තා පවර් මහත්මිය එම ක්‍රියාවලිය හඳුන්වා ඇත්තේ "අනෙකුත් ණය දෙන්නන්ට වඩා වැඩි පොලී අනුපාත යටතේ බොහෝ විට විනිවිද නොපෙනෙන ගණුදෙනු" ලෙසටය. එමෙන්ම එහිදී ඇය වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ශ්‍රී ලංකාවට විශාලතම ණය දෙන්නන්ගෙන් එක් අයෙක් බවට චීනය පත්ව තිබෙන බවය.

චීන ණය ගැන වන ඉහත පූර්විකාව වැදගත් වන්නේ චීනය මගින් විවිධ ව්‍යාපෘති මුල්කරගෙන ශ්‍රී ලංකාවට ලබා දී ඇති විවිධ ණය පහසුකම් පිළිබඳව ඒ තුළින් අවබෝධයක් ලබාගත හැකි නිසාය. බහුකාර්ය රූපවාහිනී හා විදුලි සංදේශ කටයුතු සඳහා කොළඹ නගර මධ්‍යයේ ඉදිකරන ලද නෙළුම් කුළුණ ද එවැනිම වූ තවත් එක් ණය ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැකිය.

නෙළුම් කුළුණ ඉදිකිරීම් ආරම්භ කරන්නේ 2011 වසරේදීය. ඒ කැබිනට් මණ්ඩලය මගින් ගනු ලැබූ තීන්දු දෙකක් පදනම් කරගෙනය. ඒ සඳහා වන පළමු ආමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ඉදිරිපත් කර ඇත්තේ එවකට ජනාධිපතිව සිටි මහින්ද රාජපක්ෂ මහතා විසිනි. 10/2473/401/031 අංකය යටතේ 2010, ඔක්තෝබර් 13 වන දින එය ඉදිරිපත් කර තිබේ. (ඇමුණුම අංක 1) ඒ මගින් අනුමැතිය ඉල්ලා ඇත්තේ විවේක උද්‍යානයක් සමග මීටර් 350 උසැති බහුකාර්ය රූපවාහිනී හා විදුලි සංදේශ කුළුණක් ඉදිකිරීමටය. ඊටම අදාළ දෙවන කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන්නේ 2011.11.30 වැනි දිනයේය. ඒ 11/2262/501/026/ටී.බී.ආර් අංක යටතේය (ඇමුණුම 02).

ඒ මගින් අදාළ ඉදිකිරීම් කටයුතු පවරා ඇත්තේ චීන සමාගම් දෙකක් වන CEIEC (China National Electronics IMP & EXP'Corp) හා ALIT (Aerospace Long_March International Trade CO'LTD) වෙතය. එහෙත් මෙම සමස්ත ව්‍යාපෘතියට අදාළව කිසිදු ටෙන්ඩර් කැඳවීමක් සිදුකර නැති බව පෙනේ. එමෙන්ම කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන අවස්ථාව වන විටත් ඉහත සමාගම් දෙක සමග අදාළ ව්‍යාපෘතියට සම්බන්ධයෙන් යම් එකගත්වයක් ඇතිකරගෙන තිබුණ බව එහි 2.4 වගන්තිය අනුව පැහැදිළිය. ඒ අනුව නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව CELEC සහ ALIT යන සමාගම් දෙක අතර 2012 ජනවාරි 03 වන දින ගිවිසුමකට එළඹ තිබේ. එකී ගිවිසුම්ගත චීන සමාගම් දෙකම 100% ක් චීන රජයට අයත් වන බවද එහි දැක්වේ. එමෙන්ම සමස්ත ව්‍යාපෘතියෙහි මුළු පිරිවැය ඇමරිකානු ඩොලර්

104,300,000.00 ක් වන බවද එහි සඳහන්ය. (ඇමිණුම 03)

පෙර සඳහන් කළ කැබිනට් තීන්දු මගින් දුන් අනුමැතිය පරිදි ව්‍යාපෘතියට අදාළ පිරිවැය සඳහා චීන එක්සිම් බැංකුවෙන් ණය මුදල් ලබාගැනීමට අවස්ථාව ද ලබාදී ඇත. එමෙන්ම ඉහත දක්වා ඇති චීන සමාගම් දෙක හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව අදාළ මුළු මුදලින් 15% අත්තිකාරමක් එකී සමාගම් වෙත ගෙවීමට ද එකග වී තිබේ. එමෙන්ම එකී අත්තිකාරම 2012 සැප්තැම්බර් මස 28 දින ගෙවා ඇත. එකී මුදලේ වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 1.6 ක මුදලකි. (USD 15,645,000.00). (ඇමිණුම 04) එහෙත් එකී මුදල ගෙවා ඇත්තේ ගිවිසුම්ගත පාර්ශවකාර සමාගම් දෙකෙහි ඒකාබද්ධ ගිණුමකට නොව එහි එක් පාර්ශවයක් වන සෑෂෑක සමාග මට අයත් බැංකු ගිණුමකටය.

මෙම තත්ත්වය ප්‍රශ්ණකාරී හා සැකකටයුතු දෙයක් ලෙස පෙනී යන්නේ පසුකාලයෙහි එනම් 2015 වසරේ බලයට පත්වූ ජනාධිපතිවරයාගේ රජය මෙම ව්‍යාපෘතිය පිළිබඳව සිදුකරන ලද සමාලෝචනයකදී ය. එහිදී පෙනී ගොස් ඇත්තේ ගිවිසුම්ගත පරිදි අදාළ ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු ඉහත සමාගම් දෙක විසින් සිදුකල යුතු වුවත් ඉන් එක් සමාගමක් වන ALIT සමාගම ඒ කිසිදු කටයුත්තකට කිසිවිටක සම්බන්ධ වී නොමැති බවය. අඩුම වශයෙන් එහි කාර්යාලයක් තබා කිසිදු සේවකයෙකු වත් ශ්‍රී ලංකාව තුළ කටයුතු නොකරන බවය. එමෙන්ම එකී ඉදිකිරීම් කටයුතු වලට අදාළ කිසිදු කටයුත්තක සම්බන්ධීකරණ කටයුත්තක පවා යෙදී සිටින බවට සාක්ෂි නොමැති බවය. මෙම තත්ත්වය අනාවරණය වීමෙන් පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමේ එවකට කටයුතු කළ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා ALIT ආයතනය වෙනුවෙන් ගිවිසුම අත්සන් කළ එහි සභාපතිවරයා ලෙස පෙනී සිටි පුද්ගලයා වන GUO ZHAOPIG අමතා ලිපි දෙකක් ගිවිසුම්ගත ලේඛනයේ සඳහන්ව ඇති ලිපිනය වන 3rd Floor, Building D, International Finance and Economy Center, NO 87, Xisanhuan Beilu, Haidian District, Beijing, China වෙත යොමුකර ඇති නමුත් එවැනි ආයතනයක් එම ලිපිනයෙහි සඳහන් ස්ථානයෙහි නොමැති බව සඳහන් කරමින් ආපසු හරවා එවා ඇත.(ඇමිණුම 05,06,07)

එමෙන්ම මේ පිළිබඳව ජනාධිපති කාර්යාලය මෙන්ම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වාර ගණනාවකදීම ගිවිසුම්ගත අනෙක් සමාගම වන CEIEC වෙතින් කරන ලද විමසීමේදී ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ ALIT සමාගම එකී සමාගම වෙත පැවරී ඇති වගකීම් ඇටෝර්නි බලපත්‍රයක් මගින් තම සමාගම වෙත පවරා දී ඇති බවය. එහෙත් එහිදී මතුවන පැහැදිළි ප්‍රශ්ණය වන්නේ ත්‍රෛපාර්ශවීය ගිවිසුමකට අදාළව ඇතිකරගෙන ඇති එකගත්වයක් හෝ වගකීමක් ඊට අදාළ කිසිදු පාර්ශ්වයකට තම තනි කැමැත්තට අනුව අනෙකුත් පාර්ශ්වයකට නොදන්වා බැහැරවීමට හෝ වගකීම් පැවරීමට නොහැකි බවය.

මෙම තත්වයෙහි ඇති අසාමාන්‍ය බව හා බැරෑරුම් බව නිසාම එවකට ජනාධිපති ලේකම් ලෙස කටයුතු කළ ඔස්ටින් ප්‍රනාන්දු මහතා මෙන්ම එවකට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්වරයා වූ පී.ආර්.එස්.පී ජයතිලක යන අය විසින් බෙයිජිං නුවර ශ්‍රී ලංකා තානාපති ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු අමතා ලිඛිතව කරුණු දක්වමින් ALIT සමාගම මගින් CEIEC ආයතනයට ලබා දී ඇතැයි කියන ඇටෝර්නි බලපත්‍රය සහතික කරගැනීමට හැකියාවක් ඇත්දැයි විමසා බලන ලෙස දැනුම් දී ඇත. එමෙන්ම ත්‍රෛපාර්ශවීය ගිවිසුම අත්සන් කිරීමේදී ALIT සමාගම වෙනුවෙන් එහි සභාපති ලෙස එයට අත්සන් තබා ඇති Guo ZHAMPING වෙනුවට Luo Zepig නැමැති අයෙක් පසුව සභාපති ලෙස පෙනීසිටීම ගැන දන්වා සිටිමින් ඒ ගැනද කරුණු විමසා බලන ලෙස ඉල්ලා සිටිමින් ලිපි යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා තානාපතිවරයා සිදුකර ඇති විමර්ශණයකදී අදාළ සමාගම් විසින් ලබා දී ඇති පිළිතුරු විශ්මය දනවන සුළුය.

එහිදී ඔවුන් ප්‍රකාශ කර ඇත්තේ ALIT සමාගම CEIEC වෙත බලය පවරමින් ඇටෝර්නි බලපත්‍රයක් ලබාදුන්නාට අමතරව එකී සමාගම කලින් යටත්ව තිබූ චීන අමාත්‍යාංශයෙන් වෙනත් අමාත්‍යාංශයකට ද මාරුකර ඇති බවය.එමෙන්ම ගිවිසුම් අත්සන් කරන මොහොතේ සිටි සභාපතිවරයා මේ වන විට වෙනත් ආයතනයක තනතුරකට පත්ව ගොස් ඇති බවය. එමෙන්ම ALIT සමාගමේ කාර්යාලයීය ලියාපදිංචිය එයම වුවත් කාර්යාලය වෙනත් තැනකට මාරු කර ඇති බවය. ( ඇමුණුම් 8,9,10,11,12)

ඒ අනුව සලකා බැලුව ද වඩාත්ම ප්‍රශ්ණ සහගත කරුණ වන්නේ මෙම තත්වයන් පිළිබඳව ශ්‍රී ලංකා පාර්ශ්වයෙන් කරුණු විමර්ශණය කරන තුරුම ඒ කිසිවක් පිළිබඳව චීනයට අයත් සමාගම් දෙකින් එකක් හෝ ඒ ගැන ශ්‍රී ලංකා පාර්ශවයට පිළිගත හැකි ආකාරයට හෝ විධිමත් ලෙස තොරතුරු වාර්තා කර ඇතැයි යන්න ගැන වාර්තා කිසිවක් නොවීමය. එහෙත් 2018 මැයි මස 31 දාතමින් චීනයේ ශ්‍රී ලංකා තානාපති ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා වෙත එවා ඇති ලිපියෙහි කරුණු කිහිපයක් සඳහන්ව ඇත. එම කරුණු පාදක කරගෙන ඇත්තේ ශ්‍රී ලංකා තානාපතිවරයා CEIEC සහ ALIT යන සමාගම් දෙක තම කාර්යාලයට කැඳවා සිදුකර ඇති සාකච්ජාවේදී ප්‍රකාශ වී ඇති කරුණු පදනම් කරගෙනය.

එකී ලිපිය මගින් දක්වා ඇති කරුණු අනුව ශ්‍රී ලංකා තානාපතිවරයා CEIEC සහ ALIT සමාගම් දෙකම රාජ්‍ය සමාගම් දෙකක් බව සඳහන් කර ඇති අතර එම සමාගම් දෙක නෙළුම් කුළුණ ව්‍යාපෘතියෙහි කටයුතු කරමින් සිටියදි එකී සමගම් දෙක අතර සම්බන්ධීකරණයට

අදාල අභ්‍යන්තර ප්‍රශ්නයක් මතුව ඇති බවට තොරතුරු ලැබුණු බව සඳහන් කරයි. එකී ප්‍රශ්න හේතුවෙන් ALIT සමාගමේ සියළු වගකීම් CEIEC වෙත පවරා ඇති බව ප්‍රකාශ වූ බව සඳහන් කරයි. එමෙන්ම ඒ බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසමට ඔවුන් විසින් කරුණු දක්වා ඇති බවට සඳහන් වන බවද එමෙන්ම එහි පිටපතක් තම ඉල්ලීම පරිදි තම කාර්යාලයට ලබා දීමට එකඟ වූ බවද සඳහන් කරයි.

එහෙත් එවැනි ලිපියක් තමන් වෙත ලැබුණු බව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම සනාථ කර ඇති අවස්ථාවක් පිළිබඳව තොරතුරු නැත. එමෙන්ම චීනයෙහි කටයුතු කරන ශ්‍රී ලංකා තානාපතිවරයා විසින් කරන ලද ඉල්ලීමට අනුව තානාපති කාර්යාලය වෙත පසුව ලබා දී ඇති එම පිටපත තවත් ලියවිලි කිහිපයක් ද සමඟ ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මහතා වෙත යොමු කර ඇත්තේ ඊට පෙර එවා ඇති ලිපියක මාසයකට ආසන්න කාලයකට පසු එනම් 2018 ජුනි මස 16 දිනැති ලිපිය සමඟය.

මෙම තත්ත්වයන් තුළ මෙම කරුණ මුල්කරග නිමින් ඊට මාස කිහිපයකට පෙර එවකට ජනාධිපතිව සිටි මෛත්‍රීපාල සිරිසේන මහතාද විශේෂ ප්‍රකාශයක් සිදුකරමින් සඳහන් කළේ ඒ වන විට මතුව ඇති තත්ත්වයන් තුළ පමණක් ඇමරිකානු ඩොලර් මිලියන 15.6 ක මුදලක් රටට අහිමිව ඇති බවයි. එයට අමතරව ගිවිසුම් ප්‍රකාරව 2012 වසරේ දී ඉදිකිරීම් ආරම්භ කළ නෙළුම් කුළුණේ වැඩ 2016 වසරේදී අවසන් විය යුතුව තිබුණත් එය අවසන් කරන ලද්දේ 2019 වසරේදීය. ඒ අනුව ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රමාදය වෙනුවෙන් ලංකාවට ලැබිය යුතු වන්දි මුදල් ගැන ශ්‍රී ලංකාවේ විගණකාධිපතිවරයා අවධානය යොමුකර තිබුණත් එවැනි වන්දියක් ලැබුණ බවට ද කිසිදු සළකුණක් නැත.

මෙම තත්ත්වය අපට සිහිපත් කරන්නේ සන්ඩේ ලීඩර් පුවත්පතේ සමාරම්භක කර්තෘ ලසන්ත වික්‍රමතුංගට සිය ඉරණම සියතින්ම සටහන් කරලීමට මඟ පෑදූ කුප්‍රකට මිග් යානා ගණුදෙනුවයි. එහිදී අදාළ යානා මිළ දී ගැනීම සඳහා ගිවිසුම් අත්සන් කරන ලද්දේ යුක්රින්මැෂ් නම් වූ සමාගමක් සමගය. එකී ගිවිසුම අනුව ඒ සඳහා මුදල් ගෙවා ඇත්තේ බෙලිමිස්සා හෝල්ඩිං නම් වූ සමාග මකටය. අවසානයේ හෙළි වූවේ ශ්‍රී ලංකාව විසින් මුදල් ගෙවූ සමාගම වන බෙලිමිසා හෝල්ඩිං සමාගම එහි සඳහන් වූ ලිපිනයෙහි පවා නොමැති එකක් බවය. එහෙත් නෙළුම් කුළුණ පිටපත ඊට තරමක් වෙනස් ය. එහෙත් මේ ආකාරයේ නාට්‍ය එක සමාන කතාවස්තු ඉදිරිපත් කරන අතර එවායේ රඟපානු ලබන්නේ ද එකම රැගේ නළුවන් ය.

ඇමරිකානු ආධාර නියෝජිත ආයතනයේ පරිපාලිකා සමන්තා පවර් මහත්මිය මැනවින් පෙන්වා දී ඇති ආකාරයට විනිවිද නොපෙනෙන ගණුදෙනුවලදී එවැනි දේ සිදුවිය හැකිය. එමෙන්ම එවැනි ගණුදෙනුවලට බොහෝ රටවල පාලකයන් හා බලවතුන් දක්වන කැමැත්ත මත සිදුවන දෙය ද හොඳින් වටහා ගත හැකිය. එය හොඳින් වටහා ගත් ලසන්ත වික්‍රමතුංග ඒ බව ලොවටම හෙළි කර එහි ප්‍රතිඵල අත්කරගත්තේය. එහෙත් දැන් ලංකාව බංකොලොත් රටක් වීම නිසා රටේ බහුතරයකට ජීවත්ව සිටිමින්ම ඒවායේ විපාක භුක්ති විඳීමට මේ වන විට අවස්ථාව උදාවී ඇත. මේ සියළු තත්ත්වයන් එසේ වෙද්දී චීනය ශ්‍රී ලංකාවට ලබාදුන් ණය මුදල යොදාගනිමින් දැවැන්ත කොන්ක්‍රීට් කුළුණක් ඉදිකර ඇති නමුදු ඒ මගින් රටට වැදගත් ප්‍රතිලාභයක් අත්කර දීමට මේ දක්වාම අසමත් වී ඇතත් මේ වන විට එය සියල්ලන්ටම දැක බලාගත හැකි ආකාරයට වර්ණවත් විදුලි බුබුළුවලින් සරසා කොළඹ නගරය මධ්‍යයෙහි ඉහළින්ම ඔසොවා තබා තිබේ.

# ණය වතුරේ ගිලී ගිය උමා ඔය සිහිනය

ඩී.එන්.කුමාරගේ

උමා ඔය යනු ඌව හැරුණු විට මෙරට සෙසු පළාත් අටේ ජීවත් වන සෙසු ජනතාවට විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක තවත් එක් ව්‍යාපෘතියක් පමණි. නිසි පරිසර ඇගයීම් වාර්තාවක් හෝ නොමැතිව 2012 දී වැඩ ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය නිසා ඌවේ ජන ජීවිතය උඩුයටිකුරු වූයේ ය. ගොවිතැන් ව්‍යාපාර කරමින් කාටත් අතනොපා ජීවත් වූ බොහෝ පිරිසකගේ ආදායම් මාර්ග බිඳ වැටී ඔවුන් මහාපාරට ඇද දමන්නට තරම් හේතු කරනා සැපවූ මෙම ව්‍යාපාරය ඉල්ලමක් කරගත් ඇත්තෝ ද සිටිති. මහජන විරෝධය හමුවේ නොයෙකුත් හැලහැප්පීම් ඔස්සේ ඉදිරියට ගිය උමා ඔය ජල විදුලිබල ව්‍යාපෘතියේ පළමු අදියරේ විදුලිබල නිෂ්පාදනය එළඹෙන අගෝස්තු මාසයේදී ද දෙවැනි අදියරේ නිෂ්පාදනය සැප්තැම්බර් මාසයේදී ජාතික විදුලි බල පද්ධතියට එකතු කරන බව විෂය භාර ඇමැතිවරයා වන කාංචන විජේසේකර පසුගියදා ප්‍රකාශ කළේ උමාඔය ඉදිකිරීම් භාරව සිටින ඉරානයේ ෆරාබ් ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂ ආචාර්ය අලි වකීලි (ශර. ʹකස ඪනසකසස) ඇතුළු කණ්ඩායමක් සමඟ කළ සාකච්ඡාවකින් පසුව ය. ව්‍යාපෘතිය අවසන් කිරීමත් සමඟ ජාතික විදුලි බල පද්ධතියට එකතු කිරීමට නියමිත මෙගාවොට් ප්‍රමාණය 120 කි.

උමා ඔය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා වන පළමු විධිමත් ඇස්තමේන්තුව 2005 - 2006 දී සකස් කරනු ලැබුවේ කැනඩාවේ ඩබ්ලින් නම් උපදේශන සමාගම විසිනි. එම ඇස්තමේන්තුවට අනුව උමා ඔය බහු කාර්ය යෝජනා ක්‍රමය සඳහා වැයවන මුළු මුදල ලෙස ගණනය කළේ අමෙරිකානු ඩොලර් මිලියන 155 කි. කැනඩාවේ ඩබ්ලින් උපදේශන සමාගම ඇස්තමේන්තුව ලබාදීමෙන් වසර වසර තුනකට පසුව ඉරානය මෙම ව්‍යාපාරයට මැදිහත් විය. ඉරාන ණය ආධාර යටතේ ඉදිකිරීමට තීරණය කළ මෙම ව්‍යාපෘතියට ඉරානය විසින් ඇස්තමේන්තු කළ මුදල ඩොලර් මිලියන 548 කි. 2008 අප්‍රේල් මස ඉරාන ජනාධිපතිවරයාගේ ලංකා සංචාරය අතරතුර මෙම ව්‍යාපෘතිය ඇරඹීමට සූදානම් ව පැවති අතර එවකට වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම්වරයාට එම ගිවිසුම අත්සන් කිරීමට බලය පවරා තිබුණි. ඒ වනවිටත් ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිසි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබීම නිසා ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් ලේකම්වරයා වෙතින් එල්ල වූයේ දැඩි විරෝධතාවකි. අවසානයේ ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ඇස්තමේන්තු කිරීමේ කොන්දේසිය මත ඉරාන ජනාධිපතිවරයාගේ සංචාරය අතරතුර අත්සන් තබනු ලැබුවේ හිස් ගිවිසුමකට ය . මේ අතර ඉරාන සමාගම දිගින් දිගටම ඇස්තමේන්තු මුදල ඉහළ නන්වන්නට විය. ඇමරිකානු ඩොලර් මිලියන 300 සීමාවේ දී මෙරට රජයේ නිලධාරීන්, ඉංජිනේරුවන් ප්‍රකාශ කර සිටියේ ඊට වඩා වැඩි මුදලක් ව්‍යාපෘතිය වෙනුවෙන් වැය කිරීම සුදුසු නොවන බවකි.

කෙසේ වුවත් 2008 දෙසැම්බර් මස මෙරට නිලධාරීන් පිරිසක් ඉරාන විශේෂඥයින් යැයි කියා ගන්නා කණ්ඩායමක් හා එක්ව සකස් කරන ලද ඇස්තමේන්තුවට අනුව ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට සැළසුම් කළ මුදල ඇමරිකානු ඩොලර් මිලියන 548 කි. එය ශ්‍රී ලංකාවේ වාරි ඉංජිනේරුවන් එකඟ වූ මුදලට වඩා ඇමරිකානු ඩොලර් මිලියන 248 කට වැඩි වීමකි. රුපියල් වලට ගණනය කළ විට ආසන්න වශයෙන් එම මුදල මිලියන 76,320 කි. එයින් 85%ක් ඉරාන රජය මගින් ද, 15% ක් ලංකා රජය මගින් ද දැරීමට ගිවිසුම අනුව දෙරට එකඟත්වය පළ කරනු ලැබීය. ඇස්තමේන්තු කර ඇති 1670 ක සේවක සංඛ්‍යාවෙන් බහුතරය එනම් 1334 ක් ම කම්කරුවන් ය. එම කම්කරු රැකියාවලින් 1197 දෙනෙකු ලංකාවෙන් ලබා ගනිත් දී ඉංජිනේරු රැකියා ඇතුළු ඉතිරි පුරප්පාඩු සියල්ල ඉරාන ජාතිකයන්ගෙන් පිරවීමට තීරණය වී තිබිණි.

අවස්ථා කිහිපයකදී රටවල් හා වෙනත් මූල්‍ය ආයතන මෙම ව්‍යාපෘතිය භාර නොගත්තේ ය. මහින්ද රාජපක්ෂ රජය 2008 අප්‍රේල් මාසයේ 29 වැනි දින ඉරාන රජයේ දායකත්වයෙන් එරට අපනයන සංවර්ධන බැංකුවේ මූල්‍ය-ණය ආධාර සහිතව ෆ්‍ෂාර් සැබීමකජ්බ්ළු සමාගම හා එක්ව ව්‍යාපෘතියේ වැඩ කටයුතු ආරම්භ කළේ වැල්ලවාය අලිකොටආරදී ය. සමාරම්භක අවස්ථාවට එවකට අග්‍රාමාත්‍ය ධූරය දැරූ රත්නසිරි වික්‍රමනායක මහතා ද ඉරාන ඉස්ලාමීය ජනරජයේ වාණිජ අමාත්‍ය මීර් රසාමි මහතා ද සහභාගි වූහ. ව්‍යාපෘතිය ආරම්භ වනවිටත් ඒ සම්බන්ධ පරිසර ඇගයීම් වාර්තාවක් හෝ ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබිණි. මුල්ගල තැබීමේ උත්සවයට පමණක් වියදම් කළ මුදල රුපියල් මිලියන 26 කි. මුල්ගල් තබා වසර 03 ක්ගත වූ මොහොතේ ලංකා ඉතිහාසයේ වැඩිම ලිඛිත විරෝධතා ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබියදී 2012 අප්‍රේල් මස 12 වන දින රජය විසින් පරිසර වාර්තාවට අනුමැතිය ලබාදී මෙම ව්‍යාපෘතිය කිරීම යෝග්‍ය බව ප්‍රසිද්ධ කළේය.

මේ ඔස්සේ ලංකාව ලෝකයාට ණය කරමින් කිසිදු පල ප්‍රයෝජනයක් නැති ව්‍යාපෘතියකට මුල පිරුවාට අමතරව තවත් වැඩිපුර ඩොලර් මිලියන ගණනක් කාගේ කාගේ සාක්කු වලට ගියාදැයි සොයා බැලීම කාලීන අවශ්‍යතාවකි. වැඩි මුදලකට ඇස්තමේන්තු කළ මෙම ව්‍යාපෘතිය ඔස්සේ සිදුවන මුදල් මංකොල්ලය දුටු එවක සිටි වාර්මාර්ග අමාත්‍යාංශ ලේකම් ඒ .ඩී .එස් . ගුණවර්ධන මහතා රැකියාවට ආයුබෝවන් කීවේ ඉල්ලා අස්වීමේ ලිපිය ජනපතිවරයා වෙත යොමු කරමිනි. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුදලට වඩා වැඩි මුදලක් කොමිස් වශයෙන් පසුගිය රජයේ ප්‍රබලයින්ට ලැබී තිබෙන බවට එල්ල වන චෝදනා පහසුවෙන් බැහැර කළ නොහැකි ය. ඉරාන අපනයන සංවර්ධන බැංකුව වසර 20 කින් ගෙවා දැමීම සඳහා මෙම ණය මුදල ලබා දුන්නේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කිසිදු තාක්ෂණික ඇගයීමකින් තොරව ය. මෙවැනි බැංකුවලින් මහින්ද රාජපක්ෂ රජය දැවැන්ත ලෙස ණය මුදල් ලබා ගත්බව රටම දන්නා කරුණකි. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු ලෙස ක්‍රියාකරන ඉරානයේ ෆරාබ් සමාගම ව්‍යාපෘතිය නිම කිරීමට සැළසුම් කර තිබුණේ වසර පහක් ඇතුළත ය. පළමු සැළැසුමට අනුව ඒ සඳහා වැය වන සම්පූර්ණ මුදල රුපියල් මිලියන 76,316 කි. ඉන් ලංකා රජය දරන වියදම රුපියල් මිලියන 24600 කි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා රුපියල් මිලියන 60,842 ක් වැය වෙතැයි ගණන් බලා තිබිණි. ඉන් 85% ක් ඉරාන අපනයන සංවර්ධන බැංකුවද ඉතිරි 15% ක කොටස ශ්‍රී ලංකා ආණ්ඩුව ද දැරිය යුතුය. මීට අමතරව ඉඩම් අත්පත් කර ගැනීම, ජනතාව නැවත පදිංචි කිරීම, පරිසර සංරක්ෂණය, වාරිමාර්ග ප්‍රතිසංස්කරණය, ව්‍යාපෘති කළමනාකරණය හා උපදේශනය සඳහා වැයවන රුපියල් මිලියන 1475 ක මුදල ලංකා රජයෙන් දැරිය යුතුව තිබිණි. ව්‍යාපෘති කාලය තුළ ඒ යටතේ සිදු කෙරුණු ඉඩම් අත්පත් කරගැනීම් කටයුතු හා නැවත පදිංචි කිරීම් කටයුතු ඉතාම අක්‍රමවත්වීමට ප්‍රධාන හේතුවක් වූයේ රජයට එතරම් විශාල මුදලක් දැරීමේ හැකියාවක් නොතිබීම ය. ණය ආධාර ලබා දුන් ඉරාන ආසියා සංවර්ධන බැංකුවේ අරමුණ වූයේ ඉදිකිරීම් කටයුතු සඳහා ලබාදෙන ණය ආධාර මුදල නැවත ඉරානයටම ලබා ගැනීමය. ඒ සඳහා කොන්ත්‍රාත්කරු ලෙස ඉරානයේ ෆාරාබ් සමාගම නම් කළ අතර ණය මුදල් වැඩි කොටසක් එම සමාගම හරහා ඉරානයට නැවත ලබා ගැනීම සිදුවිය. ඊට අමතරව වසර 20ක් ඇතුළත ණය මුදලද ගෙවා නිම කළ යුතු විය. ඒ අනුව ඉරාණයට මෙම ව්‍යාපෘතිය සඳහ වෙන් කළ අති දැවන්ත මුදලෙන් වැඩි කොටසක් ලංකාවෙන් නැවත ගලා යන්නේ ඉරානයට ය. කොන්ත්‍රාත්තරු ව්‍යාපෘතිය යටතේ අවතැන් වන ජනතාවට වන්දි ගෙවීමට හෝ පරිසරය ආරක්ෂා කිරීමට මුදල් ලබා දීමට එකඟ නොවූයේ එම මුදල් ඍජුව ම නැවත වරක් ඉරානයට නොලැබෙන නිසා ය.

මේ ආකාර අර්බුද ගණනාවකින් පෝෂණය වූ උමා ඔය ව්‍යාපෘතිය නිසා තාමත් බැටකන ප්‍රදේශවාසීන් දහස් ගණනක් සිටිති. මේ කරුණු සියල්ල ගොනු කිරීම ඔස්සේ උමා ඔය ව්‍යාපෘතියෙන් පෝෂණය වූයේ කවුද යන්න සම්බන්ධයෙන් නිශ්චිත නිගමනයකය ඒම අපහසු නොවන්නේ ය. ජනතා මුදල් කාබසිනියා කරමින් සොබාදහමට විරුද්ධව දියත් වූ මෙම ව්‍යාපෘතියට විරුද්ධව විශාල ජනමතයක් ගොඩ නැගුණි. එම ජනතා හඬ යටපත් කරන්නට ද ව්‍යාපෘතියේ මුදල් යහමින් වැය කළ බව ප්‍රසිද්ධ රහසකි. ඇතැම් රාජ්‍ය නිලධාරීන් ව්‍යාපෘති කාර්යාල පිහිටුවීම සඳහා රුපියල් ලක්ෂ ගණනක මාසික කුලියට පෞද්ගලික ව්‍යාපාරිකයින් ගෙන් ගොඩනැගිලි ලබා ගත්තේ තනි කැමැත්ත මත ය. එම ගොඩනැගිලි හිමිකරුවන්ගේ ඉඩම් වල මේ වනවිට තම පෞද්ගලික නිවාස ඉදිකර ගෙන සිටින රාජ්‍ය නිලධාරීන්ට ජනතාව ඇඟිල්ල දිගු කරන්නේ මීයක් කඩන්නේ අත ලෙව කෑමට නොවේය යන උපමාව ද සිහිපත් කරමිනි.

උමාඔය බහුකාර්ය ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථම පරිසර විශේෂඥයින් හා පරිසරවේදීන් කණ්ඩායමක් එහි ගොස් ව්‍යාපෘතිය තුළින් සිදුවිය හැකි ව්‍යසනය සම්බන්ධව ජනතාව දැනුවත් කරනු ලැබුවත් මුල දී ඒ සඳහා වැඩි ජනතා අවධානයක් යොමු නොවිණි. කෙසේ වුවත් ව්‍යාපෘතියට අදාළ ප්‍රධාන උමග වන අලුතින් ඉදිකළ මාතැටිල්ල ජලාශයේ සිට කරඳගොල්ල භූගත විදුලි බලාගාරය දක්වා සකස් කරන කිලෝ මීටර් 15.15 ක් දිග උමග කැණීමේ දී කලින් පෙන්වා දුන් ව්‍යසනයේ තරම අත්විදින්නට ජනතාවට සිදුවූයේ පරිසර විශේෂඥයින් හා පරිසරවේදීන් පෙන්වා දුන් තරමට ද වඩා දෙතුන් ගුණයක් වැඩියෙනි. ප්‍රධාන උමගට අමතරව උමා ඔයේ අතු ගංගා දෙකක අලුතින් ඉදි කෙරුණු පුහුල්පොල ජලාෂයේ සිට මහතැටිල්ල ජලාශය දක්වා ගෙන යන උමග කිලෝ මීටර් 3.9 දිගකින් යුක්ත ය. එහි කැනීම් හේතුවෙන් ද ගම්මාන ගණනාවක නිවාස ඉරිතලා ගියේය.

මේ නිසා බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වලට අයත් බණ්ඩාරවෙල,වැලිමඩ,හාලි ඇළ,ඇල්ල වැල්ලවාය,ඌව පරණගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල පවුල් 7450 ක පමණ බලපෑමට ලක්විය. භූගත උමං මාර්ගය කැණීමේ දී සිදුවූ ජල කාන්දුව හේතුවෙන් ප්‍රදේශයේ ළිං හා ජල මූලාශ්‍ර සම්පූර්ණයෙන්ම සිඳී ගියේ ගොවිතැනින් ජීවිකාව ගෙන ගිය ජනතාව කබලෙන් ලිපට ඇද දමමිනි. මෙරට උපදින්නට සිටින දරුවන් පවා ලෝකයට ණය කාරයින් කරමින් විදේශ ණය ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතරින් අන්ත දූෂිතම ව්‍යාපෘතිය උමාඔය බවට චෝදනා කරන්නට ඕනෑ තරම් හේතු තිබේ. ව්‍යාපෘතිය සඳහා සකස් කළ පරිසර ඇගයීම් වාර්තාව මගින් මෙම පරිසර බලපෑම සම්බන්ධව කිසිදු හඳුනා ගැනීමක් සිදුව නොමැති අතර එය දේශපාලන අවශ්‍යතා මත ලියවුණු හුදු ලියවිල්ලක් විනා නියම තක්සේරු වර්තාවක් නොවන බවට කියන්නට තවත් අටුවා ටීකා ටිප්පනි අවශ්‍යය නොවන්නේ ය. රාජපක්ෂවරුන් මූලික වී තම දේශපාලන බලය ගොඩ නැගීම පිණිස හම්බන්තොට කේන්ද්‍ර කර ගනිමින් ක්‍රියාත්මක කළ ඊනියා සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍යය ජලය ඌවේ සිට හම්බන්තොටට ගෙන යෑම මෙම ව්‍යාපෘතියේ එක් ප්‍රධාන අරමුණක් විය. මධ්‍යම පරිසර අධිකාරිය දේශපාලන රූකඩයක් බවට පත්ව පාරිසරික පනත උල්ලංඝනය කරමින් නීති විරෝධී ලෙස පරිසර ඇගයීම් වාර්තාවක් සඳහා අනුමැතිය ලබාදීමේ ප්‍රතිපල ඌවේ අහිංසක ජනතාව අත්විඳිමින් සිටිය දී ව්‍යාපෘතියට අනුමැතිය දුන් හා එය ක්‍රියාත්මක කිරීමට උර දී කටයුතු කළ බොහෝ දෙනෙකු පෙරට වඩා සැපවත් ජීවිත ගත කිරීම පැහැදිලිව දක්නට ලැබෙන තත්ත්වයකි.

ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ප්‍රදානය කිරීමට සැළසුම් කර තිබුණ ද දුර්වල පරිසර ඇගයීම් වාර්තාවේ තරම පෙන්වා දෙමින් නිවාස ගිලා බැසීම,ජල මූලාශ්‍ර සිඳියාම, ගොවිබිම් අස්ථාවර වීම ඇතුළු ගැටලු රැසක් පැන නැගී ජනතාව පීඩාවට පත්වෙත් දී එම ගැටලු ආශිර්වාදයක් කර ගනිමින් හිටි හැටියේ පොහොසතුන් වූ පිරිසක් ද වූහ. ඔවුන් බොහෝ දෙනෙකු උමාඔය ව්‍යාපෘතිය සමඟ ඍජුව හෝ වක්‍රව බැඳී සිටි අය යි. නිවාස වලට හානි වීමේ දී ඒවාට වන්දි ගෙවීමට මුදල් වෙන් විය. ජල මූලාශ්‍ර සිඳී යාමේ දී ට්‍රැක්ටර් හා බවුසර් මගින් ජනතාවට ජලය බෙදා හැරීමෙ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ අතර ඒ සඳහා ද මුදල් වෙන් වූයේ රුපියල් කෝටි ගණනිනි. පොළොව අස්ථාවර වීම හා ජලය නොමැති වීම නිසා කෘෂිකාර්මික ඉඩම් මුඩු බිම් බවට පත්වෙත් දී ඒවාට වන්දි ගෙවීමේ ක්‍රියාවලියක් ද දියත් විය. මේ සියල්ල සඳහා වෙන් කළ මුදල් වැයකර තිබෙන්නේ කිසිදු විනිවිද භාවයක් නොමැතිව ය. නිවාස හානි තක්සේරු කිරීමේ දී පූර්ණ හානි,අර්ධ හානි හා සුළු හානි ලෙස වර්ගකර මුදල් ගෙවීම් සිදුකර තිබේ. පූර්ණ හානි සිදුවූ බවට නිගමනය කළ නිවාස වල හිමිකරුවන්ට වන්දි මුදලක් සමඟ ඉඩම් ලබා දීමට පියවර ගෙන ඇත. හානි තක්සේරු කිරීමේ දී හිතවත්කම මත වන්දි මුදල තීරණය වී තිබෙන බව පැහැදිලි කරන්නට ප්‍රදේශයෙන් සාක්කි ඕනෑවටත් වඩා සොයා ගැනීමට පුළුවන.

ජීවිත කාලය පුරා ඉතිරි කරගත් මුදල ට බැංකු ණයක් මගින් ලබාගත් මුදල් ද යොදවා රුපියල් ලක්ෂ 80 ක් පමණ වැයකරමින් ඉදිකළ දෙමහල් නිවසේ පදිංචි වී වසරක් යන්නට මත්තෙන් පොළොව ගිලා බැස ජීවිතයේ සිහින සියල්ල බොඳව මහපාරට වැටුණු නිමාලි මුණසිංහ මහත්මිය උමාඔය තම පවුලට ගෙනා විපත මෙසේ සිහිපත් කළාය...උමාඔය ව්‍යාපෘතියේ උමං මාර්ගයෙ කැණීම් ආරම්භ කරනකොටම අපේ අපේ ගෙදර බිත්ති පුපුරලා ඇත් වෙන්න පටන් ගත්තා. පොළොවට අල්ලලා තිබුණු ටයිල් පුපුරලා ඇඟල් තුනක් විතර ඇත් වුණා. ව්‍යාපෘතියේ නිලධාරීන් සමඟ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් ඇවිත් රුපියල් 15000 ක් මාසෙකට දෙන්නම් කියලා ගෙයක් කුලියට අරන් යන්න කිව්වා. අවුරුදු තුනක් කුලී නිවසක ඉඳලා අපි ආයෙත් අපේ ගෙදරට ආවා. එම නිවස පූර්ණ හානි ලෙස වර්ගීකරණය කර නිවැසියන් ට වන්දි ලබා දී තිබේ. එපමනක් නොව ඔවුන්ට පදිංචිය සඳහා නිවසක් ගොඩ නගා ගැනීමට ඉඩමක් ද ලබා දී ඇත. එසේ වුවත් පදිංචියට සුදුසු නැති බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් තහවුරු කළ නිවසේ අවුරුදු 12 ක හා 14 ක දරුවන් දෙදෙනා ද සමඟ යළිත් පදිංචි වන්නට නිමාලි තීරණය කර තිබේ. ඊට හේතු දක්වමින් ඇය පැවසුවේ මෙවන් කතාවකි. කුලී නිවසකට යන්න කියලා කිව්වට අපිට සල්ලි ගෙව්වේ අවුරුදු දෙකහාමාරකට විතරයි. අපි අවුරුදු තුනක් කුලී නිවසේ හිටියා. අන්තිම මාස හයේ සල්ලි නොදුන් නිසා අතින් ඒ මුදල් ගෙවලා ආපහු මේ ගෙදර පදිංචියට ආවා. උමාඔය ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකට, බණ්ඩාරවෙල දිස්ත්‍රික් ලේකම්ට අපි ලිඛිතව දැනුම් දුන්නා කුලී නිවාසයට මුදල් නොදෙන නිසා පදිංචියට සුදුසු නැති බවට නිර්දේශ කර තිබෙන නිවසේ පදිංචියට අපි යනවා, අපිට මොනවා හරි අනතුරක් වුණොත් වගකීම ඔබලා බාර ගන්න කියලා. ඒකටත් කිසිම ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඊට පස්සේ දරු දෙන්නත් අරන් මේ නිවසේ පදිංචියට ආවා. 2017 අපි මේ ගෙදරින් යනකොට දරුවෝ ගොඩක් පොඩියි. මේ ගෙදරට ලක්ෂ 40 ක වන්දියක් ලැබුණේ. මේ මුදල ප්‍රමාණවත් නැහැ කියලා අපි අභියාචනා ඉදිරිපත් කළා. දෙවැනි තක්සේරුවට ඇවිත් අපි ගෙදර නැහැ කියලා එහා ගෙදර අයගෙන් අත්සනක් දාගෙන ගිහින්. මුල ඉඳලම වංචාව තමයි මේ අය කළේ. ගෙට ඇවිත් බලලා තක්සේරු කළේ නැහැ. ලක්ෂ 40 කින් මේ වගේ ගෙයක් හදනවා තියා හිතන්නවත් බැහැ. මුල ඉඳලම රජයේ නිලධාරීන් වගකීමෙන් වැඩ කළේ නැහැ. මැටි වලින් කපරාරු කරලා තිබුණු ගෙවල් වලට ලක්ෂ 45 ක් 50 ක් වන්දි ගෙවලා තියෙනවා. කිසිම හානියක් නැති ගෙවල් වලට ලක්ෂ 70 ක් ගෙවපු අවස්ථා තිබෙනවා. දේශපාලන හිතවත්කම් මත වන්දි තීරණය කළා. වන්දි මුදල ලබා දුන්නේ 2018 දී. ඉඩම දුන්නේ 2022 දී. වන්දි

මුදල දුන්න කාලෙම ඉඩම දුන්නා නම් ගෙයක් හදා ගන්න තිබුණා. දැන් බඩු වල වියදම් එක්ක දුන්න වන්දි මුදලින් ෆවුන්ඩේෂන් එක දාලා බිත්ති නගගන්වත් බැහැ. සැළසුමක් අනුව ගොඩනගා ගත්ත අපේ ජීවිත මේ ව්‍යාපෘතිය නිසා අවුල් වුණා. වන්දි ගෙවීමේ දී සිදුවුණ අඩුපාඩු නිසා ජීවිත විනාශ වුණා.

ව්‍යාපෘතියේ බලපෑම හේතුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ පමණක් ළිං 3000 කට ආසන්න සංඛ්‍යාවක් සිඳී ගොස් ඇත.ජල මූලාශ්‍ර සිඳී යැමෙන් ඒවා මත පදනම්ව වගා කළ අක්කර 2200 ක පමණ කෘෂිකාර්මික කටයුතු මුළුමනින්ම ඇන හිටීමෙන් ගොවි ජනතාව පත්ව සිටින්නේ දැඩි අසීරුතාවකට ය. ළිං සිඳී යැමෙන් බලපෑමට ලක්වූ පවුල් 4500 ක් සඳහා ජලය ගබඩා කිරීම පිණිස ජල ටැංකි ලබාදීමේ ව්‍යාපෘතියක් කඩිනමින් ක්‍රියාවට නන්වා තිබේ. ඒවාට ජලය පුරවා ගැනීම පිණිස බවුසර් 57 ක් හා ට්‍රැක්ටර් යොදවා දෛනිකව ජලය බෙදා හැරේ. මේ වනවිට සිඳීගිය ළිං 2000 කට ආසන්න සංඛ්‍යාවක් යළි ජලයෙන් පිරී ගිය ද බවුසර් හා ට්‍රැක්ටර් මගින් ජලය බෙදා හැරීමේ ක්‍රියාවලිය අඛන්ඩව සිදුවෙමින් පවතී. මෙම ජල බවුසර් හා ට්‍රැක්ටර් බොහොමයක් කුලී පදනම මත ලබාගෙන ඇත්තේ දේශපාලන සම්බන්ධතා හා ව්‍යාපෘතිය භාර නිලධාරීන්ගේ හිතමිත්‍රකම් පදනම් කර ගෙනය. ඇතැම් දේශපාලනඥයින් හා ව්‍යාපෘතිය භාර නිලධාරීන් පවුලේ වෙනත් අයගේ නමින් ව්‍යාපෘතිය සඳහා ජල බවුසර් හා ට්‍රැක්ටර් යොදවා තිබෙන බවට ජනතාව චෝදනා කරති. ජලය බෙදා හැරීමේ අවශ්‍යතාවක් නොමැති ප්‍රදේශ වලට පවා ජල බවුසර් හා ට්‍රැක්ටර් ගමන් කරන්නේ ඒවා හි හිමිකරුවන් ගේ සාක්කු වලට යහමින් මුදල් වැටෙත් දී ජනතා මුදල් තව තවත් අපතේ යවමින් රටේ ණය බර තවත් ඉහළට ගෙන යමිනි. වගා හානි වූ ගොවි පවුල් 642 ක් සඳහා ගෙවාතිබෙන වන්දි මුදල රුපියල් මිලියන 267 කි. හානි වූ එක් කන්නයකට පමණක් මෙම වන්දි මුදල් ගෙවීම සිදුකර තිබේ. කිසිදු මුදලක් වන්දි ලෙස නොලැබුණු ගොවීන් ද සිටිති. නිවාස හානි වූ පවුල් සඳහා වන්දි ගෙවීමේ දී කිසිදු පැහැදිලි නිර්ණායකයක් දක්නට නොලැබෙන අතර වන්දි මුදල බොහෝ අවස්ථාවල තීරණය වී ඇත්තේ දේශපාලන සබඳතා හා නිලධාරී සබඳතා මතය. ව්‍යාපෘතියට එරෙහිව හඬ නැගූ පිරිසට ද සැලකිය යුතු වන්දියක් ලබා දීමට බලධාරීන් කටයුතු කර තිබෙන්නේ ඔවුන් නිහඬ කිරීමේ උපක්‍රමයක් ලෙසිනි.

උමා ඔය ව්‍යාපෘතිය හේතුවෙන් සිදුවූ බලපෑම හමුවේ උමා ඔය සුරැකීමේ ජාතික ව්‍යාපාරය නමින් ව්‍යාපාරයක් බිහිවිය. එහි සාමාජිකයෙකු වූ ලලිත් විජේසිංහ ව්‍යාපෘතියේ ආරම්භය හා විකාශනය සම්බන්ධයෙන් මෙසේ අදහස් දැක්වීය. මේ ව්‍යාපෘතියේ බලපෑම මුලින්ම පෙන්නුම් කරමින් 2014 වසරේ දෙසැම්බර් 27 දින මකුල්ඇල්ල පාසලේ ගොඩනැගිල්ලක පිපිරුමක් ඇති වුණා. කරඳගොල්ලේ ඉඳන් උමං මාර්ගය ඒ වනවිට කිලෝ මීටර් පහක දුරක් පැමිණ තිබුණා. එදා ඉඳලා දවසින් දවස නිවාස හානි වාර්තා වෙන්න ගත්තා. උමගේ තත්ත්පරයකට ලීටර් 2500 ක් විතර කාන්දු වෙන්න ගත් දී ප්‍රශ්නය උග්‍ර අතට පත් වුණා. 2017 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 ක ජනතාව එකතු වෙලා දැවැන්ත උද්ඝෝෂණයක් කළා. මේ ව්‍යාපෘතියේ 14% ක් විතර අවසන් කරනකොට තමයි මහින්ද රාජපක්ෂ පරාජය වී ජනපති ධූරයට මෛත්‍රිපාල සිරිසේන පත් වුණේ. විපක්ෂයේ සිටිය දී ජනතාව එක්ක එකතු වෙලා මේකට විරෝධය දැක්වූ හරීන් ප්‍රනාන්දු මන්ත්‍රීවරයා යහ පාලන ආණ්ඩුව යටතේ ව්‍යාපෘතියට පක්ෂව කතා කළා. මේ වගේ දෙබිඩි පිළිවෙත් දේශපාලනඥයින් අනුගමනය කළා. ඒ කාලයේ චාමර සම්පත් ඌවේ මහ ඇමැති ලෙස කටයුතු කරමින් ජනතාව ගේ ප්‍රශ්න වලට යම් යම් විසඳුම් දෙන්න උත්සහා ගත්තා.. ව්‍යාපෘතියට අදාළව මාර්ග කාපට් කරනකොට මහ ඇමැතිවරයා ගේ හෝටලයට යන පාරත් කාපට් කළා. වන්දි මුදල් ගෙවීමේ දී බරපතල අක්‍රමිකතා තිබුණා. නිවාස වලට හානි වී ආදායම් මාර්ග අවහිර වී ප්‍රශ්න මැද්දේ ඉද්දී අපි ඉක්මන් විසඳුම් දෙන්න කියලා ව්‍යාපෘතියේ නිලධාරීන්ට බලපෑම් කළා. ඒ වෙලාවෙම ව්‍යාපෘති අධ්‍යක්ෂ ආචාර්ය සුනිල් සිල්වා හා දිස්ත්‍රික් ලේකම් නිමල් අබේසිංහ සාකච්ඡා කරලා රුපියල් 6000 ක් විතර වටින වියළි ආහාර මල්ලක් සෑම පවුලකටම දුන්නා. මෙහෙම හිතෙන හිතෙන වෙලාවට තීරණ අරන් එක පාරටම රුපියල් කෝටි ගණන් වැය කරන්න පුළුවන්ද ?. ව්‍යාපෘතියේ මුදල් බරපතල ලෙස අවභාවිත වූ බවට සැක උපදින කාරනා මේවා. නිවාස වලට හානි වීම නිසා කුලී නිවාස වලට ගිය අයට අදාළ කුලී මුදල් නොදෙන බව පවසමින් දවසක් බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැටලුවා. පැයක් යන්න මත්තෙන් චෙක් ටිය දුන්නා. ළිං හිඳිලා ජනතාවට වතුර නැහැ කියලා මහ ඇමැති චාමර සම්පත්ව හමුවුණා. ඒ වෙලාවෙම ජල ව්‍යාපෘතියක් සඳහා ලක්ෂ 12 ක් පාස් කළා. මේවා ක්ෂණිකව කොහොමද කරන්නේ. මේවා ගැන අපි දෙපාරක් හිතන්න ඕන.

# හම්බන්තොට වරාය ගිලගත්

## චීන ණය උගුල

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි

"අපි පරම්පරාවෙන් ධීවරයෝ මගේ තාත්තා කළෙත් ධීවර රස්සාව තමයි. ඒ දවස්වල අපේ ධීවර වරාය තිබුණ තැන තමයි දැන් අලුත් වරාය හදලා තියෙන්නේ. අපේ ධීවර වරායේ බෝට්ටු සුනාමියටත් අහුවුණා. අපි ජීවිත බේරාගත්තේ බොහොම අමාරුවෙන්. නමුත් හම්බන්තොට වරාය හදන්න ගත්ත දවසේ ඉඳලා අපිට අපේ රස්සාව නැති වුණා. වරාය අධිකාරියෙන් අපිට සුළු වන්දි මුදලකුත් දීලා අපිට රස්සාවකුත් දෙනවයි කිවුවා. නමුත් අද වෙනකන් අපිට රස්සාවල් දුන්නේ නෑ. ඒ ඔක්කොම වුණේ දේශපාලන හයියට. ඒ නිසා තමයි මම පාර අයිනේ ඉඳන් ලුණු පැකට් ඉරිඟු කරලක් විකුණන්න ගත්තේ. ඒකත් පසුගිය කාලය තුල හම්බන්තොටට කවුරු හරි රජ්‍ය නායකයෙක් එනකොට අපිව පාරෙන් අයින් කරනවා. වෙලාවකට හිතෙනවා අපි සුනාමියට ගහගෙන ගියානම් හොඳයි කියලා".

හම්බන්තොට මිරිජ්ජවිල මාර්ගය අයිනේ තබාගෙන ලුණු පැකට් විකුණමින් තම දරුපවුල රැකගන්න උත්සහ කරන එල්.බී.ප්‍රියන්ත මහතා එසේ පැවසීය. තමන් හට අවැසිව තිබු භූමියක් චීන ජාතිකයින් පරම්පරා ගණනාවකට අයිති කරගෙන සිටිනු දැකීම සම්බන්ධයෙන් පියන්ත මහතා තුල ඇත්තේ කම්පනයකි. "දැන් මේ භූමිය අපිටත් නෑ රටටත් නෑ සිදුවුණේ රට ණය වුණ එක විතරයි".



අමෙරිකානු ඩොලර් මිලියන 794ක ආයෝජනයකින් ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘතිය සහ එය ක්‍රියාත්මක කිරීමේ අක්‍රමිකතා සාකච්ඡාවට හා විශ්ලේෂණවලට මේ වන විට ලක්ව තිබේ.

පසුගිය ශ්‍රී ලංකා රජය විසින් 2017 වසරේදී චීනය සමඟ අත්සන් කරන ලද හම්බන්තොට වරාය බදු ගිවිසුම, එහි ලාභදායිත්වය සහ එය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ අක්‍රමිකතා පිළිබඳව කනස්සල්ලට පත් වූ අතර එය විවාදයට ද තුඩු දී තිබේ. මෙම ගිවිසුම මගින් චීනයට හම්බන්තොට වරාය සඳහා පාලන කොටස් සහ 99 වසරක බද්දක් ලබා දෙන ලදී.

හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ ආර්ථික තාර්කිකත්වය සහ විභව ප්‍රතිලාභ පිළිබඳව විවිධ ඉදිරි දර්ශන පවතී. ඇතැමුන් තර්ක කරන්නේ කොළඹ වරායේ පවතින ධාරිතාව සහ ව්‍යාපෘති සැලසුම් සලකා බැලීමේදී වරාය සඳහා වන ආර්ථික සාධාරණීකරණය දුර්වල බවයි. එය චීන නාවික පහසුකමක් බවට පත්විය හැකි බව කනස්සල්ලට හේතු වී තිබේ. එමෙන්ම ඇතෙමෙක් පවසන්නේ හම්බන්තොට වරායේ උපායමාර්ගික පිහිටීම, ව්‍යාපාරික අවස්ථා වර්ධනය කිරීමේ හැකියාව සහ ඉන්දියාවට සමුද්‍ර දොරටුවක් ලෙස පිහිටි හම්බන්තොට වරායට චීන ඇස ගැටුණු බවයි.

විශේෂයෙන්ම 'හම්බන්තොට වරාය බදු ගිවිසුම' චීනයේ ඊනියා ණය-උගුල් රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ උදාහරණයක් ලෙස නිතර සඳහන් වන කරුණකි. මේ ආකාරයෙන් 2017 දී අත්සන් කරන ලද 99 වසරක ගිවිසුම මගින් වරායේ වාණිජ සහ ආරක්ෂක මෙහෙයුම් අධීක්ෂණය කිරීම සඳහා හවුල් ව්‍යාපාර සමාගම් පිහිටුවීමට ද කටයුතු යොදා තිබේ.

## බලාපොරොත්තුවේ බලකොටුව

මහින්ද රාජපක්ෂ පාලන සමය තුළදී දැවැන්ත සංවර්ධනයක් සිදුකරමින් එකල රටේ දුප්පත්ම දිස්ත්‍රික්කවලින් එකක් වූ හම්බන්තොට දිස්ත්‍රික්කය බලාපොරොත්තුවේ බලකොටුවක් ලෙස පෙන්වමින් දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති රැසක් එහි සිදුකරන ලදී. එහි මුල් බැසගත් ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස හම්බන්තොට වරාය පෙන්වා දිය හැකිය. සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකය චීනයේ ණයගැතියෙකු බවට පත් කිරීමට තරම් හම්බන්තොට වරාය ප්‍රබල වී තිබේ.

ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ බොහෝ ආන්දෝලනයක් ඇතිව ඉදිකරන ලද අසාර්ථක වූ හම්බන්තොට වරාය පිටුපස ඇති ව්‍යාකූල කතාව, අසල්වැසි සංවර්ධනය වෙමින් පවතින ජාතීන් කෙරෙහි චීනයේ මූල්‍ය හා දේශපාලන බලපෑම් බලහත්කාරයෙන් භාවිත කිරීමෙන් ඇති වන අන්තරායන් පිළිබඳ පැහැදිලි උදාහරණයක් බවට පත්ව ඇත.





රටේ දුප්පත්ම කලාපයක් වෙත ගෙන එන ලද වෙළඳාම, නව රැකියා සහ ධනය පිළිබඳ අපේක්ෂාවන් මෙන්ම පොරොන්දු, වරායේ අවසාන අභාවය තරම්ම විශ්මය ජනක විය. හම්බන්තොට කොතරම් නරක අතට හැරුණා ද යත්, බොහෝ දුරට දිනපතා එය පසුකර යන නැව් දහස් ගණනක් විසින් හම්බන්තොට වරාය මඟ හරින ලදී. එබැවින් ආයෝජනයක් නොමැති වරාය තුළින් සිදුකිරීමට හැකිවූයේ චීනයට ඇති ණය නොගෙවීමයි. අවසානයේ එම ණය ගෙවීම ද පැහැර හරින ලදී. එහි බරපතලම කනගාටුදායක දෙය නම්, පසුව වරායේ අයිතිය ණය මත 80%ක් චීනයටම පැවරීම හැර ශ්‍රී ලංකා රජයට වෙනත් විකල්පයක් නොවීමයි.

හම්බන්තොට වරාය දශක තුනක කාලයක් තුළ විවිධ අනතුරු සහගත ආර්ථික තත්වයකට ගොදුරක් විය හැකි බවට විශේෂඥයින් විසින් පෙන්වා දෙනු ලැබිය. ඒ අනුව සිදු කෙරුණු බහු ශක්‍යතා අධ්‍යයනවලින් පෙන්නුම් කරන්නේ, එය ව්‍යාප්ත කිරීම සඳහා ඕනෑ තරම් විභවයක් ඇති ශ්‍රී ලංකාවේ විශාලතම කොළඹ වරාය සමඟ තරඟ කළ නොහැකි බවයි.

එසේ වුව ද, අනතුරු ඇඟවීම් නොසලකා හරින ලද අතර, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ නිජ භූමිය සහ ප්‍රධාන දේශපාලන පදනම පුනර්ජීවනය කිරීමේ, කලාපයේ බලය ලබා ගැනීමේ, චීනයේ අවස්ථාවාදී උපාය මාර්ගවල එකතුවකට ස්තුතිවන්ත වන්නට වරාය නිර්මාණය විය. ඒ සම්බන්ධයෙන් නිව්යෝර්ක් ටයිම්ස් විමර්ශනයකින් හෙළි දරව්කර තිබූ අතර එහිදී දක්වා තිබුණේ ව්‍යාපෘතියේ ආරම්භයේ සිටම බොහෝ රහසිගත ගනුදෙනු සිදු වූ බවයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියට (SLPA) අනුව එම කාලයේදී (2017 පෙර ) වරායේ කාර්ය සාධනය පහත වැටීමට හේතු වී ඇත්තේ වාහන ප්‍රතිනැව්ගත කිරීමේ ගෝලීය මන්දගාමීත්වයයි.

## උසස් බලාපොරොත්තු

හම්බන්තොට වරායක් පිළිබඳ අදහස දශක තුනක පමණ කාලයක සිට පාවී ගිය නමුත් 2005 දී රාජපක්ෂ ජනාධිපතිවරයා ලෙස තේරී පත් වූ වහාම, ජාත්‍යන්තර ගුවන් තොටුපළක්, නව නගරයක්, සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක් සහ අධිවේගී මාර්ග දිගුවක් වැනි යටිතල පහසුකම් මුල පිරීම් සමඟ ව්‍යාපෘතිය කෙරෙහි නව උනන්දුවක් ඇති විය.

හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියර ඉදිකරන ලද්දේ චීනයේ අපනයන (එක්සිම් බැංකුව) ආනයන බැංකුව වෙතින් 6.3% පොලියට ඩොලර් මිලියන 307ක ණයක් මගිනි. ship-technology.com වෙබ් අඩවිය මගින් 2018. සැප්තැම්බර් 18 දින පල කළ වාර්තාවකට අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරිය පවසා සිටින්නේ අරමුදල් සම්බන්ධයෙන් ඉල්ලීමක් කළ විට වරාය හැදීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම ප්‍රතිචාර දැක්වූයේ චීනය බවයි..

Asia Maritime Transparency Initiative සඳහන් කරන පරිදි, "කොළඹ වරායේ පවතින ධාරිතාව සහ ව්‍යාප්ති සැලසුම් අනුව, හම්බන්තොට වරායෙන් ලැබිය හැකි ආර්ථික ප්‍රතිලාභ එතරම් සාර්ථක නොමැත. ඒ අනුව එය චීන නාවික පහසුකමක් බවට පත් විය හැකි ප්‍රවණතාවය ද ඉහල ගොස් තිබේ.

## "හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ පළමු අදියර ඉදිකරන ලද්දේ චීනයේ අපනයන ආනයන බැංකුවෙන් ඩොලර් මිලියන 307 ක ණයක් මගිනි"

WikiLeaks වෙබ් අඩවියට අනුව සෑම වසරකම ශ්‍රී ලංකාවේ දකුණු කෙළවර පසුකර යන නැව් 70,000/ 80,000කින් සැලකිය යුතු ව්‍යාපාරයක් ලබා ගැනීමට SLPA බලාපොරොත්තු වේ. එනිසා සෑම වසරකම අමතර යාත්‍රා 10,000ක් දක්වා ආකර්ෂණය කර ගැනීමට ශ්‍රී ලංකා වරාය අධිකාරිය බලාපොරොත්තු වූ අතර, එයින් සැලකිය යුතු කොටසක් හම්බන්තොට වරායට සේවා ලබා ගැනීම වෙනුවෙන් පැමිණෙනු ඇතැයි අපේක්ෂා කර තිබේ. නමුත් ඒ සියල්ලම පලදායි බලාපොරොත්තු නොවිය.

### රැකියා අහිමි වීම

හම්බන්තොට වාරය ආරම්භ කිරීමට මත්තෙන් වක්‍ර රැකියා අවස්ථා 50,000කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය වනු ඇති බවට ශ්‍රී ලංකා වරාය අධිකාරිය පොරොන්දු වූ අතර, එයින් අදහස් වන්නේ වසර කිහිපයකින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඒක පුද්ගල ආදායම බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක හා සමාන වනු ඇතැයි අපේක්ෂා කරන බවයි. එමෙන්ම ලංකාවේ විශාලතම ව්‍යාපෘතියක් බවට පත්වනවා සේම ඒ ඔස්සේ ශ්‍රී ලංකාවම මධ්‍යම ආදායම් ලබන ආර්ථිකයක් දක්වා එසවීමට මෙම ව්‍යාපෘතිය මගින් හැකිවන බවට ද පෙන්වා දෙන ලදී.

එය එසේ වුවත් හම්බන්තොට වරාය චීනයට බදු පදනම මත ලබාදීමට මත්තෙන් හම්බන්තොට මාගම්පුර වරායේ, මාගම්පුර වරාය කළමනාකරණ පුද්ගලික සමාගම යටතේ සේවය කළ සේවකයින් 435 දෙනා හට 2017 වසරේ නොවැම්බර් 30 වන දා සිට වරාය පරිශ්‍රයට ඇතුළු නොවන ලෙස එම සමාගම මගින් දන්වා තිබූ අතර එදින සිට වරාය සේවකයින්ගේ සේවය අහිමි විය.




ඒ ආකාරයෙන් සේවය අහිමිවූ සේවකයින් මාස දෙකකට අසන්න කාලයක් අඛණ්ඩ සත්‍යග්‍රහ, විරෝධතා මෙන්ම මාරාන්තික උපවාසයන් ද පැවැත්වුවත් ඔවුන් හට රැකියා නොලැබුණු අතර එහිදී ද සිදුවූයේ ලංකාවේ දේශපාලනයේ කැපී පෙනෙන දෙයක් වන බොරු පොරොන්දු මත එම සේවකයින් රැවටීම පමණි.




චීනයට බදු දීමෙන් පසු පැමිණෙන ප්‍රථම නෞකාව හම්බන්තොට මාගම්පුර ජාත්‍යන්තර වරාය 2017 දෙසැම්බර් 09වන දා "චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩින්ග් සමාගම" වෙත පවරාදීමෙන් පසු පැමිණි ප්‍රථම වාහන ප්‍රවාහන නෞකාව දෙසැම්බර් 18 සවස 04 ට පමණ හම්බන්තොට මාගම්පුර වරායට සේන්දු විය.



පැනමා සිට පැමිනුණු Pocitivi Pioneer නැමති මෙම නෞකාව ශ්‍රී ලංකාවට වාහන භාරසියයක් පමණ රැගෙන පැමිණ තිබූ අතර ඒ වනවිට සේවකයින් නොසිටි හෙයින් එහි මෙහෙයුම් කටයුතු කරනු ලැබුයේ කලම්බු ලොජෙස්ටික් ආයතනය විසිනි.

කෙසේ නමුත් මෙම වාහන මෙහෙයුම් කටයුතු සඳහා සේවකයින් නොසිටි හෙයින් ඊට දින කීපයකට පෙර ඒ සඳහා අවශ්‍ය සේවකයින් 135 දෙනෙකු බඳවාගෙන ඔවුන් පුහුණු කර තිබෙන බව ද සිදුකළ සොයා බැලීමකදී අනාවරණය විය. 2017 දෙසැම්බර් 18 දින සිට ඔවුන් තාවකාලිකව මාගම්පුර වරායේ මෙහෙයුම් සේවා කටයුතු සිදුකරනු ලැබිය.



මේ අතර තුර නෞකාව මාගම්පුර වරායට සේන්දු වෙමින් තිබියදී, තම දරුවන් වරාය අධිකාරියට බඳවා ගන්නා ලෙස ඉල්ලමින් වරාය සේවකයින්ගේ දෙමාපියන් විසින් පවත්වනු ලබන සත්‍යග්‍රහයට, එම ස්ථානයේ දෙමාපියන්හට සහයෝගය දක්වමින් රැඳී සිටි මාගම්පුර වරායේ හිටපු සේවකයින්, සත්‍යග්‍රහයේ යෙදී සිටි දෙමාපියන් සමග එක්ව තමන්හට වූ අසාධාරණය දෙවියන්හට කන්නලවු කරමින් වරාය ප්‍රධාන පිවිසුම් දොරටුව අභියස පොල් ගසමින් විරෝධය එල්ලකරන ලදී.

## සමතැනට වැටුණු ශ්‍රී ලංකා ජාතික ධජය





දිනයේ, 2017 ජනවාරි මස 08 වනදා දින හම්බන්තොටදී

## මාගම්පුර වරාය චීනයට බදු දීමෙන් පසු චීනයේ ජාතික කොඩිය මාගම්පුර වරායේ එසවේ.

හම්බන්තොට මාගම්පුර ජාත්‍යන්තර වරාය 2017 වසරේ දෙසැම්බර් 09 වනදා චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩින්ග් සමාගම වෙත පවරාදීමෙන්, පසු ප්‍රථම වතාවට චීන ජාතික කොඩිය 2018 ජනවාරි 01 දා පෙරවරුවේ මාගම්පුර වරායේ ප්‍රධාන පරිපාලන ගොඩනැගිල්ල ඉදිරිපිට ඔසවන ලදී.

විශේෂයෙන්ම මිට පෙර ශ්‍රී ලංකා ජාතික කොඩිය ඇතුළු වරාය අධිකාරියේ සංකේත කොඩි එහි ඔසවා තිබිණි. නමුත් එහි දී ශ්‍රී ලංකා ජාතික කොඩිය ඔසවා තිබුණේ අනෙක් කොඩි කණුවලට වඩා අඩි එකහමාරක පමණ උසින් වූ නමුත් චීනයට වරාය බදු දීමෙන් පසු, සියලු කොඩි කණු එක සමාන වන සේ ශ්‍රී ලංකා ජාතික කොඩිය ඔසවා තිබූ කොඩි කණුව උසින් අඩු කිරීමට අදාල චීන සමාගම කටයුතු කරන ලදී.

## ජනතා විරෝධය

හම්බන්තොට වරාය හා දේපල චීන රජයට ලබා දීමට රජය ගෙන ඇති තීරණයට විරෝධය පළකරමින් 2016 දෙසැම්බර් මස සිට විවිධ විරෝධතාවන් එල්ලකිරීමට ප්‍රදේශයේ ජනතාව කටයුතු කරනු ලැබී ය. එහි උච්චතම අවස්ථාව වූයේ හම්බන්තොට ආයෝජන කලාපයට මුල්ගල තැබීම එවකට අගමැති වර්තමාන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන





දහස් සංඛ්‍යාත ජනතාවක් එක්ව විරෝධතාවයක නියැලීමයි.

විශේෂයෙන්ම එදින අම්බලන්තොට නගරයේ සහ

හම්බන්තොට නගරයේ ද කඩ සාප්පු වසා ටයර් පුළුස්සා මාර්ග අවහිර කර මෙම විරෝධතාවයට සහාය පල කිරීමද සිදුවී තිබේ. මෙයින් සිදුවූයේ එදින විරෝධතාවයේ නියැලුණු පුද්ගලයින් 41 දෙනෙකු පොලිස් අත්අඩංගුවට පත්වීම පමණි. ඉන් අනතුරුව අවස්ථා ගණනාවකදී තවත් විරෝධතාකරුවන් සිය ගණනක් පොලිස් අත්අඩංගුවට පත්විය.

## අවුල් සහගත කටයුත්තක්

හම්බන්තොට වරාය චයිනා මර්චන්ට් පෝට් හෝල්ඩින්ග් සමාගම වෙත පවර දීමෙන් පසු මේ ආකාරයෙන් වෙළඳාම හා ආර්ථික ධනය වැඩිකිරීමේ පොරොන්දු ක්ෂණිකව වාගේ අවලංගු වූවා පමනක් නොව, මෙම ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාව චීනයට ඇති ණය උච්චාවචනයකට ඇද දමනු ලැබීය.

චීනයේ ණයගැතියෙකු වීම අපේක්ෂා කළ නොහැකි තත්වයකින් තිබියදී, දුර්වල ආර්ථිකය තුළ, සුදු අලි ව්‍යාපෘති සඳහා චීනය විසින් විචක්ෂණ ලෙස ණය දීම, ආර්ථික හා දේශපාලනයේ ප්‍රබල උපාය මාර්ගයක් බවට බොහෝ දෙනා බිය පලකළ හ. මේ සම්බන්ධයෙන් නිව්යෝර්ක් ටයිම්ස් සිදුකළ වාර්තාවක් මගින් ද හෙළි කර තිබෙන්නේ එය සම්පූර්ණයෙන්ම වැළැක්විය හැකි කටයුත්තක් බවයි.

හම්බන්තොට මාගම්පුර වරාය 2010 දී එය විවෘත කර වසරක් ගත වුව ද, මුහුදු පත්ලේ ඇති විශාල ගලක් යාත්‍රා ඇතුළුවීම අවහිර කරමින් තිබිණ. එසේම එය ලංකාවේ දේශපාලන වේදිකාවේ විශේෂයෙන්ම මැතිවරණ සමයේදී දැඩිසේ කතාබහට ලක්විය. කෙසේ නමුත් වරායට විශාල නෞකා ඇතුළුවීමට ඉන් බලපෑමක් එල්ලවූ බව නොරහසකි. එයට පිළියමක් ලෙස එම ගල පුපුරවා හරින ලදී.

මේ ආකාරයෙන් විශාල වියදමක් දරමින් ඉදිකළ වරාය වෙත, 2012 දී පැමිණ ඇත්තේ නෞකා 34 ක් පමණි. කෙසේ වෙතත්, තවදුරටත් ණය ගිවිසුම් අත්සන් කිරීම සහ ව්‍යාපෘතියේ මිල හේතුවෙන්, ඊළඟ වසර හතර තුළ චීන ආයෝජන අඛණ්ඩව ගලා විත් තිබෙන බව මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තා මගින් පෙන්වාදුන් කරුණකි .

කෙසේ නමුත් මේ වනවිට වරායේ ක්‍රියාකාරිත්වය නරක අතට හැරෙමින් තිබුණි. 2016 වර්ෂයේදී, මාධ්‍ය විසින් ලබාගත් සංඛ්‍යාලේඛන මගින් පෙන්නුම් කළේ, ඩොලර් මිලියන 11.81 ක ආදායමක් සහ ඩොලර් මිලියන 10 ක වියදමක් සහිතව වරාය පාඩු ලබමින් පැවතුණු බවයි.

## අපිරිසිදු මුදල්, දේශපාලන අභිලාෂයන් සහ ගිලුණු මමත්වය

හම්බන්තොට වරායේ අරමුදල් මෙන්ම ආරම්භයේ සිටම ඒ වෙනුවෙන් ලැබුණු චීන අරමුදල් සෘජුවම රාජපක්ෂගේ ජනාධිපතිවරණ ව්‍යාපාරයට සහාය වීමට ගලා ආ බව විදෙස් මාධ්‍ය චෝදනා කරන ලදී .

දූෂණය සහ දේශපාලන අනුග්‍රහය හම්බන්තොට කෙරෙහි අවධානය යොමු කරන සැලකිය යුතු සාධක විය හැකි ය. බොහෝ විට චීන සමාගම් කොන්ත්‍රාත්තු ලබාගන්නා විට, ඔවුන්ගේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ ඔවුන් ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට බද්ධ කිරීම් පුළුල් ලෙස බෙදා හැරීමයි.

හම්බන්තොට වරාය කෙරෙහි චීනයේ අවධානය යොමු කිරීම, දකුණු ආසියාවේ උපායමාර්ගික අඩිතාලම ගොඩනැගීම සඳහා එහි අඛණ්ඩ උපාය මාර්ගයේ කොටසක් ලෙස චීනය පෙන්වා දිය හැකිය.

චීනයේ දිගුකාලීන ඉලක්කය වන්නේ චීන නාවුක යාත්‍රා වෙනුවෙන් අනගි නැවතුම් පොලක් ලෙස මෙම වරාය පත්කර ගනිමින් ඉන්දියන් සාගරය තුල බලය මෙන්ම බලශක්ති සැපයුම් වෙළඳාම් ප්‍රවර්ධනය, ආරක්ෂණ ක්‍රියාමාර්ග වෙනුවෙන් භාවිත කිරීම බව විදෙස් මාධ්‍ය විටින් විට චෝදනා කරන විට චීනයේ විදේශ අමාත්‍යාංශ ප්‍රකාශක Lu Kang එම චෝදනා ප්‍රතික්ෂේප කරන ලදී.

"ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ සැපයුම් කේන්ද්‍රස්ථානය බවට පත්කිරීමේ ප්‍රයත්නයෙන් හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ සහයෝගීතාවය ඉදිරියට ගෙන යාමට චීනය සහ ශ්‍රී ලංකාව කැපවී සිටින බව මට මේ අයට පැවසිය හැකිය," කැන්ග් මාධ්‍ය හමුවකදී පැවසියි.

**"හම්බන්තොට වරාය කෙරෙහි චීනයේ අවධානය යොමු කිරීම දකුණු ආසියාවේ උපායමාර්ගික අඩිතාලම ගොඩනැග ීම සඳහා එහි අඛණ්ඩ උපාය මාර්ගයේ කොටසකි."**

2017 වසරේ බීජිං හි ව්‍යාපාරික ප්‍රවෘත්ති සංවිධානයක් වන Caixin වාර්තා කළේ රටේ ප්‍රතිපත්ති බැංකු දෙක වන China Development Bank iy Exim විසින් සැලැස්මේ ව්‍යාපෘති සඳහා ඩොලර් බිලියන 200 ක ණය ලබා දුන් බවයි. එම ගනුදෙනුවල අපේක්ෂිත සාර්ථකත්වය කුමක් වුවත්, චීනයේ බලපෑමේ තරම තක්සේරු කිරීම සඳහා බොහෝ රජයන් දැන් ඔවුන්ගේම කටයුතු සමීපව පරීක්ෂා කරනු ඇති බවට සැකයක් නැත්නම් එම ගනුදෙනුවලින් මිදීමට ඔවුන්ට හැකිවන බවයි.

අක්‍රමිකතා සම්බන්ධයෙන් ගත් කල, ශ්‍රී ලංකාවේ පසුගිය පාලන සමයේ සිදු වූ "අක්‍රමිකතාවක්" හේතුවෙන් හම්බන්තොට වරායේ දී ශ්‍රී ලංකා වරාය අධිකාරියට (SLPA) ඩොලර් මිලියන 19.9 ක පාඩුවක් සිදු වූ බවට වාර්තා වී ඇත. මෙම අලාභයට හේතු වී ඇත්තේ ලෝක තෙල් මිල උපරිම මට්ටමක පවතින විට ප්‍රතික්ෂේප කරන ලද තෙල් ඉහළ මිලකට මිලදී ගැනීමයි.

## යුවාන් වැන්ග් 5 හම්බන්තොටට

චීන විද්‍යාත්මක පර්යේෂණ නෞකාවක් වන "යුවාන් වැන්ග් 5' (YUAN WANG 5) නියමිත කාලයට වඩා දින පහකට පසුව 2022.අගෝස්තු 16 පෙරවරුවේ හම්බන්තොට වරායට සේන්දු විය. එය මුලින් පැමිණීමට නියමිතව තිබුණේ අගෝස්තු 11 වැනිදා වේ. මෙම නෞකාව චීනයෙන් පිටත්වී ඇත්තේ 2022 ජුලි 13වන දා වුවත් විශේෂයෙන් කලාපයේ රටක්වන ඉන්දියාවේ විශේෂ අවධානයක් ද ඒ වෙත යොමුවීමත් සමඟ අවස්ථා කීපයකදී එහි පැමිණීමේ දින ගණන් වෙනස් විය.

චීන ලුහුබැඳීමේ යාත්‍රාව වන Yuang Wang 5 හම්බන්තොට වරායට පැමිණීමට ශ්‍රී ලංකා රජය අවසර ලබා දුන්නේ, එය පැමිණීමට විරුද්ධවීමට ඉන්දියානු සහ එක්සත් ජනපද රජයන් හේතු දැක්වීමට අපොහොසත් වීමෙන් පසුවය.

මීට පෙර ශ්‍රී ලංකාව චීනයෙන් ඉල්ලා සිටියේ මේ සම්බන්ධයෙන් සාකච්ඡා පවත්වන තුරු සංචාරය කල් දමන ලෙසයි.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා සමඟ පැවති හමුවේදී ඇමෙරිකානු තානාපතිනි ජුලී චන්ග් විසින් ද නෞකාව පිළිබඳ කනස්සල්ල මතු කර තිබේ. එහි පැමිණීමට විරුද්ධ වීමට ස්ථිර හේතු දක්වන ලෙස ඇයගෙන් ඉල්ලා සිටියේය.

කෙසේනමුත් 2022. අගෝස්තු 16 දින මෙම නෞකාව හම්බන්තොට වරාය වෙත සේන්දු වූ අතර එහිදී ඒ වෙනුවෙන් පිළිගැනීමේ උත්සවයක් ද සංවිධානය කර තිබුණි. කෙසේ නමුත් මෙම නෞකාව සේන්දුවත් සමඟ බොහෝ දෙනෙකු අදහස් පළකරමින් කියා සිටියේ.හබන්තොට වරාය ලබාගැනීමේ චීන අභිප්‍රාය මින් තහවුරු වන බවයි.

## චීන ණය උගුල

ශ්‍රී ලංකාවේ අනාගත නායකත්වය සියලු දූෂිත චීන ව්‍යාපෘති අවලංගු කළ හැකි බව ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා පවසයි. 2023 ජනවාරි 03වන දිනැතිව චීන තානාපතිවරයා හරහා චීන ජනාධිපති ෂී ජින්පිං මහතා වෙත කරුණු 45කින් සමන්විතව යවන ලද ලිපියක සඳහන් කර තිබේ.

එහිදී සඳහන් කර ඇත්තේ තමන්ට ලැබෙන පළමු අවස්ථාව තුළම වත්මන් රජය ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පෙරළා දමන බවයි.

"පසුගිය වසර 15 තුළ විදේශ රටවල් සමඟ ඇතිකරගත් ගිවිසුම් සියල්ල නැවත වරක් විමර්ශනය කර දූෂණය වංචාව පිටුදැකීමේ ගිවිසුම් සියල්ල අහෝසි කරන බව ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා චීන ජනාධිපතිවරයාට ලිඛිතව දන්වා තිබේ.

ශ්‍රී ලංකාවේ මීළඟ ජනාධිපතිවරණය හෝ මහ මැතිවරණය ජනමත විචාරණයක් යටතේ පවත්වනු ලබන බව ආචාර්ය විජයදාස රාජපක්ෂ සිය ලිපියෙන් පවසයි. ශ්‍රී ලංකාවට අහිතකර බව ඔප්පු වී ඇති ගිවිසුම් ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ අවලංගු කිරීමට මහජනතාවගේ බලය යොදවන බව එම ලිපියේ සඳහන් වේ.

සෙලෙන්දිවා ආයෝජනය හරහා චීනය ශ්‍රී ලංකාවේ ඉඩම් ආක්‍රමණය කිරීමට උත්සාහ කළහොත් සේවයෙන් පහකිරීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා බව ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා එම ලිපිය මගින් අවධාරණය කර තිබේ.

හම්බන්තොට වරාය ශ්‍රී ලංකාව සහ චීනය අතර මතභේදාත්මක ප්‍රශ්නයක් වන අතර ශ්‍රී ලංකාවේ අනාගත නායකත්වයට, සියලුම දූෂිත චීන ව්‍යාපෘති සහ ගනුදෙනු අවලංගු කළ හැකිය. අයිතීන් සහ ආරක්ෂාව සඳහා වන ජාත්‍යන්තර සංසදයට (IFFRAS) අනුව, ශ්‍රී ලංකාවේ අනාගත නායකත්වයකට සියලුම දූෂිත චීන ව්‍යාපෘති සහ ගනුදෙනු අවලංගු කළ හැකි බවට ජනාධිපති සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ආචාර්ය විජයදාස රාජපක්ෂ මහතා චීන ජනාධිපති ෂී ජින් පිං මහතාට අනතුරු අඟවා තිබේ.

2022 ජනවාරි 3 වැනි දින චීන ජනාධිපතිවරයා වෙත සෘජුවම යොමු කළ ලිපියේ ආචාර්ය විජයදාස චීනයට පිරිනැමූ හම්බන්තොට වරාය ව්‍යාපෘතිය, "ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් සිදු වූ ඉතා ඉහළම පරිමාණයේ දූෂිතම ගනුදෙනුව" ලෙස නම් කර තිබේ. ඔහුගේ පිටු හයක ලිපියෙන් හෙළිවූයේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදුන් නමුත් ප්‍රාදේශීය දේශපාලනඥයන්ට නොඉල්ලූ කොමිස් මුදල් ලබා දෙන ව්‍යාපෘති සමඟ ශ්‍රී ලංකාව කොටු කිරීමට චීනයේ ඇති උනන්දුව බවයි.

ශ්‍රී ලංකාවට අහිතකර හෝ අවාසි සහගත සියලු ගිවිසුම්/කොන්ත්‍රාත්තු ප්‍රතිව්‍යුහගත කිරීමට හෝ අවලංගු කිරීමට ජනතාවගෙන් වරමක් ලබා ගැනීම සඳහා මීළඟ ජාතික මැතිවරණය, ජනාධිපති හෝ පාර්ලිමේන්තු වේවා, ජනමත විචාරණයක් සමඟ ඒකාබද්ධ කරන බවට ආචාර්ය විජයදාස එම ලිපිය මගින් අනතුරු අඟවා තිබේ.

දූෂණය හරහා චීනය විසින් සුරක්ෂිත කර ගන්නා ලද ගනුදෙනු සඳහා ද එය අදාළ වන අතර, එවැනි කොන්ත්‍රාත්තු හරහා ලබාගත් ණය ආපසු ගෙවීමට ශ්‍රී ලංකාව බැඳී නොසිටින බව ඔහු පෙන්වා දෙයි. ආචාර්ය විජයදාස තරයේ කියා සිටියේ, "කිසිම ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු වුවහොත්, කිසිඳු තත්වයක් යටතේ කිසිදු ගිවිසුමක කාලසීමාව එවැනි කොන්ත්‍රාත්තු ආරම්භ කළ දින සිට වසර 15ක් ඉක්මවීමට ඉඩ නොදෙන බවයි."

2014 සැප්තැම්බර් මාසයේදී එවකට ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතාගේ සිහිනය සැබෑ කිරීම සඳහා චීන ජනාධිපති ෂී ජින්පින් මහතා කොළඹට ගොඩබසින අවස්ථාවේදී මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2009 දී අවසන් වූ සිවිල් ගැටුමේදී බීජිනය ශ්‍රී ලංකාවට ආයුධ සහ පතොරම් ලබා දීමෙන් පසු දශකයකට වැඩි කාලයක් තිස්සේ රාජපක්ෂවරුන්, මහින්ද සහ ජනාධිපති ගෝඨාභය චීනය සමඟ විශේෂ සබඳතාවක් පැවැත්වූ බව බොහෝ දෙනා දන්නා කරුණකි.

ණය උගුල් රාජ්‍ය තාන්ත්‍රික චීන ආකෘතිය හොඳින් පිළිගෙන ඇති අතර ජාත්‍යන්තර මූල්‍ය ආයතන සහ

# අති විශාල බදු සහ තීරු බදු සහන දෙමින් ඩොලර් වෙනුවට රුපියල්වලට විකිණෙන කොළඹ පෝර්ට් සිටි හෙවත් චීන කොළණිය

ලසාන්ත රුහුණගේ

කොළඹ වරාය නගරය හෙවත් පෝර්ට් සිටි සම්බන්ධයෙන් ආණ්ඩුව ගෙන ඇති අලුත්ම තීරණය වන්නේ පෝර්ට් සිටියට පැමිණෙන ව්‍යාපාර සඳහා ක්‍රමෝපාය සංවර්ධන පනත යටතේ බදු සහන ලබාදීමේ තීරණයයි. එසේ බදු සහන ලබාදීමේ බලය පෝර්ට් සිටි වෙනුවෙන් පිහිටුවා ඇති කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාවට ලබාදී ඇති අතර ඒ අනුව ජනාධිපතිවරයා හෝ කොළඹ පෝර්ට් සිටි විෂය පවරා ඇති ඇමතිවරයා විමසා එවැනි ව්‍යාපාර හඳුනාගෙන නිදහස් කිරීම් හා දිරිගැන්වීම් ලබාදීමට එම කොමිසමට බලය ලැබෙනු ඇත. කැබිනට් මණ්ඩලය මෙම තීරණය ගෙන ඇත්තේ 2023 මැයි 22 දිනය.

මේ අනුව කොළඹ පොර්ට් සිටි ව්‍යාපෘති සමාගමට හෝ ඉදිකිරීම් සමාගම්වලට අමතරව ව්‍යාපෘති සමාගම විසින් එහි ඉඩම් බදු දෙන සමාගම්වලට මෙන්ම, ශ්‍රී ලංකාව වෙනුවෙන් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින් ඉඩම් බදු දෙන සමාගම්වලටද එම සහන හිමිවේ.

මේ වනවිටත් විදේශ ආයෝජකයින්ගේ පැමිණීම කෙසේ වෙතත්, ආයෝජකයින් වශයෙන් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරිකයින් කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සමඟ ගිවිසුම්ගතව පෝර්ට් සිටියේ ආයෝජනයට පැමිණෙන අයුරක් දක්නට ලැබේ. 2023 අප්‍රේල් මාසයේදී ඒ ආකාරයට පෝර්ට් සිටියේ ආයෝජනයට පැමිණ තිබූ දේශීය ව්‍යාපාරික ආයතනය වූයේ සොෆ්ට් ලොජික් සමූහයට අයත් ආසිරි රෝහල් සමූහයයි. ඔවුන් පෝර්ට් සිටියට එන්නේ ආසිරි පෝර්ට් සිටි හොස්පිටල් ප්‍රයිවට් ලිමිටඩ් ලෙසය. එම රෝහල තුළ ඇඳන් 500කට වැඩි පහසුකම් සපයන බව සඳහන් කරන අතර ආයෝජනය වශයෙන් සඳහන් කරන්නේ ඇමරිකානු ඩොලර් මිලියන 100ක මුදලකි.

ප්‍රශ්නය වන්නේ දේශීය සමාගම්වල මෙම ආයෝජන විදේශ ආයෝජන නොවීමය. ඒ සමඟම පැනනගින අනෙක් ප්‍රශ්නය වන්නේ විදේශීය ආයෝජන හෙවත් විදේශ මුදල් නොවන මෙම ආයෝජන සඳහා ක්‍රමෝපාය ව්‍යාපෘති සංවර්ධන පනත යටතේ බදු සහන ඇතුළු අනෙකුත් සහන ලබාදෙන්නේ ඇයිද යන්නය. ක්‍රමෝපාය සංවර්ධන පනත මෙතෙක් ක්‍රියාත්මක වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අනුමත ව්‍යාපෘති සඳහා පමණය. එම සෑම ව්‍යාපෘතියකම සම්පූර්ණ වශයෙන් හෝ වැඩි ප්‍රමාණයක විදේශ ආයෝජන තිබුණි. දේශීය ආයෝජන තිබුණේ නම් ඒ ඉතා සුළු ප්‍රතිශතයකි.

කොළඹ පෝර්ට් සිටියේ මේ ආකාරයේ දේශීය ආයෝජන නිසා සිදුවන්නේ ඒ මගින් රටට පැමිණේ යැයි බලාපොරොත්තු වූ විදේශ ආයෝජන නොලැබී යෑමත්, විශේෂ බදු සහන ලබාදීම මගින් රටට ලැබිය යුතු බදු ආදායම අහිමි වීමත්ය.

කොළඹ පොර්ට් සිටිය සම්බන්ධයෙන්ම රටට බදු ආදායම අහිමි වීමේ තවත් තවත් තීරණයක් 2023 මැයි 22 දින අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව විසින්ය. එම ගැසට් පත්‍රයෙන් තීරු බදු රහිතව භාණ්ඩ මිලදී ගැනීමේ පහසුකම් කොළඹ පොර්ට් සිටියට පැමිණෙන්නන්ට ලබාදී තිබේ. ඒ අනුව සංචාරකයින් වශයෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නන්ට මුදල් ප්‍රමාණයේ සීමාවකින් තොරව පොර්ට් සිටියෙන් භාණ්ඩ මිලදී ගත හැකිය. ඒ සඳහා ඇත්තේ එක් සීමාවක් පමණි. ඒ එක් එක් භාණ්ඩ මිලදී ගත හැකි ප්‍රමාණයන්ට පනවා ඇති සීමාව පමණය. ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ඇති විදේශිකයින්ට, විදේශගතව පැමිණෙන ශ්‍රී ලංකා ගුවන් බලපත් හිමියන්ට, ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ ගුවන් බලපත් හිමියන්ට, එක්සත් ජාතීන්ගේ සංවිධානය හා ඊට අනුබද්ධ ආයතනවල සහ විදේශ තානාපති කාර්යාලවල සේවය කරන පිරිස්වලටත් පෝර්ට් සිටියෙන් තිරු බදු

රහිත බදු සහනය ලබාගත හැකි අතර ඒ වර්ෂයක් සඳහා ඇමරිකානු ඩොලර් 5000ක වශයෙනි. ඒ සඳහා ඇත්තේද ඉහතින් සඳහන් කළ අයුරින්ම එක් එක් භාණ්ඩ මිලදී ගත හැකි ප්‍රමාණයේ සීමාවක් පමණය.

කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ තීරු බදු සහන යටතේ මිලදී ගත හැකි භාණ්ඩවලින් පෝර්ට් සිටියේ තීරු බදු සහනය යටතේ මිලදී ගැනීමට නැත්තේ රූපවාහිනී, රෙදි සෝදන යන්ත්‍ර හා ශීතකරණ පමණය. එදිනෙදා ජීවිතය පවත්වාගෙන යෑමට අවශ්‍ය කෑම බීම, ඇඳුම් පැළඳුම්, ගෘහ උපකරණ, ඉලෙක්ට්‍රොනික උපකරණ, කාර්යාලීය ද්‍රව්‍ය ඇතුළු සියලුම දේ තීරු බදු සහන යටතේ පෝර්ට් සිටියෙන් ලබාගත හැකිය.

නමුත් ප්‍රශ්නය වන්නේ මැද පෙරදිග ගෘහ සේවයේ කම්කරු හෝ වෙනත් රැකියාවක සිය ජීවිතය දියකර රටේ විදේශ විනිමයට කර ගසමින් සිටින ශ්‍රී ලාංකිකයින්ට සාමාන්‍ය වශයෙන් ලැබෙන තීරු බදු සහනය මෙන් දස ගුණයක හෝ ඊට වැඩි සහනයක් පෝර්ට් සිටියට පැමිණෙන්නන්ට ලබාදී තිබීමය.

දික 90කට අඩු කාලයක් විදේශ ගතවී පැමිණෙන ශ්‍රී ලාංකිකයෙකුට සාමාන්‍ය තීරු බදු සහනය වශයෙන් ලැබෙන්නේ ඇමරිකානු ඩොලර් 187.5ක දීමනාවක් පමණය. දින 90ත් 365ත් අතර කාලයක් විදේශ ගතවී පැමිණියේ නම් එය ඩොලර් 625කි. වසරකට වැඩි කාලයක් විදේශ ගතවී පැමිණියේ නම් එය ඩොලර් 1750කි. රට වෙනුවෙන් නොරටක ඉඳ ජීවිතය දිය කරන මෙම පිරිසට රට මුහුණ දී ඇති විදේශ මුදල් අර්බුදය නිසා අමතර තීරු බදු සහනයක් මේ වනවිට ලබාදී ඇතත්, එය මැද පෙරදිග රටවල හෝ ඒ සමාන රටක විදේශ රැකියාවේ යෙදෙන ශ්‍රී ලාංකිකයින්ට පැන යෑමට අසීරු කඩුල්ලකි.

ඒ අනුව ඇමරිකානු ඩොලර් 2400ත් 4799ත් අතර ප්‍රමාණයක යම් විදේශ විනිමය ප්‍රමාණයක් රටට එවා ඇත්නම් ඉහත සඳහන් කළ තීරු බදු සහනයට අමතරව ඇමරිකානු ඩොලර් 600ක තීරු බදු සහනයක් හිමිවන අතර ඩොලර් 4800ත් 7199ත් අතර විදේශ විනිමය ප්‍රමාණයක් රටට එවා ඇත්නම් ඩොලර් 960ක අමතර තීරු බදු සහනයක් හිමි වේ. ඩොලර් 7200ත් 11,999ත් අතර ප්‍රමාණයක විදේශ මුදල් එවා ඇත්නම් ඩොලර් 1440ක අමතර තීරු බදු සහනයක් හිමිවන අතර ඩොලර් 12,000ත් 23,999ත් අතර විදේශ විනිමය ප්‍රමාණයක් රටට එවා ඇත්නම් ඩොලර් 2400ක අමතර තීරු බදු සහනයක් හිමිවේ. ඩොලර් 24,000ට වැඩියෙන් රටට එවා ඇත්නම් ඩොලර් 4800ක අමතර තීරු බදු සහනයක් හිමිවේ.

මෙම අමතර තීරු බදු සහනය පවා පෝර්ට් සිටියේ අවම අවම තීරු බදු සීමාවට වඩා අඩු එකක් බව අවබෝධ කරගත හැකිය. එහෙත් එම අමතර තීරු බදු සහනය ලබා ගැනීමේදී රට වෙනුවෙන් නොරටක සිට ජීවිතය දියකරන මිනිසුන් අභිමුවට පැමිණෙන ප්‍රශ්නය වන්නේ එම කඩුල්ල පැන යා හැකිද යන්නය. එයට හේතුව වන්නේ ශ්‍රී ලාංකිකයින්ට ලබාදී ඇති අමතර උපරිම තීරු බදු සහනය වන ඩොලර් 4800ක් ලබා ගැනීම සඳහා මාසයකට අනිවාර්යෙන් ඇමරිකානු ඩොලර් 2000කට සමාන විදේශ විනිමය ප්‍රමාණයක් රටට එවිය යුතු වීමයි. ඩොලරයක් සඳහා වූ ශ්‍රී ලංකා රුපියලේ අගය ආසන්න වශයෙන් රුපියල් 300ක් ලෙස සැළකුවහොත් එය රුපියල් ලක්ෂ 6ක ප්‍රමාණයකි. මැද පෙරදිග වැනි රටක ගෘහ සේවය, කම්කරු හෝ ඒ සමාන සේවයක නිරත කිසිවකුට මාසයක කාලයකදී එතරම් මුදලක් රටට එවිය නොහැකි බව පැහැදිලි කරුණකි. ඒ ඔවුන්ගේ මාසික වැටුප හෝ ඉතිරිය එවන් අගයක් නොගන්නා බැවිනි.

ඉන් මෙහා ඇති ඩොලර් 2400ක අමතර තීරු බදු සහනය ලබා ගැනීම සඳහාද එහි අවමය වන ඩොලර් 12,000 සඳහා ගණනය කළහොත් ඒ සඳහාද ඩොලර් 1000ක මුදලකට සමාන රුපියල් ලක්ෂ 3ක මුදලක් ශ්‍රී ලංකාවට එවිය යුතු අතර එයද ඉහත සඳහන් කළ පරිදිම මැද පෙරදිග වැනි රටවල සේවයේ යෙදෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් යථාර්ථයක් වන්නේ නැත. ඊලඟ සහන අවස්ථාව වන ඩොලර් 1440ක අමතර තීරු බදු සහනය ලබා ගැනීම සඳහාත් ඩොලර් 7200 යන අවමය සලකා බැලුවත් ඩොලර් 600ක් හෙවත් රුපියල් 180,000ක මුදලක් එවිය යුතු අතර මැද පෙරදිග වැනි රටවල සේවය කරන්නන්ට එයද ප්‍රායෝගික නොවේ.

ඩොලර් 960 අමතර තීරු බදු සහනය ලබා ගැනීම සඳහා රටට එවිය යුතු අවමය වන ඩොලර් 4800ක ප්‍රමාණය සලකා බැලුවහොත් ඩොලර් 400ක් හෙවත් රුපියල් 120,000ක මුදලක් මාසිකව රටට එවිය යුතු අතර මැද පෙරදිග ගෘහ සේවිකාවන් ඇතුළු සේවකයින් සම්බන්ධයෙන් ගත්කළද එය අසීරු ඉලක්කයකි. අවම කාණ්ඩයේ ඇති ඩොලර් 600ක අමතර තීරු බදු සහනය ලබා ගැනීම සඳහා රටට එවිය යුතු අවමය වන ඩොලර් 2400 සම්බන්ධයෙන් සලකා බැලුවහොත් ඩොලර් 200ක් හෙවත් රුපියල් 60,000ක මුදලක් රටට මාසිකව එවිය යුතු අතර මැද පෙරදිග වැනි රටවල සේවය කරන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් ගත්කළ යම් ප්‍රායෝගික බවක් ඇත්තේ එහි පමණය.

මේ අමතර තීරු බදු සහන රට වෙනුවෙන් ජීවිතය දියකරන ශ්‍රී ලාංකිකයින්ට ලබාදීමට යෝජනා කර ඇති එකක් නොවන බව පැහැදිලිය. එහි බේදය වන්නේ පෝර්ට් සිටියට පැමිණෙන්නන්ට එවැනි බාධකයක් නොමැති වීමය. ඒ අනුව පෝර්ට් සිටිය යනු ඇති හැකි අයට තීරු බදු සහනය යටතේ අඩු මිලට ජීවිතය ගෙන යා හැකි සුරපුරයකි. රටට බදු අහිමි වන ගොඩ කරන ලද බිමකි.

පෝර්ට් සිටියේ බදු සහන ඉන්ද නවතින්නේ නැත. එහි ඉදිකිරීම් සමාගම වන චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍රක්ෂන් සමාගමට ලබාදී ඇති බදු සහන ශ්‍රී ලංකාව මෙතෙක් ආයෝජකයකුට හෝ ආයෝජන ව්‍යාපෘතියකට ලබාදී ඇති ඉහළම බදු සහනය වශයෙන් සැළකිය හැකිය. මෙම ව්‍යාපෘතිය 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ බදු

සහන ලබාදීම සඳහා මුලින්ම ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන්නේ 2014 ජනවාරි 24 වැනිදාය. ඒ එවක ආයෝජන ප්‍රවර්ධන ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන විසින්ය. එම ගැසට් පත්‍රයේ ඇමරිකානු ඩොලර් මිලියන 1300ක විදේශ ආයෝජනයක් ලෙස මෙම ව්‍යාපෘතිය හඳුන්වයි. ව්‍යාපෘති සමාගමේ නම චෙක් පෝර්ට් සිටි කළම්බු ප්‍රයිවට් ලිමිටඩ් ලෙසද සඳහන් කරයි. එහෙත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මහාමාර්ග, වරාය සහ නාවික අමාත්‍යවරයා වශයෙන් එවක ජනාධිපති මහින්ද රාජපක්ෂ 2013.11.20 දින සහිතව පළමු කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කිරීමේදී ඉදිකිරීම් සමාගම ලෙස සඳහන් කළේ චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍රක්ෂන් සමාගමයි. කොළඹ වරාය නගරය සංවර්ධනය කිරීම උදෙසා ඉල්ලා නොසිටින ලද යෝජනාවක් :ඖබිදකසජසඑා ඡරදචදීකි* හෙවත් ස්වෙච්ඡා යෝජනාවක් ඉදිරිපත් වූ බව එම කැබිනට් පත්‍රිකාවේ සඳහන් කරයි.

ඉහත සඳහන් කළ ගැසට් පත්‍රය මගින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත යටතේ ලබාදුන් බදු සහන තවදුරටත් පුළුල් කිරීම 2014 සැප්තැම්බර් 11 දින නිකුත් කළ අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් එවක ආයෝජන ප්‍රවර්ධන ඇමති ලක්ෂ්මන් යාපා අබේවර්ධන සිදුකළේය. එහි තිබූ බදු සහන පුළුල් කිරීමේ විශේෂම යෝජනාව වූයේ ව්‍යාපෘති සමාගම වන චෙක් පෝර්ට් සිටි කලම්බු ප්‍රයිවට් ලිමිටඩ් සමාගමට අමතරව ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු වන චයිනා හාබර් ඉංජිනියරින් සමාගමටද බදු සහන ලබාදීමය. ඒ අනුව චයිනා හාබර් ඉංජිනියරින් සමාගම පෝර්ට් සිටි ව්‍යාපෘතියෙන් ජනනය කරන ලාභ සහ ආදායම වෙනුවෙන් දේශීය ආදායම් පනත යටතේ සංස්ථාපිත ආදායම් බදු ගෙවීම වසර 08ක කාලයක් සඳහා නිදහස් කර තිබේ. ඒ චයිනා හාබර් ඉංජිනියරින් සමාගම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ දිනයේ සිටය. එසේම ව්‍යාපෘති සමාගමට හෝ ව්‍යාපෘති සමාගම විසින් පෙරදිසි ආයෝජකයින්ට ගොඩකළ ඉඩම් පැවරීම හෝ බදුදීම එකතු කළ අගයමත බදු ගෙවීමෙන් සහ ජාතිය ගොඩ නැඟීමේ බදු ගෙවීමෙන් නිදහස් කර තිබේ.

පුළුල් කරන ලද එම බදු නිදහස් කිරීම් හැර ව්‍යාපෘති සමාගම සඳහා දේශීය ආදායම් පනත යටතේ ගැනෙන සංස්ථාපිත ආදායම් බදු වසර 25 ක කාලයකට නිදහස් කර තිබේ. එම බදු නිදහස් කාලය ගණනය කිරීම ආරම්භ වන්නේ ව්‍යාපෘති සමාගම ලාභ ඉපැයීම ඇරඹූ වසරේ සිට හෝ ව්‍යාපෘතියේ ඉදිකිරීම් ඇරඹූ දිනයේ සිට වසර 06ක් එළඹීම යන අවස්ථා දෙකෙන් පළමුව එළඹෙන අවස්ථාවේදීය.

දේශීය ආදායම් පනත යටතේම වන ලාභාංශ මත බද්ද වසර 25ක බදු නිදහස් කාලය සඳහා හා ඉන්පසුව එළඹෙන වසරක කාලයක් සඳහා ව්‍යාපෘතියේ ලාභවලින් කොටස් හිමියන් වෙත බෙදා දෙනු ලබන ලාභාංශවලින් නිදහස් කර තිබේ. එමෙන්ම දේශීය ආදායම් පනත යටතේම වන රඳවා ගැනීමේ බද්දෙන්ද ව්‍යාපෘති සමාගම නිදහස් කර තිබෙන අතර උපයන විට ගෙවීමේ බද්දෙන්ද ව්‍යාපෘති සමාගම නිදහස් කර තිබේ. මෙම සහනය ව්‍යාපෘති සමාගමේ විදේශීය කාර්ය මණ්ඩලයේ උපරිම 30 දෙනෙකු සඳහා ලබාදී ඇති අතර ඒ අනුව එම සහනය වානිජ මෙහෙයුම් ආරම්භයේ සිට එළඹෙන වසර 10ක කාලයක් සඳහා අදාළ වේ.

එකතු කළ අගය මත බද්ද හෙවත් වැට් බද්දද සම්බන්ධයෙන්ද නිදහස් වීම් ලබාදී ඇති අතර ඒ අනුව ව්‍යාපෘතිය සඳහා ආනයනය කරන හා දේශීය වශයෙන් මිලදී ගන්නා භාණ්ඩ හා සේවා සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ වසර 08ක කාලය සඳහා නිදහස් වීම් ලබාදී තිබේ. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන පනත යටතේද ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ එම වසර 08ක කාලය සඳහා බදු නිදහස් කර ඇති අතර ඒ, ඒ සඳහා කරන ආනයනයන් වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට හා උප කොන්ත්‍රාත්කරුවන්ද අදාළ වන සේය.

2005 අංක 5 දරන මුදල් පනත යටතේ කොන්ත්‍රාත්කරුවන්, උප කොන්ත්‍රාත්කරුවන් ගෙවිය යුතු ඉදිකිරීම් හා කර්මාන්ත සහතික අරමුදල් බද්ද වසර 08ක කාලයක් සඳහා නිදහස් කර තිබේ. එමෙන්ම ආනයනය කරන භාණ්ඩ සම්බන්ධයෙන් වන නිෂ්පාදන බදුද වසර 08ක කාලයක් සඳහා නිදහස් කර ඇත. එසේම වසර 08ක කාලය සඳහා සෙස් බදු ගෙවීමෙන්ද නිදහස් කර ඇත. ඊට අමතරව එම කාලය සඳහා ජාතිය ගොඩනැගීමේ බද්දෙන්ද නිදහස් කර තිබේ. තවද ව්‍යාපෘතිය සඳහා ආනයනය කරනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ හා අනෙකුත් සියලු භාණ්ඩ එම වසර 08ක කාලය තුළ රේගු බද්දෙන්ද නිදහස් කර තිබේ.

බදු සහන හා තීරු බදු සහන මෙතරම් ලබාදී අවසානයේ මෙම ව්‍යාපෘතියෙන් ශ්‍රී ලංකාවට ලැබෙන්නේ කුමක්ද? වැදගත්ම ප්‍රශ්නය වන්නේ එයයි. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මුලින් කීවේ රටට විදේශ විනිමය රැගෙන ඒම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බවයි.

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ කැබිනට් පත්‍රිකාවට අනුව චයිනා කොමියුනිකේෂන් කන්ස්ට්‍රක්ෂන් සමාගමේ ආයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 1337කි. ඒ අනුව කොළඹ පෝර්ට් සිටිය සඳහා හෙක්ටයාර 233ක් ගොඩ කිරීමට නියමිත විය. මුලින්ම මුළු ඉඩම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 125ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබාදීමට නියමිතව තිබූ අතර ඒ පොදු පහසුකම් ලෙස හෙක්ටයාර 63ක් හා විකිණිය හැකි ඉඩම් ලෙස හෙක්ටයාර 62ක් වශයෙනි. එමෙන්ම ව්‍යාපෘති යෝජකයාට ආයෝජනයට අදාළ ණය මුදල පියවා ගැනීම, අලෙවි ප්‍රවර්ධන වියදම් හා ලාභය වශයෙන් හෙක්ටයාර 108ක් ලබාදීමට නියමිතව තිබුණි. හෙක්ටයාර 20 ක භූමි ප්‍රමාණය නිදහසේ භුක්ති විඳීමට හා ඉතිරියක් වෙතොත් 99 අවුරුදු බදු පදනම යටතේ ලබාදීමට නියමිතව තිබුණි. එහෙත් පසුව ගොඩකරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 269 දක්වා වැඩි කරනු ලැබීය.

කෙසේ වෙතත් 2015 වර්ෂයේ යහපාලන ආණ්ඩුව බලයට පත්වීමෙන් පසු 2016.08.01 දින අමාත්‍ය මණ්ඩලය ගනු ලැබූ තීරණයක් වූයේ ඊට පෙර සිටි මහින්ද රාජපක්ෂ ආණ්ඩුව 2014.සැප්තැම්බර් 16 දින අත්සන් කරන ලද ගිවිසුම අනුව ව්‍යාපෘති සමාගමට සින්නක්කරව ලබාදීමට නියමිතව තිබූ හෙක්ටයාර 20ක භූමි ප්‍රමාණය එසේ ලබා නොදෙන බවයි. ඒ වෙනුවට එම ඉඩම් ප්‍රමාණයද අවුරුදු 99 බදු පදනම මත ලබාදෙන බවයි.

එමෙන්ම පසුගිය යහපාලන ආණ්ඩු සමයේදී ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලබාදීමට නියමිතව තිබූ එම ඉඩම් ප්‍රමාණය නාගරික සංවර්ධන අධිකාරියට ලබාදුන් අතර මේ වනවිට එම ඉඩම් ඇත්තේ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව යටතේය.

එම ඉඩමේ හෙක්ටයාරයක ඇස්තමේන්තුගත වටිනාකම ඇමරිකානු ඩොලර් මිලියන 24ක් ලෙස කැබිනට් පත්‍රිකාවේ ඇස්තමේන්තුගත කර තිබුණි. ඒ අනුව චීන සමාගමට ලබාදී ඇති ඉඩම් අක්කර 108 හෙක්ටයාරයක් ඇමරිකානු ඩොලර් මිලියන 24 බැගින් බදු ලෙස ලබාදුනහොත් ඒ මගින් සොයාගත හැකි මුදල ඇමරිකානු ඩොලර් මිලියන 2592කි. එය ආසන්න වශයෙන් ව්‍යාපෘති සමාගම ආයෝජනයට වැය කරන මුදල මෙන් දෙගුණයකි. ශ්‍රී ලංකා රජයට බදු දිය හැකි හෙක්ටයාර 62න් ලබාගත හැකි මුදල ඇමරිකානු ඩොලර් මිලියන 1488කි.

කොළඹ වරාය නගරය පිරවීම වෙනුවෙන් නොමිලේ වැලි ලබාදුන්නේ ශ්‍රී ලංකා රජයයි. කොළඹ වරාය අවට මුහුදේ වැලි නිධියකින් ලබාදුන් වැලි ප්‍රමාණය අවසන් වීමෙන් පසු ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සතු කොළඹ වරාය අවට වැලි නිධියකින්ද ඒ සඳහා නොමිලේ වැලි ලබාදෙනු ලැබීය. ඒ 2017. 10.03 දින කැබිනට් මන්ඩල යෝජනාවක් මගින්ය. කොළඹ පෝර්ට් සිටිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ වඩා වැදගත්ම දායකත්වය වූයේ කොළඹ දකුණු වරාය සඳහා ඉදිකරන ලද දියකඩනයයි. පෝර්ට් සිටිය පුරවනු ලැබුයේ එම දියකඩනයේ සිට දකුණට වන්නටය. දියකඩනය ඉදිකිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගත් ණය මුදල ඇමරිකානු ඩොලර් මිලියන 375කි. එම ණය රටක් වශයෙන් ගෙවන්නේ ශ්‍රී ලංකාවය.

එහෙත් ප්‍රශ්නය ඇත්තේ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඉලාපොරොත්තු ඉටුවේද යන්නය. ඊට හේතුව කොළඹ පොර්ට් සිටියේ ඉඩම් ලබා ගැනීමට හෝ ආයෝජනය කිරීමට විදේශ මුදල්ම අවශ්‍ය නොවීමය. 2021 අංක 21 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත අනුව එහි ආයෝජනය කිරීමට, ඉඩම් ලබා ගැනීමට හෝ ඒ තුළ ඇති භාණ්ඩ හා සේවා ලබා ගැනීමට විදේශ ව්‍යවහාර මුදල්ම අවශ්‍ය නොවේ. ශ්‍රී ලංකා රුපියල්වලින් එහි ආයෝජනය, ඉඩම් ලබා ගැනීම, භාණ්ඩ හා සේවා මිලදී ගැනීම කළ හැකිය. ඒ අනුව විදේශ ආයෝජන හෙවත් කොළඹ පෝර්ට් සිටියේ ශ්‍රී ලංකා බලාපොරොත්තුව සුන්වී යනු ඇත. ඒ පොර්ට් සිටිය තුළ සිදුකරන ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනු රටේ ආර්ථික ප්‍රශ්නයට හෙවත් විදේශ මුදල් අර්බුදයට පිළියමක් සපයන්නේ නැති නිසාය.

නමුදු චීන ව්‍යාපෘති සමාගමට හෝ එහි සිට ව්‍යාපාර සිදුකරන විදේශ ආයෝජකයින්ට එවැනි ප්‍රශ්නයක් ඇති වන්නේ නැත. මන්ද ඔවුන් ඉඩමක් බදු දුන්නද, භාණ්ඩ හෝ සේවාවක් ලබා දුන්නද ඒ සඳහා ලැබෙන දේශීය මුදල් හෙවත් රුපියල් යළි ඔවුන්ට අවශ්‍ය විදේශ මුදල් ඒකකයට පරිවර්තනය කර ලබා ගැනීම හා රටින් පිටට ගෙන යා හැකි නිසාය.

මේ සියලු කරුණු අනුව කොළඹ පොර්ට් සිටි ව්‍යාපෘතිය යනු රටේ විදේශ මුදල් අර්බුදයට සැබෑ විසඳුමක් නොවී, අති විශාල බදු සහන හා තීරු බදු සහන ලබාදෙමින් පනත්වාගෙන යනු ලබන චීනයේ උපායමාර්ගික අවශ්‍යතාවය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ තවත් එක් ව්‍යාපෘතියක් ලෙස නම් කළ හැකිය.

# ලංකාවට තවත් ණය බරක් එකතු කරපු (ASMP) ඩොලර් මිලියන 61.19 කට කරපු දේ?

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි

- **බොහොමයක් ප්‍රධාන ලබාදී ඇත්තේ හිතමිතුරන්ට හා බලවතුන්ට**
- **තොරතුරු කොමිසමේ නියෝගයටත් ASMP ය ඩොලර් මිලියන 37කට අධිකමුදලක් මහා පරිමාන ප්‍රදාන ලබාදුන් ව්‍යවසායකයින්ගේ නම් හෙළි නොකරයි.**
- **ලෝක බැංකුවෙන් දුන් ඩොලර් මිලියන 61.19ක ණය මුදලට ඇමරිකන් ඩොලර් ලක්ෂ 11කට අධික පොලියකුත් ගෙවන්න වෙලා.**

මට කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය(ASMP) මගින් ලක්ෂ 45ක් විතර ප්‍රදාන ලෙස ලබාදී තිබෙනවා තවත් මුදලකුත් එන්නත් තියෙනවා නමුත් දැනට කරලා තියෙන වැඩ ටික කරන්න මම බැංකු නයකුත් ගත්තා ඒ නිසා ඒ ග්‍රීන් හවුස් හැදුවට තාම නිසි අදායමක් නෑ ගත්තු බැංකු ණයවලට වාරිකය විතරක් රුපියල් අසුදාහක් විතර ගෙවන්න සිදුවෙලා තියෙනවා”

වැවිලි අමාත්‍යාංශය යටතේ පවතින සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය(ASMP) යටතේ ප්‍රධාන ලබාගෙන මේ වනවිට එය අකණ්ඩව කරගෙන යාමට නොහැකිව සිටින වැලිමඩ දලුක්වැල්ල ප්‍රදේශයේ රත්නගාම් ආයතනයේ හිමිකරු රත්නායක මහතා කියා සිටියේය.රත්නායක මහතා යනු ASMP මගින් ප්‍රදාන ලබාදුන් 1000ක පමණ දෙනාගෙන් කෙනෙකි.

මේ ආකාරයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම, වෙළඳපොල ප්‍රවේශය වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘති ප්‍රදේශවල කුඩා වතු හිමියන්ගේ සහ කෘෂි ව්‍යාපාරවල අගය එකතු කිරීමේ අරමුණ ඇතිව ලෝක බැංකුව මගින් ඩොලර් මිලියන 125ක් 2017 වර්ෂයේදී ලබාදී තිබෙන අතර ඉන් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ඩොලර් මිලියන 63.81ක් හා වැවිලි අමාත්‍යාංශය යටතේ පවතින සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය(ASMP) සඳහා ඩොලර් මිලියන 61.19ක මුදලක් ලබාදී තිබේ.

එම ණය මුදල් ලබාදී ඇත්තේ අදාළ ව්‍යාපෘතිය මගින් තෝරාගනු ලබන ව්‍යවසායකයින් උදෙසා ප්‍රදානයන් ලෙස ලබා දීමට වේ ඒ අනුව මෙම මුදල් ලබාදීමෙන් පසු ඔවුන්ගෙන් නැවත සතයක්වත් අයකරගනු නොලැබේ.

මේ ආකාරයෙන් රටත් මහජනතාවත් ණයකරුවන් කරමින් ලෝක බැංකුව ලබාදුන් තවත් ඩොලර් මිලියන 61.5ක විදෙස් ණය මුදල් අවභාවිතා වූ, නස්ති කළ මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් මෙම ගවේෂණයට පාදක වේ.

ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය රටේ මූල්‍ය ස්ථාවරත්වයට සැලකිය යුතු ප්‍රතිවිපාක ඇති කර ඇති අතර, බොහෝ දුරට දුර්වල ආර්ථික ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා පාලන තන්ත්‍රයේ සහ රාජ්‍ය පරිපාලනයේ මූල්‍ය අවභාවිතය හේතුවෙන්. රජයට තම ණය ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට නොහැකි වීම සහ එය ඉලක්ක මට්ටමට අඩු කර ගැනීමට නොහැකි වීම දැනට

පවතින ආර්ථික අර්බුදය තවත් උග්‍ර කිරීමට හේතු වී තිබේ. ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ෂඑත), ආසියානු සංවර්ධන බැංකුව වැනි ජාත්‍යන්තර සංවිධාන,රජයන් මගින් විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකාවට ණය ලබා දී ඇත.

මේ වනවිට හිඟ මුදල් ඇතුළුව ශ්‍රී ලංකාවේ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය 2022 වසර අවසන් වන විට ඩොලර් බිලියන 83.6 ක් පමණ බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවිය තහවුරු කරන ලදී. ඉන් ලෝක බැංකුව විසින් ලබා දී ඇති මුළු ණයවලින් 11% ක් නියෝජනය කරයි.




මුලාශ්‍ර -මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

කෙසේ නමුත් ලෝක බැංකුව කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය(ASMP) සඳහා පමණක් ලබාදුන් ඩොලර් මිලියන 61.19ක ණය මුදල 2041 ජුනි 15 වන විට ගෙවිය යුතු අතර වාර්ෂික පොලී අනුපාතය 1.25% ලෙස ඩොලර් ලක්ෂ11ක මුදලක් (/1,109,667.58 ) ගෙවීමට සිදුවන බව ඇස්තමේන්තු කර ඇත.

## තොරතුරු නොදීම


මෙවන් තත්වයක් තිබියදී වැවිලි අමාත්‍යාංශය යටතේ පවතින සුළු අපනයන වැවිලි භෝග සංවර්ධන අංශය යටතේ ක්‍රියාත්මක වන කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගයදාම සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ඩොලර් මිලියන ගණනක ප්‍රදාන ලබාදුන් ව්‍යවසාකකයින්ගේ තොරතුරු ඉල්ලා 2022, මැයි මස 05 වන දින අදාල පොදු අධිකාරියට යොමු කරන ලද තොරතුරු ඉල්ලුමකට අනුව, අදාල පොදු අධිකාරිය විසින් ප්‍රදාන ලබාදුන් ව්‍යවසායකයින්ගේ තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් නියමිත ක්‍රමවේදය ඔස්සේ 2022 ඔක්තෝබර් මස 07 වනදින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසන් සභාව වෙත සිදුකළ අභියාචනාවකට අනුව අභියාචනා අංක සෘඔෂක/චචැක/1116/2022 යටතේ 2023.ජනවාරි මස 26 වනදා දින සිදුකළ අභියාචනා විභාගයේදී එම තොරතුරු, ඉල්ලුම්කරුට ලබාදෙන ලෙස තොරතුරු කොමිසම ලබාදුන් නියෝගයෙන් පසුව අදාළ තොරතුරු ලබාදෙන ලදී. ඒ ආකාරයෙන් තොරතුරු ලබා දුන්නත් 2022.10.03 වන දින වන විට රුපියල් බිලියන 6කට අධික (6,049,683,907.88) මුදල් ප්‍රදාන ලබාදුන් ව්‍යවසායකයින්ගේ නම් අතරින් මහා පරිමාන ප්‍රදාන ලබාදුන් අය ඇතුළුව තවත් බොහෝ දෙනෙකුගේ නම් හෙළි කිරීම සිදු කිරීමට කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය මෙතෙක් කටයුතු කර නොමැත. මේ තුලින් තවදුරටත් තහවුරු කරන්නේ අදාළ පොදු අධිකාරිය විසින් නම් හෙළි කිරීමට නොහැකි පිරිසකට මෙම ප්‍රදාන ලබාදී තිබෙන බවයි.

එමෙන්ම මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම අංශ නව්‍යකරණ නමින් ආයතනයක් වෙනම ස්ථාපිත කර තිබේ. එහි ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල සුහුරුපායේ 16 වන මහලේ ඇති අතර ඊට අමතරව අම්පාර, ගාල්ල, වව්නියාව හා මහනුවර යන දිස්ත්‍රික්ක තුල ප්‍රාදේශීය කාර්යාල 04ක් ද පිහිටුවා තිබේ.

එමෙන්ම ලබාදුන් අනෙකුත් තොරතුරුවලට අනුව අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් ලෝක බැංකුවෙන් ලබාදුන් ණය භාවිත කරමින් ආයතනයේ අධ්‍යක්ෂවරයා ඇතුළු තවත් අධ්‍යක්ෂක මණ්ඩලයක් හා සේවකයින් හා ආයතනය නඩත්තු කිරීම වෙනුවෙන් හා ඔවුන්ගේ වැටුප් වෙනුවෙන් තවත් වියදම් රාශියක් සිදුකර තිබේ. 2022.ජූලි.30 දිනට එම වියදම් සිදුකර තිබෙන ආකාරය වන්නේ උපදේශන ගාස්තු - 42,975,696.69, ලිපි ද්‍රව්‍ය - 8,991,688.52, වෙනත් - 248,209,662.58, කාර්ය මණ්ඩල වැටුප් - 315,545,001.20, ප්‍රාග්ධන වියදම් - 124,673,307.53, තාක්ෂණික කමිටු වෙනුවෙන් - 14,702,000.00, ආදී ලෙස සමස්ත වියදම රුපියල් මිලියන 755කට (755,097,356.52) අධික මුදලක් වැයකර තිබේ. මිට අමතරව මෙහි නිලධාරීන්ගේ පුහුණු වැඩමුළු වෙනුවෙන් රුපියල් ලක්ෂ 19ක් (1940866) මෙන්ම රූපවාහිනී වැඩසටහන් වෙනුවෙන් තවත් රුපියල් මිලියන 12ක මුදලක් ඇතුළුව රුපියල් මිලියන 769කට අධික මුදලක් (769,038,222.52) ඉහත කටයුතු සියල්ල වෙනුවෙන් 2022.ජූලි.30 වනවිට පමණක් යොදවා තිබේ.


විශේෂයෙන්ම රටේ මහජන මුදල් මේ ආකාරයෙන් යොදවා ඇති මෙම පොදු අධිකාරිය, රටේ මහජනතාවගේ මූලික අයිතියක්ව පවතින තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ රෙගුලාසි ප්‍රකාරව නියමිත ආකාරයෙන් කටයුතු නොකිරීම හේතුවෙන් අදාල පොදු අධිකාරියෙන් කාලීනව තොරතුරු ලබාගැනීමට දැඩි අපහසුතාවයක් පවතින බව ද මෙහිදී අවධාරණය කළ යුත්තකි.

ජනතාවට විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම, ඕනෑම රාජ්‍ය ආයතනක වගකීමකි. එම විනිවිද භාවය තහවුරු වන එක් පැතිකඩක් වන්නේ ජනතාවට එම පොදු අධිකාරියේ තොරතුරු වෙත ප්‍රවේශ වීමට




අවස්ථාව ලබාදීමත්, එම තොරතුරු ජනතාවට නිසි ආකාරයෙන් ලබාදීමත් වේ. නමුත් එසේ තොරතුරු හෙළි කරමින් මේ සම්බන්ධයෙන් අප තොරතුරු ඉල්ලූ කිසිදු අවස්ථාවක ව්‍යවස්ථාපිත නියමයන් අනුව කටයුතු කිරීමට කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය- අගය දාම සංවර්ධන ව්‍යාපෘතිය(ASMP) කටයුතු නොකිරීමෙන්ම මෙම පොදු අධිකාරියේ විනිවිද භාවය සම්බන්ධයෙන් බරපතල ගැටළුවක් පුරවැසියන්ට ඇතිවීම නොවැළැක්විය හැකිය.

මේ ආකාරයෙන් මාස ගණනක් ගතකර ලබාගත් තොරතුරු අනුව 2022.07.18 දින වන විට මෙම ව්‍යාපෘතිය මගින් කාණ්ඩ තුනක් යටතේ ලබාදී තිබෙන සමස්ත ප්‍රධාන වටිනාකම රුපියල් බිලියන 6කට වැඩි බව හෙළිවිය(6,049,683,907.88). 2023 ජූලි මාසය පමණ වනවිට අවසන් කිරීමට නියමිත මෙම ව්‍යාපෘතිය තුළින් 2022.07.18 දින සිට මේ දක්වා තවත් පිරිසකට මේ ආකාරයෙන් ප්‍රදාන හා ඉතිරි වාරික මුදල් ද ගෙවීමට නියමිත අතර ඒ අනුව ඉහත මුදල ඊට වඩා ඉහල අගයක් ගනු ලැබේ. ව්‍යාපෘති වර්ග තුනක් යටතේ ප්‍රදාන ලබාදී තිබෙන මෙම ව්‍යාපෘතිය මගින් මහා පරිමාණ ව්‍යාපෘති 132ක් වෙනුවෙන් රුපියල් බිලියන තුනකට අධික මුදලක් (3,762,976,719.00), කුඩා පරිමාණ ව්‍යාපෘති 236ක් වෙනුවෙන් බිලියනයකට අධික මුදලක් ( 1,781,996,453.00) , පොකුරු ව්‍යාපෘති 602ක් වෙනුවෙන් රුපියල් මිලියන 504 කට අධික මුදලක් ( 504,710,735.88) ලබා දී තිබෙන බව ASMP මගින් සිදුකළ තොරතුරු ඉල්ලීමේදී දක්වා තිබේ,




## පරස්පර විරෝධී තොරතුරු

මෙම ව්‍යාපෘතියට අදාලව අවස්ථා කීපයක දී තොරතුරු ඉල්ලීම් කරනු ලැබුවත් ඒ සම්බන්ධයෙන් තොරතුරු ලබාදීම ප්‍රමාද කිරීම, තොරතුරු ලබා නොදීම මෙන්ම එකිනෙකට පරස්පර විරෝධී තොරතුරු ද ලබා දී ඇත්තේ කුමන කාරණයක් වසන් කරගැනීමට ද යන්න බරපතල ගැටලුවකි. ඒ ආකාරයෙන් 2022 අගෝස්තු මස 22 දින දක්වා කොපමණ පුද්ගලයින් සංඛ්‍යාවක් වෙනුවෙන් ප්‍රදාන ලබාදී තිබේද යන්න සිදුකළ විමසීමේදී 2022.08.05 දිනැති තොරතුරු ඉල්ලීම වෙනුවෙන් ප්‍රදාන ලබාදුන් අය 872ක් බව සඳහන් කර තිබේ. එමෙන්ම 2022.08 12 දරන ඉල්ලුමේදී එම ප්‍රදාන ලබාදුන් අයගේ ලේඛනය ලබාදෙන ලෙස සිදුකළ තොරතුරු ඉල්ලුමේදී අදාල ව්‍යාපෘතියේ තොරතුරු නිලධාරියා විසින් තොරතුරු පනතේ නොමැති වගන්තියක් දක්වමින් එම තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලැබුවත් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිසන් සභාව විසින් අභියාචනා අංක කෘඔකක/එචැ/ක/1116/2022 යටතේ 2023.ජනවාරි මස 26 වන දින ලබාදුන් නියෝග

යට අදාලව ලබාදුන්, ප්‍රදාන ලබාදුන් අයගේ තොරතුරු පරික්ෂා කිරීමේදී ප්‍රදාන ලබාගත් සංඛ්‍යාව 1211ක් පමණ වන බව හෙළිවිය. එසේ නම් රටේ සමස්ත ජනතාව ණයකරුවන් කරමින් විදෙස් ණය ලෙස ලබාගත් මුදල් ලබාදුන් මේ අය වෙනුවෙන් ගෙවා තිබෙන ඇත්ත මුදල කොපමණද? මේ ආකාරයෙන් ප්‍රදාන ලබාදුන් අයගේ නම් සඟවන්නේ ඇයි? ද යන්න අදාල පොදු අධිකාරියේ වගකිව යුතු නිලධාරීන් අනිවාර්යයෙන්ම හෙළි කළ යුතු සේම එසේ හෙළි නොකිරීම සම්බන්ධයෙන් පරික්ෂණයක් ද පැවැත්විය යුතු ය.

## මූල්‍ය පරිහරණය

පොදු අධිකාරියේ මුදල් පරිහරණයේදී ASMP හි නිලධාරීන් වෙත අසීමිත ලෙස බල තල ලබාදුන් ආකාරයක් ද මෙහිදී නිරීක්ෂණය වේ. මෙහිදී අයදුම්පත් කැඳවීම, ව්‍යාපෘති හා මුදල් ප්‍රදානය කරන පිරිස් තෝරාගැනීම, මුදල් ලබාදීම, ලබාදුන් මුදල් නිසි ලෙස ව්‍යාපෘතියට යොදවන්නේ ද යන්න සම්බන්ධයෙන් සොයා බැලීම ආදී සියලු කටයුතු පැවරී තිබුණේ ASMP නිලධාරීන් වෙත ය.

පරිපාලන සම්බන්ධයන් පුද්ගලයින් බඳවා ගත් ආකාරය සමබන්ධයෙන් තමන් නොදන්නා බවත් නමුත් මහා බණ්ඩාගරය හා ලෝක බැංකුව සමග එකතුවෙලා එය හදන්න ඇතිබව විශ්වාස කරන බව වැවිලි අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකිර්ති මහතා පවසා සිටි

"ප්‍රධාන ලබාගන්නා අය සමබන්ධයෙන් මහා බණ්ඩාගරය මගින් හා ASMP එක මගින් වෙන් වශයෙන් හොයල බලනවා නමුත් ඒ ඒ ආයතන ගැන වෙනස් නිගමනයන් තමයි තිබුනේ හෙතෙම කියා සිටියේය.

## සුජාත නොවූ ආයතන ප්‍රධානියෙක්

කෙසේ නමුත් අප විසින් සිදුකළ විමර්ශනයේදී අනාවරණය වූයේ ASMP හි ආයතන ප්‍රධානියා පත්කිරීමේදී මේ ලංකාවේ අනෙකුත් ව්‍යාපෘතිමෙන්ම දේශපලන හෝ වෙනත් හිතවත්කම් මත පත්කර තිබේද යන්න සැකයක් මතුවන්නේ මිට පෙර ඔහු නාවික හමුදාවේ ලුතිතන්වරයෙකු ලෙස කටයුතු කර ඉන් ඉවත්වූ කෙනෙකු වන අතර 2005 වර්ෂයේදී එවකට ආරක්ෂක ලේකම්වරයා ලෙස කටයුතු කළ ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සම්බන්ධිකරණ ලේකම්වරයෙකු ලෙස පෙනී සිටිමින් වව්නියාව තේක්ක වත්ත ප්‍රදේශයේ කාර්යාලයක් ද පවත්වාගෙන ගොස් තිබිණි.

අනතුරුව එක්සත් ජාතික පක්ෂ ආසන සංවිධායක ලෙස හා එක්සත් ජාතික පක්ෂ පළාත්සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කර තිබේ. 2015 මහ මැතිවරණයේදී එ ජා ප අපේක්ෂකයෙකු ලෙස මැතිවරණයට ඉදිරිපත්වී සිටින අතරතුර සමගි ජන බලවේගයට එක්වී ඇති අතර 2020 මැතිවරණයේදී ඔහු වෙනුවට ඔහුගේ බිරිඳ වන්නි දිස්ත්‍රික්කයේ මැතිවරණයට ඉදිරිපත්කර තිබිණි. වර්තමානයේ වව්නියාව දිස්ත්‍රික්කයේ සමගි ජනබලවේගයේ සංවිධායක ධුරය දරනුයේ ASMP ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයාගේ බිරිඳ ය. මෙහි ඇති සුවිශේෂී අනෙක් කරුණ වන්නේ අදාල අධ්‍යක්ෂවරයා කෘෂිකර්මාන්තය සම්බන්ධයෙන් සුදුසුකම් ලද්දෙක් නොවීමයි.

## හිතමිතුරන් අතර බෙදීගිය මහජන මුදල්

ප්‍රජාතන්ත්‍රවාදී රටක තම තමන් කැමති ඕනෑම දේශපාලන මතයක් දැරීමට හා නිරත වීමට ඕනෑම පුද්ගලයෙකුට හැකියාවක් තිබේ, ප්‍රශ්නය ඇත්තේ මේ ආකාරයෙන් දේශපාලන සබඳතා රැසක් තිබෙන පුද්ගලයෙකු මෙවැනි ආකාරයෙන් මිලියන ගණනක මහජන මුදල් පරිහරණය වෙනුවෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂකවරයෙකු ලෙස මෙවැනි තනතුරකට පතික්රිමේ දී එම තනතුර සඳහා දේශපාලනය බද්ධවිම නොවැලැක්විය හැකි වීමයි.

මේ සම්බන්ධයෙන් අප කළ විමර්ශනයේදී පැහැදිලිවම එය අනාවරණය වූයේ අදාළ අධ්‍යක්ෂවරයාගේ බිරිඳගේ වව්නියාව නගරයේ ඇති දේශපාලන කාර්යාලයේ සේවය කරන ශානිකා උදයංගනී නමැති කාන්තාවකට "ය්බස බ්බන් නමැති ව්‍යාපෘතියක් වෙනුවෙන් රුපියල් දසලක්ෂ හැටනවදාස් හත්සියයක (1069700 ) මුදලක් ලබාදී තිබීමෙනි , එමෙන්ම අප අදාල කාන්තාව හමුවීමට යන අවස්ථාවේ ද ඇය රැදී සිටියේ ජාතික ජනබලවේගයේ වව්නියාව අදාළ කාර්යාලයේ වන අතර අපකළ ප්‍රශ්න කිරීමේදී ඇය කියා සිටියේ ධාන්‍යනය වර්ග කොටා පැකට්කර විකිණීම වෙනුවෙන් ඇයට එම මුදල ලබාදුන් බවත් අදාළ යන්ත්‍රය මිලදී ගැනීමට රුපියල් ලක්ෂ තුනහමාරක පමණ මුදලක් යෙදවූ බවත් ය. නමුත් ව්‍යාපෘති යෝජනාවේ පැහැදිලිව සඳහන් කර ඇත්තේ අදාල ව්‍යාපෘතියේ ඒ සඳහා රුපියල් විසිඑක් ලක්ෂ විසි දෙදාස් හාරසියයක් (21,22,400) පමණ වැය වන බවයි. එමෙන්ම ඇයගේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන බවට සඳහන් වව්නියාව මහකච්චිකුඩිය ප්‍රදේශයට ගියත් එවැනි ව්‍යාපෘතියක් ක්‍රියත්මක වන බව සොයා ගැනීමට නොහැකි වූ අතර ප්‍රදේශවාසින් කීපදෙනෙකු ද කියා සිටියේ ප්‍රදේශයේ ඇති එවැනි ව්‍යාපාරයක් ගැන නොදන්නා බවයි. ඒ සම්බන්ධයෙන් ශානිකා උදයංගනී නැමති අයගෙන් කළ විමසීමේදී ඇය කියා සිටියේ අදාල යන්ත්‍රය ඇත්තේ ගේ ඇතුලේ බවයි. මිට අමතරව එම ප්‍රදේශයේම ලිපිනයක් ඇති උසවිහ් ඡරදාමජඑ නැමති ආයතනයක් වෙනුවෙන් තවත් රුපියල් දසලක්ෂ තිස් හයදාහක මුදලක් ලබාදී ඇති අතර එම ලිපිනයේ එසේ ව්‍යාපාරයක් නොමැති අතර අප කළ සොයා බැලීමේදී අනාවරණය වූයේ එම ප්‍රදානය ලබාදුන් අය සැබෑ පදිංචි ගම අලුත්වත්ත ප්‍රදේශය බවය. එමෙන්ම ඔහුද ශානිකා උදයංගනී නමැති අයගේ ඥාතියෙකු බවය. නමුත් අදාල පුද්ගලයා මෙම ප්‍රදානය ලබාගැනීමෙන් පසු මියගොස් තිබෙන බව ප්‍රදේශ වාසීන්ගෙන් කළ විමසීමකදී අනාවරණය




විය.

මීට අමතරව හිටපු නාවික හමුදාපතිවරයෙකුට අයත් ව්‍යාපෘතියක් වෙනුවෙන් තවත් රුපියල් කෝටි ගණනක පමණ ප්‍රදානයක් ලබාදී ඇති අතර ඔහු හා මෙම ව්‍යාපෘතියේ අධ්‍යක්ෂකවරයා අතර පවතින්නේ කුමන හිතවත් කමක්ද යන්න අධ්‍යක්ෂකවරයාගේ ඉහත සඳහන් තොරතුරුවලින් මනාව පෙනී යන කරුණකි. එමෙන්ම කළුතර ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන තවත් ව්‍යාපාරයක් වෙත ද මේ ආකාරයෙන් මුදල් ලබාදී ඇති අතර එයද අධ්‍යක්ෂවරයාට සම්බන්ධ අයෙකුට අයත් එකක් බව ද පැවසේ. මේ සම්බන්ධයෙන් කරුණු දැනගැනීමට කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය-අගයදාම සංවර්ධන ව්‍යාපෘතියේ(ASMP) අධ්‍යක්ෂක රෝහණ ගමගේ මහතා සම්බන්ධ කරගැනීමට අවස්ථා කීපයකදී දින කීපයක් උත්සහ කරනු ලැබුවත් එය ව්‍යර්ථ විය.

## ව්‍යාපෘතිවල සැබෑ තත්වය

විශේෂයෙන්ම මේ ආකාරයෙන් ඩොලර් මිලියන 61 ක පමණ ණය මුදලක් තුලින් ක්‍රියාත්මක කළ මෙම ව්‍යාපෘතියේ සබෑ තත්වය ගවේෂණය කිරීම වෙනුවෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ ASMP මගින් ලබාදුන් පුද්ගල තොරතුරු මත වව්නියාව, අනුරාධපුර, වැලිමඩ, බණ්ඩාරවෙල, නුවරඑළිය, මඩු, හම්බන්තොට, මාතර ආදී ප්‍රදේශ කීපයක අහඹු ලෙස තෝරාගත් ප්‍රදාන ලබාගත් පුද්ගලයින් අතරින් 60 දෙනෙකුගේ පමණ ව්‍යාපෘති සම්බන්ධයෙන් අප විසින් සොයා බැලීම සිදුකරන ලදී. මෙම ගවේෂණයට පාදක කොට ගත්තේ ඔවුන් විසින් ලබාදුන් තොරතුරුවල සංක්ෂිප්තයකි.





මෙම වැඩසටහන මගින් මහා පරිමාණ ව්‍යාපෘති වෙනුවෙන් ව්‍යවසායකයින් 132කට අධික ප්‍රමාණයක රුපියල් බිලියන තුනකට අධික මුදලක් (3,762,976,719.00). ලබා දී ඇති අතර එම ප්‍රදාන ලබාදුන් අයගෙන් බොහෝ දෙනෙකු ලංකාවේ ඒ වනවිටත් සාර්ථකව තම ව්‍යාපාර සිදුකරගෙන ගිය පිරිස් වේ. බොහෝ අවස්ථාවල රුපියල් මිලියන 20 සිට 50 දක්වා ඔවුන්ට ප්‍රදාන ලෙස ලබාදී තිබේ. මෙම මුදල් ලබාදීමෙන් එම ව්‍යාපාර තුලින් අමුතුවෙන් ලංකාවට විදේශ විනිමය ගෙන ඒමක් සිදුනොවන්නේ, එම ව්‍යාපාර ඒ වනවිටත් සාර්ථකව ව්‍යාපාර සිදුකර ගෙන යන නිසාවෙනි. බොහෝ

අවස්ථාවල මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වය පෙන්වීමට මෙම ව්‍යාපාර යොදාගැනීමට කටයුතු කිරීමේ අදහසින් මේ සඳහා ප්‍රදාන ලබාදුන්නාද? නැතිනම් තම හිතවතුන් හෝ වෙනත් දේශපාලඥයින්ගේ ව්‍යාපාර වෙනුවෙන් ප්‍රදාන ලබාදීම වෙනුවෙන් මෙවැනි තෝරාගැනීමක් සිදු කළා ද යන බරපතල සැකය මතුවන්නේ ඒ අතර ඇති අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් සොයා බැලීමේදී වේ.

ඉහත කාරණාව තහවුරු වන්නේ මිගමුව බෝලගල ප්‍රදේශයේ පස් කපා අත්හරින ලද වලක ඉදි කළ පාවෙන හෝටල්(ඊදක්ටික් සකද්එසබට සඍදරළ ) සංකීර්ණයයි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු ගත මුදල රුපියල් මිලියන 425ක් (425859250) වන අතර එම ව්‍යාපෘතිය වෙනුවෙන් ASMP ය මගින් රුපියල් මිලියන 75ක (75000000) මුදලක් ප්‍රදානයක් ලෙස ලබාදී තිබේ. නමුත් අද වනවිට එම ව්‍යාපෘතිය ද නවතා ඇති අතර ඉන් සිදුව ඇත්තේ ලෝක බැංකුවෙන් ලබාදුන් රුපියල් කෝටි හතහමාරක ජනතා මුදල් අපතේ යාමක් පමණි. විශේෂයෙන්ම මෙම ස්ථානයේ පස් කැපීම වෙනුවෙන් භූවිද්‍යා හා පතල් කාර්යාංශය වෙත මෙම ස්ථානය නැවත ගොඩ කිරීම වෙනුවෙන් රුපියල් මිලියනයක තබන ලද ඇපකරය ද මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම නිසා නිදහස් කර තිබෙන බව තොරතුරු දැනගැනීමේ පනත මගින් ලබාගත් තොරතුරු මගින් අනාවරණය විය. රුපියල් මිලියන ගණනක් වැයකර තනන ලද මෙම ව්‍යාපෘතිය තුලින් අදට ඉතිරිව ඇත්තේ පස් කපා අත්හරිනලද වැලක් හා රට ණය වීමක් පමණි. මෙම සියල්ල මගින් මෙම ව්‍යාපෘතියේ සැබෑ තත්වය මොනවාට කියාපාන්නේද?





(ඉහත ඡායාරූප - අන්තර්ජාලයේ ඇති බෝලගල සහ සැබෑ බෝලගල )

මෙම ව්‍යාපෘතිය යටතේ ඉතා සාර්ථක ව්‍යාපෘති කීපයක්ද සිදුකරගෙන යන බව පැවසීමට තරම් අප නිහතමානි විය යුතු ය. එම සාර්ථක ව්‍යාපෘති අතර පොකුරු ව්‍යාපෘතියක් වන වැලිමඩ රාවන ඇග්‍රෝ ආයතනය එකකි. ප්‍රශ්නය ඇත්තේ මේ ආකාරයෙන් ව්‍යාපෘති කීපයක් සාර්ථක වීම ලංකාවේ සියලු පුරවැසියන් ණයකරුවන් කරමින් ලෝක බැංකුව විසින් ලබාදුන් මෙම ඩොලර් මිලියන 61ක පමණ මුදල උපයාගැනීමට සරිලන නිෂ්පාදනයක් ඒ තුලින් සිදු කිරීමට හැකිවේදැයි යන ප්‍රශ්නය වේ.

## මඟ නතරවූ ව්‍යාපෘති

විශේෂයෙන්ම මෙම ප්‍රදාන ලබාදීමට අදාල ව්‍යාපෘති හිමියන් ව්‍යාපෘති වාර්තාවක් සකසා දීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය මත සැකසු නිර්නායක සැලකිල්ලට ගෙන ප්‍රදාන හිමියන් තෝරාගනු ලැබේ. එහිදී ඔවුන් විසින් ඉදිරිපත්කරනු ලබන ව්‍යාපෘතියේ සම්පූර්ණ වටිනාකමින් 60%ක මුදලක් ව්‍යාපෘතිය මගින් ලබාදෙන අතර අනෙක් 40% අදාල ප්‍රදාන හිමියා විසින් දරනු ලැබිය යුතුය. මෙහිදී බොහොමයක් ප්‍රදාන හිමියන් තමන් විසින් දැරියයුතු 40%ක මුදල ලබාගෙන ඇත්තේ බැංකු ණය මගිනි. මේ වනවිට නවතා තිබෙන ව්‍යාපාර හිමියන් බොහෝ දෙනෙකුට තමන්ගේ ව්‍යාපෘතියෙන් උපයාගන්නා මුදලට වඩා ණය වාරික ගෙවීමට සිදුවීම හේතුවෙන් එම ව්‍යාපෘති පවත්වාගෙන යාමට නොහැකිවීම හේතුවෙන් අතරමඟ නවතා තිබෙන බව ද මෙම විමර්ශනයේදී අනාවරණය වූ දෙයකි.

ඒ ආකාරයෙන් බෙල්පෙපර් වගාවක් වෙනුවෙන් රුපියල් ලක්ෂ 16ක පමණ ප්‍රදානයක් ලබාගත් වැලිමඩ ප්‍රදේශයේ රොෂාන් රණසිංහ මහතා ආරම්භ කරන ලද ව්‍යාපෘතිය ද මේ වන විට ඒ ආකාරයෙන් නවතා ඇති එක් ව්‍යාපෘතියකි "මගේ සම්පූර්ණ ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් ලක්ෂ 31ක් විතර. ඒකෙන් ලක්ෂ 16ක් විතර තමයි ව්‍යාපෘතියෙන් දෙන්න අනුමත වුණේ. ඒකෙන් මේ වනවිට ලක්ෂ අටකට වැඩි මුදලක් අරගෙන තියෙනවා. ඒ මුදල් ලැබෙනකොටත් මගේ වගා කටයුතු වෙනුවෙන් ග්‍රීන්හවුස් ගහන්න ලක්ෂ 50ක් විතර මම යොදවල තිබුණා. ඒ සල්ලි ගත්තේ බැංකුවකින් ණයට. ඒ ණය තාම මම ගෙවනවා".

අප ඔහු සමඟ කළ කතාබහේදී අනාවරණය වූයේ ව්‍යාපෘතිය ආරම්භයේදී 50ක පමණ සේවක පිරිසක් සිටි ඔහුගේ ව්‍යාපෘතිය තුල අද වනවිට ඇත්තේ දෙදෙනෙකු පමණක් බවයි. එයද නිසියාකාරව ක්‍රියාත්මක නොවන බව අප එහි කළ නිරීක්ෂණයේදී තහවුරු වි ය.





(රොෂාන් රණසිංහගේ ව්‍යාපෘතියේ වර්තමාන ස්වභාවය)

එමෙන්ම ලකිඳු ග්‍රීන් හවුස් ව්‍යාපෘතිය සිදුකරගෙන යනු ලබන බුද්ධික මානවඩු මහතා කියා සිටියේ මෙවන් අදහසක්. "මගේ ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් ලක්ෂ 71ක් අනුමත වුණා. ඒකෙන් ලක්ෂ 35ක් විතර (359000) මුදලක් මුලින් ලබාදුන්නා. ආධාර ගන්න කලින් වර්ග අඩි 2000ක ග්‍රීන් හවුස් එකකුත් මට තිබ්බා. මේ ව්‍යාපෘතිය වෙනුවෙන් මේ වනවිට මම බැංකු දෙකකින් ලක්ෂ 40ක් ණයට අරගෙන තියනවා. ඒ වෙනුවෙන් මාසයකට වාරික මුදල් ලක්ෂයක් විතර ගෙවනවා".

ව්‍යාපෘතිය අඩපණ වෙන්න භාණ්ඩ මිල මෙන්ම ග්‍රීන් හවුස් තුල වගා කිරීමේදී කෘෂි රසායන ද්‍රව්‍ය යෙදීම වැඩි වීම නිසා අධික මුදලක් වැයවීමත්, රිලවුන් නිසා ග්‍රීන් හවුස් තුලට සිදුවන හානියත් බලපා තිබෙන බවයි ඔහු කියා සිටියේ. කෙසේ නමුත් ලාබයක් නොලැබුණත් ඔහු මේ වන විටත් එම වගා කටයුතු සිදු කරමින් තිබේ.



(ලකිඳු ග්‍රීන් හවුස්)



(වැලිමඩ දළුක්වැල්ල ප්‍රදේශයේ රත්නගාම්)

එමෙන්ම අප තොරතුරු දැනගැනීමේ පනත යටතේ සිදුකළ විමසීමේදී ලබාදී තිබෙන තොරතුරු අතර වව්නියාව සින්නපුදුකුලම් ප්‍රදේශයේ ඔය්පච් ඔදමරසිඑ ාදඑැක ) සබබ (ඡඪඹ) කළුා යන ආයතනයක් වෙනුවෙන් ලක්ෂ 95ක පමණ මුදලක් අනුමත කර තිබෙන අතර ඒ වෙනුවෙන් මේ වනවිට ලක්ෂ 85කට අධික මුදලක් (8550000) ලබාදී තිබේ. අප එහි කළ ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අනාවරණය වූයේ ඔය්පච් ඔදමරසිඑ ාදඑැක ) සබබ (ඡඪඹ) කළුා යන ආයතනයක් නොමැති බවත් ඒ ආකාරයෙන් අරමුදලක් ලබාදී තිබෙන්නේ ඔය්පච් එදාැක ඊරප යන ආයතනයක් වෙනුවෙන් පිච්චමල් වගා කර ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු වෙනුවෙන් බවයි, නමුත් එම ආයතනයද මේ වනවිට ක්‍රියාත්මක නොවන අතර අනාරක්ෂිත ගොඩ නැගිල්ලක දමා ඇති ලක්ෂ ගණනක යන්ත්‍ර කීපයක් පමණක් දැකගැනීමට හැකිවිය.






(Thampa Model Farm)





ඉහත සඳහන්කර ඇත්තේ අප විසින් සොයාගනු ලැබූ ව්‍යාපෘති කීපයක් පමණි. මේ ආකාරයෙන් ලෝක බැංකුවෙන් පොලී මත ගෙන ප්‍රදාන ලෙස බොහෝ පුද්ගලයින් හට ලබා දී තිබෙන මුදල් නිසි අයුරින් ව්‍යාපෘති වෙනුවෙන් යොදා නොගැනීම හේතුවෙන් සිදුවී ඇත්තේ රටේ සියලු ජනතාව ණයකරුවන් වීමක් පමණි.

## අසාර්ථක වීමට බලපා ඇති හේතු

විශේෂයෙන්ම මෙහි බොහෝ ව්‍යාපෘති අසාර්ථක වීම කෙරෙහි බලපෑ හේතු රාශියක් සාර්ථක හා අසාර්ථක වූ ප්‍රදානලාභීන් විසින් අනාවරණය කරන ලදී, එහිදී වෙළඳපොළට ගැලපෙන තරඟකාරිත්වයක් නොමැති නිෂ්පාදන සිදුකිරීමට ගොවින් හෝ නිෂ්පාදකයින්ට ප්‍රදාන ලබාදීම ඉන් එකකි. එමෙන්ම නියමිත නිෂ්පාදන අලෙවි කිරීම සඳහා වෙළඳපොළක් තනා නොතිබීම හේතුවෙන් බොහෝ ගොවින් හා නිෂ්පාදකයින්ට සිදුවන අලාභය නිසා තම ව්‍යාපාර මඟ නතර කර තිබිණි.

එමෙන්ම රජයේ නිසි විමර්ශනයක් නොතිබීම තුල බොහෝ ප්‍රදානලාභීන් අස්වැන්න වැඩිකර ගන්නට උත්සහ කරනවාට වඩා ව්‍යාපෘතිය පෙන්වීමට පමණක් වගා කිරීම් හා නිෂ්පාදනයන් කිරීම මෙහිදී සිදුකළ විමර්ශනයේදී අනාවරණය වූ දෙයකි.

## බලධාරීන්ගේ අදහස්

මේ සම්බන්ධයෙන් වැවිලි අමාත්‍යාංශයේ ලේකම් ජානක ධර්මකිරිති මහතාගෙන් සිදුකළ විමසීමේදී ඔහු කියා සිටියේ මෙම ව්‍යාපෘතිය තුල යම් අක්‍රමිකතා ඇති බවට පරීක්ෂණයක් පවත්වා තහවුරු වුවහොත් ඒ සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ග ගන්නා බවයි.

" නියමිත ආකාරයෙන් ව්‍යාපෘති සිදුකරලා නැත්නම් පරීක්ෂණයක් තියලා ඒවා නැවත අයකර ගන්න ඕන- මේ අය සමග යම් ගිවිසුමක් අත්සන් කරගෙන තියෙනවද කියල හොයන්න ඕන.නමුත් නිශ්චිත තොරතුරු මත පරීක්ෂණයක් කරන නැවත ඒවා අයකරගන්නවා. ඒ වගේම නිශ්චිත වංචාවක් සිදුකරලා තියෙන. දැනටත් මේ සම්බන්ධයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේ විමර්ශනයක් යනවා."

"ඒ වගේම මේ ණය මුදලෙන් තව ඉතිරිවෙලා තියෙන්නේ රිපියල් මිලියන 10ක් 11ක් වගේ ප්‍රමාණයක් විතරයි ඒක අලුතින් ප්‍රධාන දෙන්න කටයුතු කරන්නේ නෑ දීපු අයගේ ඉතිරි කොටස් ලබාදෙන්න තියෙන අය තාම ඉන්නවා" බව ජානක ධර්මකිරිති මහතා වැඩි දුරටත් කියා සිටියේය.

එමෙන්ම රටකට විදේශ ණය හෝ ආධාර ලබාදීමේදී එසේ ලබාදෙනු ලබන ආයතනය මගින්ද ඒ සම්බන්ධයෙන් නිසි විමර්ශන කටයුතු මෙන්ම අධීක්ෂණ කටයුතු සිදු කිරීම කළ යුතුය. මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලෝක බැංකුව කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන් අප ලෝක බැංකුවේ ශ්‍රී ලංකා කාර්යාලයේ නියෝජිතයින්ගෙන්ද විමසීමක් කළ අතර එහිදී ලෝක බැංකුව කියා සිටියේ ලෝක බැංකුව රටක ව්‍යාපෘතියකට මුදල් ණයට දුන්නත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්නනේ එම රටේ රජය මගින් බවයි.

"ලෝක බැංකුව නිරන්තරයෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහය මෙහෙයුම් ලබා දෙනවා. එම සහය මෙහෙයුම් සිදුකිරීමේදී ලෝක බැංකුව ව්‍යාපෘති කළමණාකරන අංශ, ව්‍යාපෘතියේ ප්‍රතිළාභීන් සහ මුදල් අමාත්‍යාංශය වැනි වෙනත් කොටස්කාර පාර්ශව සමගත් හමුවී සාකච්ඡා පවත්වනවා".

ලෝක බැංකුවට අනුව එහිදී රජය ප්‍රතිලාභීන් තෝරා ගනු ලැබුයේ විස්තීරණ තෝරා ගැනීම් පටිපාටියක් හරහා වන අතර ඒ ව්‍යාපෘති වාර්තා ණය ප්‍රධානයේ ඉලක්ක සහ ලෝක බැංකුවේ පරිසර සහ සමාජ ආරක්ෂණ තත්ව අවශ්‍යතා සපුරනවා ද කියා සොයා බැලීමෙන් පසුව අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් ප්‍රතිලාභීන් තෝරා ගෙන තිබේ.

"අපි ලෝක බැංකුව ලෙස මාස හයකට වරක් මෙම ව්‍යාපෘති අධීක්ෂණය කරනවා ණය ප්‍රධානයේ සංවර්ධන ඉලක්ක වෙත ලගා වෙනවාද සොයා බලන්නී

ප්‍රතිලාභීන් තොරා ගැනිමේදි ලෝක බැංකුව කිසිසේත් දායක වී නොමැතිබවත් එය ව්‍යාපෘතියේ එය කෙරුනේ අධ්‍යක්ෂක මණ්ඩලයක් මගින් බව මෙන්ම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධයෙන් විටින් විට අධික්ෂණය කළ බවද මෙහිදී අනාවරණය විය.

"ශ්‍රී ලංකාව සමග මෙම ණය ගිවිසුමේ ප්‍රතිලාභීන් ට තිබිය යුතු සුදුසුකම් සඳහන් කරලා තියෙනවා. ව්‍යාපෘතිය ආරම්භයේ ප්‍රතිලාභීන් ගේ ලයිස්තුවක් අපට ලබා දීලා

තියෙනවා. ඒක බලද්දි නම් ප්‍රශ්නයක් මතුවුනේ නැහැ. ඒත් යම් යම් අවස්ථාවලදි අපි ඒකෙ සටහන් තියන්න ඇති අපේ යෝජනා දක්වලා."

ව්‍යාපෘතිය ක්‍රියාත්මක විය යුත්තේ ණය ප්‍රධාන එකගතාවයන්ට අනුකූලව බවද ලෝක බැංකු නියෝජිතයන් අවධාරණය කරන ලදී.නමුත් ඒ අනුව මෙම ව්‍යාපෘතිය සුජාත බාවයකින් ක්‍රියාත්මක වී ඇත්ද යන්න ඉහත දක්වන කරුණු අනුව බරපතල ප්‍රශ්නයක් මතු වේ.

එමෙන්ම පසුගිය වසරේ අවසන් කළයුතුව තිබූ මෙම ව්‍යාපෘතියේ කාළය ශ්‍රී ලංකා රජයෙන් කරන ඉල්ලීමක් මත දීර්ඝ කර තිබේ."මෙම ව්‍යාපෘතිය මාස 18 කාළයකට දීර්ඝ කරලා තියෙනවා. රජය තවත් මාස 18 දීර්ඝ කිරීසක් ඉල්ලලා තියෙනවා. බොහෝ විට එම ඉල්ලීමටත් ලෝක බැංකුව එකගවෙයි. ඊට පස්සෙ නම් දීර්ඝ කරන එකක් නැහැ. කොවිඩ් ආපදාව සහ ආර්ථිකයේ කඩාවැටීම් සැලකිල්ලට ගනිමිනුයි මෙම දීර්ඝ කිරීම් අනුමත කෙරුනේ."

"ලෝක බැංකුව සියළු මුදල් එකවර දෙන්නෙ නැහැ. ණය මුදලින් ප්‍රයෝජනයට නොගත් මුදල් ශ්‍රී ලංකා රජයේ ගිණුමට බැර වෙන්නේ නැහැ. ඒත් එම මුදල් ව්‍යාපෘතිය සඳහා පාවිච්චි නොකලොත් නම් ඒක හරි අපරාධයක්."

## රටට බරක්වූ ණය

ලෝක බැංකුවට ව්‍යාපෘති තෝරා ගනු ලැබුයේ ඒ මගින් ආර්ථිකයට ඇතිවන ප්‍රතිලාභ, නිපදෙන නව අපනයන භාණ්ඩ සහ උත්පාදනය වන රැකියා අවස්ථාවනුත් සැළකිල්ලට ගනිමින් උඅවද මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් අප කළ සොයා බැලීමකදී බොහොමයක් ව්‍යාපෘති තුලින් එවැනි කරනා ඉටු කිරීමට මෙන්ම ව්‍යාපෘතිය නිසි අයුරින් පවත්වාගෙන යාමටද නොහැකි තත්වයක් උඩ වී තිබේ.

රජය මෙම ව්‍යාපෘති සඳහා ආයෝජන කරන සෑම රුපියලක් සඳහා අමතරව රුපියල් දෙකක ප්‍රතිලාභයක් රජයට ලබා ගැනීම ලෝක බැංකුවට අනුව මෙම ව්‍යාපෘතියේ තවත් අරමුණකි. ඒ තුලින් කියා වෙන්නේ මහජනතාවගේ බදු මුදලින් ආයෝජනය කරන සෑම රුපියලක් සඳහා සිදුවන සංවර්ධන යෙන් රැපියල් දෙකක් ලැබෙන බවයි.

කෙසේ නමුත් මේ සියලු කාරණා ඔස්සේ මෙම ව්‍යාපෘතියේ සබැ තත්වය ගැන සැලකිල්ලට ගැනීමේදී මනාව පෙනී යන කාරණයක් වන්නේ ලෝක බැංකුව පවා නොමග යවමින් රටේ ණය බර වැඩිකර සියලු පුරවැසියන්ගේ එක පුද්ගල ණය බර තවත් වැඩිකිරීමට මෙම ව්‍යාපෘතිය කටයුතු කර තිබෙන බවයි. එමෙන් මේ සම්බන්ධයෙන් තවත් විමර්ශනයකට පමණක් සිමා නොවූ නිසි විමර්ශනයක් සිදුකොට වග කිවයුතු සියලු නිලධාරීන්ට එරෙහිව නිතිය ක්‍රියාත්මක කිරීම ජනතාවට වගකියන වග වන රජයක වගකීමකි, යුතුකමකි.

## 'මත්තල ගුවන් තොටුපල'
## ශක්‍යතා අධ්‍යයනය
## ඉදිකිරීම් සහ මෙහෙයුම්
## වසර දහයක් තුළ මිලියන 58,136 ක පාඩුවක්

**ආර්. රාම්**

මෙරට දෙවැනි විශාලතම ජාත්‍යන්තර ගුවන් තොටුපළ වන මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ඉදිකිරීම් සහ මෙහෙයුම් ආරම්භ කිරීමේ ප්‍රමාදය දිගින් දිගටම සිදුවෙමින් පවතී.

"2009 වසරේ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීම ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකළ බව" හිටපු ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා නිලධාරියෙක් පැවසීය.

"හම්බන්තොට වරාය ඉදිකිරීමේදී සිදු වූවාක් මෙන් ගුවන් තොටුපළ සඳහා නිසි ශක්‍යතා අධ්‍යයනයක් සහ ආයෝජන විශ්ලේෂණයක් එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ප්‍රමුඛ රජය විසින් සිදු කළේ නැත." එම නිලධාරියා තව දුරටත් පැවසීය.

ඒ සමඟම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ කරන ලද අයදුම්පත්‍රයකින් මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ඉදිකිරීම සඳහා සකස් කළ අධ්‍යයනය සහ වාර්තාව සම්බන්ධයෙන් කළ විමසීමකට පිළිතුරු දුන් ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම "එය අභ්‍යන්තර ගුවන් තොටුපළ සහ ගුවන් සේවා ව්‍යුහයේ දෙපාර්තමේන්තු ඉංජිනේරුවන් විසින් සිදු කරන ලද" බව සඳහන් කළේය.

කෙසේ වෙතත්, ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම එහි දෙපාර්තමේන්තු ඉංජිනේරුවන් විසින් සිදු කරන ලද ශක්‍යතා අධ්‍යයන වාර්තාව ලබාදීමට හෝ ප්‍රසිද්ධ කිරීමට සූදානම් නැත.

මේ අතර, "මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කළේ නම්, ගුවන් තොටුපළ මෙම තත්වය උදා නොවනු ඇත," සිංගප්පූරුවේ විශ්ව විද්‍යාලයේ අනේවාසික පර්යේෂක මහාචාර්ය සුලනි අතානායක මහත්මිය පැවසුවාය.

එසේම, "වන සතුන්ගේ සැරිසරණය නිසා ඇති වන අනතුරුදායක තත්ත්වයන්, ගුවන් සමාගම් සමඟ සම්බන්ධීකරණය නොමැතිකම, දේශීය හා භූ දේශපාලනික ගැටළු වලට මුහුණ දීම සහ ආදායම් උත්පාදනය සඳහා දිගුකාලීන සැලැස්මක් නොමැතිකම" ඇතුළු පසුබෑමකට ලක්වීමේ හැකියාවක් නොමැති බව ඇය පෙන්වා දුන්නාය.

මේ අතර, "1971 සහ 2006 අතර, විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපළක් පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාව විවිධ කලාපවල ස්ථාන නවයක් ඇගයීමට ලක් කර ඇත. කෙසේ වෙතත්, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා භූමිය තෝරා ගැනීමේදී දැනටමත් හඳුනාගෙන ඇති ස්ථාන හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන් සමඟ නිසි සැසඳීමක් සිදු වූ බවට කිසිදු සාක්ෂියක් නොමැත," වෛද්‍ය සුලනි අතානායක මහත්මිය ඇයගේ "මත්තලඃ හුදකලා ගුවන් තොටුපළකට ව්‍යාපාර ආකර්ෂණය කර ගැනීම්" නම් පර්යේෂණ පත්‍රිකාවේ සමාප්තියේ පෙන්වා දී ඇත.

මේ අතර මත්තල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව "සීමාසහිත චයිනා හාබර් ඉංජිනියරින් කෝපරේෂන් සමාගමට" ප්‍රශ්නාවලියක් නොඉල්ලමින් සෘජුවම ලබාදී ඇත. චීන සහ ශ්‍රී ලංකා රජයන් අතර දීර්ඝ කාලීන ද්විපාර්ශ්වික සබඳතා ඊට හේතුව බව දෙපාර්ශ්වයම පවසා ඇත.

ඉංජිනේරු සැලසුම්, ඉංජිනේරුවන්ගේ සැලැස්ම, ගුවන් පථ ඉදිකිරීම, අපද්‍රව්‍ය පද්ධති, මඟී පර්යන්තය, පාලන මැදිරිය, පැකේජ ආරක්ෂණ ගොඩනැගිල්ල, ගිනි හා ගලවා ගැනීමේ පහසුකම, මාර්ගෝපදේශ සහ ගොඩබෑමේ ආධාර, ජල සැපයුම, විදුලිය, අපද්‍රව්‍ය

බැහැර කිරීම ඇතුළු සියලුම අංශ සඳහා සමාගම වගකිව යුතුය. විදුලි සංදේශ, බිම් නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා ගිවිසුම් ද නිකුත් කරන ලදී.

ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා අපේක්ෂිත වූ මුළු වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 209ක් බව දැකගත හැකිවිණි. ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා වූ වියදම ඇමෙරිකානු ඩොලර් මිලියන 243.7කින් වැඩි විය. මේ අනුව, ව්‍යාපෘතියේ පිරිවැය අපේක්ෂිත වියදමට වඩා ඇමෙරිකානු ඩොලර් මිලියන 34.7කින් හෙවත් සියයට 16.6 % වැඩි විය.

ඉදිකිරීම් අවසන් කිරීමට වැය කිරීමට අපේක්ෂිත වූ මුදලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 190ක් චීන එක්සිම් බැංකුවේ ණය ආධාර යටතේ සුරක්ෂිත කල අතර ඉතිරි ඇමෙරිකානු ඩොලර් මිලියන 19 දේශීය අරමුදල් හරහා ලබා ගැනීමට තීරණය කොට තිබිණි.

ඒ සමගම තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ඉල්ලා සිටි මුදල සම්බන්ධයෙන් කළ විමසුමකට පිළිතුරු දෙමින් ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ප්‍රකාශ කර ඇත්තේ චීනයේ එක්සිම් බැංකුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 190 ණය මුදලක් ලබා දෙනු ඇතැයි අපේක්ෂා කළ බවත් නමුත් බැංකුව විසින් ලබා දෙනු ලැබුයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 189.8ක් පමණක් බවත්ය.

එම ණය මුදල , වසර 5ක සහන කාලය අවසන් වීමෙන් පසු 25%ක පොලියක් සමඟ 2015 වසරේ සිට වසර 15ක් ඇතුළත වාරික වශයෙන් ගෙවිය යුතු බවට චීනයේ එක්සිම් බැංකුව කොන්දේසියක් පනවා තිබීමද සැලකිය යුතු කරුණකි..

එසේම, ගුවන් තොටුපළ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ නිම කිරීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 243.7 ක් වූ අතර, ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 53.7 ක දේශීය අරමුදල් අවශ්‍ය විය. එය ආරම්භයේදී වැය කිරීමට අපේක්ශා කල දේශීය අරමුදල්වලට වඩා ඩොලර් මිලියන 34.7 කින් නැතහොත් 182% කින් වැඩි ය.

කෙසේ වෙතත්, එය දේශීය අරමුදල් හරහා ලැබුණු යාන්ත්‍රණ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් පෙන්නුම් කර නොමැත. ශ්‍රී ලංකාවේ විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපළ ලෙස මත්තල තෝරාගැනීම සහ එහි මෙහෙයුම් කටයුතු මැයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද විශේෂ වාර්තාවක මෙම කරුණු පෙන්වා දී ඇත.

මත්තල ගුවන් තොටුපළෙහි වියදම් (රුපියල්)

| වර්ෂය | සේවක දීමනා | විදුලිය | ජලය | සේවක ප්‍රවාහනය | එකතුව |
|---|---|---|---|---|---|
| 2013 | 329,879,733 | 40,575,111 | 7,785,664 | - | 378,240,540 |
| 2014 | 550,917,408 | 144,661,652 | 11,309,701 | - | 706,888,761 |
| 2015 | 609,462,234 | 99,296,600 | 8,950,628 | 38,444,068.91 | 756,153,531 |
| 2016 | 573,639,695 | 94,850,239 | 12,302,743 | 16,426,953.86 | 697,219,631 |
| 2017 | 762,736,373 | 95,951,813 | 11,219,243 | 13,088,511.20 | 882,995,940 |
| 2018 | 714,691,811 | 86,076,721 | 8,575,481 | 13,446,238.00 | 822,790,251 |
| 2019 | 721,995,387 | 81,428,534 | 8,428,183 | 13,909,957.00 | 825,762,061 |
| 2020 | 679,359,246 | 81,871,722 | 9,728,542 | 21,254,435.10 | 792,213,945 |
| 2021 | 876,696,213 | 97,162,163 | 11,426,917 | 20,843,772.98 | 1,006,129,066 |
| 2022 | 1,069,266,849 | 87,021,106 | 13,765,349 | 31,935,732.40 | 1,201,989,036 |
| එකතුව | 6,888,644,949 | 908,895,661 | 103,492,451 | 169,349,669.45 | 8,070,382,730 |

ඒ සමගම ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ආදායම් කළමනාකරණ, සැලසුම් සහ වාණිජ අංශයේ ප්‍රධානියා ලෙස එවකට කටයුතු කළ සුමුදු උපතිස්ස මහතා පැවසුවේ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මෙහෙයුම් ආරම්භ කිරීම සම්බන්ධයෙන් අදාළ බලධාරීන් විසින් කිසිදු ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොකළ බවයි.

මෙම කාරණයේදී 2018 ජනවාරි 31 වැනිදා ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකන් කේටරින් සහ මිහින් ලංකා යන ආයතනවල සිදු වූ අක්‍රමිකතා පිළිබඳව සොයා බැලීම සඳහා හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් ජනාධිපති කොමිසමක් පත් කරන ලදී.

විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරු අනිල් ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් විනිසුරුවරුන් වන කාමිණී රොහාන් අමරසේකර, පියසේන රණසිංහ, විශ්‍රාමලත් නියෝජ්‍ය විගණකාධිපති දොන් ඇන්තනි හෙරොල්ඩ්, ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති අධීක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වසන්ත කීගනක යන මහත්ම මහත්මීන්ගෙන් සමන්විත කමිටුවේ අවසන් වාර්තාවේ  තමන් හඳුනා ගැනීමට කැමති, ශක්‍යතා අධ්‍යයනයක් සිදු නොවූ බව තහවුරු වූ බව තම අනන්‍යතාවය හෙළි කිරීමට අකැමති වූව කොමිසමේ සාමාජිකයෙක් විසින් තහවුරු කළේය.

එම වාර්තාවේ දැක්වෙන්නේ 'ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ගුවන් ගමන් මත්තල හරහා ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත්තේ කිසිදු ශක්‍යතා අධ්‍යයනයකින් තොරව බවයි. 2013 පෙබරවාරි 14 වැනි දින ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ සභාපති නිශාන්ත වික්‍රමසිංහ සහ ප්‍රධාන අලෙවි නිලධාරී ඝ.ඔ. ජයසීලන් සහභාගි වූ අරලිය ගහ මන්දිරයෙහි පැවති සාකච්ඡාවකදී මෙම තීරණය ගෙන ඇතත්, ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී සහ කළමනාකාරීත්වය මෙම තීරණය පිළිබඳව සතුටු නොවුනු බවයි.

එමෙන්ම ගුවන් තොටුපළක් පිහිටුවීමේදී විනිවිදභාවයෙන් යුතුව ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමෙන් පිරිවැය සහ මූල්‍ය තිරසාරභාවය, වෙළෙඳපොළ විශ්ලේෂණය, තාක්ෂණික සහ මෙහෙයුම් සලකා බැලීම්, සමාජ-ආර්ථික බලපෑම් සහ අවදානම් තක්සේරුව ඇතුළු කරුණු පහක් ඵලදායී ලෙස කළමනාකරණය කළ හැකි බව යාපනය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (සැලසුම්) සෙල්වරාසා රවීන්ද්‍රන් මහතා පෙන්වා දෙයි.

ඒ අනුව ඔහු කරුණු පහ මෙසේ පැහැදිලි කරයි.

පළමුව, පිරිවැය ඵලදායීතාවය සහ මූල්‍ය තිරසාරත්වය යන ගැටලුව හරහා සැලසුම් කිරීම, ඉදිකිරීම්, මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා වැයවන පිරිවැය ඇස්තමේන්තු කිරීම මගින් ගුවන් තොටුපළක් ඉදිකිරීමේ මූල්‍ය ශක්‍යතාව තක්සේරු කිරීමට අධ්‍යයනය උපකාරී වේ. මේ මත පදනම්ව, මගී ගාස්තු, ගුවන් ගමන් ගාස්තු සහ ගුවන් තොටුපළ තුළ ඇති වාණිජ කටයුතු වැනි විභව ආදායම් මාර්ග විශ්ලේෂණය කළ හැකිය. ව්‍යාපෘතිය මූල්‍යමය වශයෙන් ශක්‍යද සහ දිගුකාලීනව තිරසාරද යන්න තීරණය කිරීමට මෙම තොරතුරු උපකාරී වේ

දෙවනුව, වෙළඳපල විශ්ලේෂණය හරහා, මගී ගමනාගමනය, ගුවන් ගමන් මනාපයන්, සංචාරක ප්‍රවණතා සහ ආර්ථික දර්ශක වැනි සාධක පරීක්ෂා කිරීමෙන් ගුවන් තොටුපළක් සඳහා වෙළඳපල ඉල්ලුම තහවුරු කර ගත හැකිය. එය ගුවන් තොටුපල මෙහෙයුම් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ඉල්ලුමක් තිබේද යන්න සහ එය ගුවන් සමාගම් සහ මගීන් ආකර්ෂණය කර ගත හැකිද යන්න හඳුනා ගැනීමට උපකාරී වේ. වෙළඳපල අවශ්‍යතා ඵලදායි ලෙස සපුරාලීමට අවශ්‍ය ගුවන් තොටුපළේ ප්‍රමාණය, පහසුකම් සහ සේවා තීරණය කිරීමට ද මෙම විශ්ලේෂණය උපකාරී වේ.

තෙවනුව, ගුවන් තොටුපළක් ඉදිකිරීමේ තාක්ෂණික ශක්‍යතාව තක්සේරු කළ හැක්කේ ඉඩම් ලබා ගැනීමේ හැකියාව, භූ විෂමතාව, පාරිසරික බලපෑම, යටිතල පහසුකම් අවශ්‍යතා සහ තාක්ෂණික සහ මෙහෙයුම් සලකා බැලීම් අනුව ප්‍රවේශ වීමේ හැකියාව වැනි සාධක පරීක්ෂා කිරීමෙනි. එයට ගුවන් ගමනාගමන පාලනය, ධාවන පථ ධාරිතාව, පර්යන්ත පහසුකම්, සැපයුම්; එය හැසිරවීම, ආරක්ෂක පියවරයන් සහ හදිසි සේවා ඇතුළු මෙහෙයුම් අංශ ද ඇගයීමට ලක් කරයි. මෙමගින් ගුවන් තොටුපළ කාර්යක්ෂමව ක්‍රියාත්මක වන බව සහ නියාමන ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරයි.

හතරවනුව, සමාජ ආර්ථික බලපෑම අනුව,  ගුවන් තොටුපල කලාපයට ගෙන ආ හැකි සමාජ ආර්ථික ප්‍රතිලාභ පරීක්ෂා කරයි. එය රැකියා, සංචාරක, වෙළඳාම, ආයෝජන සහ සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි ඇති බලපෑම තක්සේරු කරයි. එසේම, එය ගුවන් තොටුපළක් ඉදිකිරීමේ ධනාත්මක සහ ඍණාත්මක බලපෑම් අවබෝධ කර ගැනීමට පාර්ශවකරුවන්ට උපකාර කරයි.

පස්වනුව, අවදානම් තක්සේරුව ගුවන් තොටුපළක් ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විභව අවදානම් සහ අභියෝග හඳුනා ගැනීමට උපකාරී වේ. නියාමන අවශ්‍යතා, දේශපාලන ස්ථාවරත්වය, ඉදිකිරීම් අවදානම්, වෙළඳපල අවිනිශ්චිතතා සහ තරඟකාරීත්වය වැනි සාධක විශ්ලේෂණය කිරීම මෙයට ඇතුළත් වේ. මෙම අවදානම් තක්සේරුව පාර්ශ්වකරුවන්ට විභව බාධක තේරුම් ගැනීමට සහ ඒවා අවම කිරීම සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමට මග පෙන්වයි.

මෙහිදී දකුණු පළාතේ තරුණ තරුණියන්ගේ විරැකියාව, ආර්ථික පසුබිම වැනි විවිධ හේතූන් මත එවකට පැවැති රජයට එරෙහිව විප්ලව සහ ප්‍රචණ්ඩ ක්‍රියා ගොඩනැගුණු බැවින් දකුණු පළාතට ප්‍රමුඛත්වය ලබා දෙමින් ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා 1994 දී අඹන්තොට නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර වරායක් හා  ජාත්‍යන්තර ගුවන් තොටුපළක්

ඉදිකිරීමටද සැලසුම් කර තිබිණි.

මීට අමතරව, එහි ඉදිකිරීමට නියමිත ගුවන් තොටුපළ මගින් අඹන්තොට ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල ප්‍රධාන කාර්යයන් ඉටු කරන අතර කලාපයේ ගුවන් මෙහෙයුම් සංවර්ධනයේ වෙළඳපල කොටස අත්පත් කර ගැනීම, වරාය සමඟ හම්බන්තොට ගුවන් හා මුහුදු හුවමාරු මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම සහ නැගෙනහිර සහ දකුණු මුහුදු තීරයේ සංවර්ධන කටයුතුවල ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම, ශ්‍රී ලංකාව සඳහා ආර්ථික හා ආයෝජන අවස්ථා නිර්මාණය කිරීමට පහසුකම් සැලසීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම එහි අරමුණු විය.

විකල්ප ගුවන් තොටුපළක් සඳහා ස්ථානයක් තෝරාගැනීමේදී දරන ලද වියදම

(මත්තල තෝරාගැනීමට පෙර)

ප්‍රදේශ

පිරිවැය විස්තර වියදම්

කොග්ගල

මූලික මෙහෙයුම් කටයුතු සකස් කිරීම සඳහා ඉඩම් මැනුම් කටයුතු 100,000.00

හිගුරන්ගොඩ

මූලික මෙහෙයුම් කටයුතු සකස් කිරීම සඳහා ඉඩම් මැනුම් කටයුතු 3,608,355.00

කුඩා ඔය වැඩබිමට ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම 3,274,000.00

කුඩා ඔය වෙනත් කටයුතු 479,572.00

වීරවිල

හූ විද්‍යා සමීක්ෂණ, ඉඩම් මැනීම, තාවකාලික කාර්යාල ගොඩනැගිලි, පිවිසුම් මාර්ග සකස් කිරීම, ඉඩම් අත්පත් කර ගැනීමේ මූලික කටයුතු, මුල්ගල තැබීමේ උත්සවය, නිලධාරීන්ගේ ගමන් බිමන්, නවාතැන් පහසුකම්, අනෙකුත් වියදම් 44,976,861.00

එකතුව 52,438,788.00

ඒ අනුව විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපළක් සඳහා සුදුසු ප්‍රදේශයක් තෝරා ගැනීමේදී පලාලි, කොග කල, හිඟුරන්ගොඩ, කුඩාඔය, වීරවිල ඇතුළු විවිධ ස්ථාන හඳුනාගෙන මූලික සමීක්ෂණ, වාර්තා සැකසීම, මිනුම් කටයුතු සහ මුල්ගල් තැබීමේ උත්සවය දක්වා කටයුතු සඳහා එවකට රජයන් රුපියල් 52,438,788ක් වැය කර ඇත.

විශේෂයෙන්ම කන්කසන්තුරේ (1971 - 1972) සහ කොග්ගල (1994 - 2004) අත්හැරීමට හේතු අනාවරණය වී නොමැත. ශක්‍යතා වාර්තාව සකස් කොට ඇත්තේ ත්‍රිකුණාමලය (1986) සහ පලාලි (2003 - 2012) ප්‍රදේශ සඳහා පමණි.

මතුගම (2001) සහ බඳගිරිය (2003) පාරිසරික හා පුරාවිද්‍යාත්මක ගැටලු හේතුවෙන් අත්හැර දමන ලදී.

හිඟුරන්ගොඩ (1992 - 2003) සහ කුඩාඔය (2003) වැනි ප්‍රදේශ තවදුරටත් ගවේෂණ කිරීම සඳහා රජයෙන් මුදල් ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් වැඩිදුර ගවේෂණ කටයුතු සිදු නොවූ අතර වීරවිල (2006) ප්‍රදේශය තෝරාගනු ලැබුවේ හම්බන්තොට වරාය සමඟ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා අවශ්‍ය ඉඩම් අත්පත් කර ගැනීමේ පහසුව හේතුවෙනි.

එහෙත් ප්‍රදේශවාසීන්ගේ විරෝධයෙන් පසු මෙම ගුවන් තොටුපළ ඉදිකිරීමේ පළමු අදියර 2009 නොවැම්බර් 27 වැනි දින අඹන්තොට නගරයට කිලෝමීටර් 15ක් උතුරින් පිහිටි කුඩා නගරයක් වන මත්තල ප්‍රදේශයේ ආරම්භ කරන ලදී.

හෙක්ටයාර 2000 ක මාතල ගුවන් තොටුපළ ව්‍යාපෘතිය සෘජු ඉදිකිරීම් සඳහා හෙක්ටයාර් 800 ක භූමි ප්‍රමාණයකින් සහ පාරිසරික හා යටිතල පහසුකම් සඳහා ඉඩම් හෙක්ටයාර 1200 කින් සමන්විත වේ.

එසේම 2013 මාර්තු මාසයේදී මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළට අනුකූලතා සහතිකයක් සහ ගගනගාමී සහතිකයක් ප්‍රදානය කරන ලද අතර, මෙහෙයුම් කටයුතු සඳහා 2013 මාර්තු 18 වන දින එවකට ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් ගුවන් තොටුපළ විවෘත කරන ලදී.

ඩුබායි සිට ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් ඔ340 ගුවන් යානය එදින මත්තලට පැමිණි ප්‍රථම වාණිජ ගුවන් යානය වන අතර ඉන් පසුව ඩුබායි සිට මගීන්

රැගෙන ඩුබායි ගුවන් සේවය ද සාජා සිට එයාර් ඇරබියා ගුවන් යානය ද පැමිණෙනු ලැබිණියේය.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීම මගින් ගුවන් මගීන් සහ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සහ එමගින් ආදායම වැඩි කිරීම සඳහා 2013 සහ 2014 වසරවල පිළිවෙලින් රුපියල් 210,088,015 ක් සහ රුපියල් 54,231,197 ක් වැය කර ඇත.

මත්තල ගුවන් තොටුපළෙහි ගුවන් ගමනාගමනය වැඩි කිරීමට ගෙන ඇති පියවර සඳහා ඒ සඳහා ගොස් ඇති වියදම්

උපාය මාර්ගය

කටයුතු

2013 වර්ෂය සඳහා වියදම

2014 වර්ෂය සඳහා වියදම

අපේක්ෂිත ගුවන් සේවා සඳහා දිරි දීමනා

රැස්වීම් 1,500,000.00 -

ජාත්‍යන්තර සංවර්ධනය ජාත්‍යන්තර ඩිජිටල් මාධ්‍ය ප්‍රචාරණ ක්‍රියාකාරකම්

67,058,224 1,468,972

මුද්‍රිත මාධ්‍ය ප්‍රචාරණය

4,753,886

36,240,032

දේශීය මාධ්‍ය

දේශීය ඩිජිටල් මාධ්‍ය ප්‍රචාරණ ක්‍රියාකාරකම්

81,145,663

2,522193

මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල ප්‍රවර්ධනය කිරීමේ කටයුතු

-

6,300,000

දැවැන්ත ප්‍රචාරක දැන්වීම් බැනර්

47,000,000 -

සමාජ මාධ්‍ය

වෙබ් අඩවි සංවර්ධනය සහ ෆෙස්බුක් අන්තර්ගත නිර්මාණ

4,315,111 -

වෙබ් අඩවි සංවර්ධනය, ෆෙස්බුක් සමාජ ජාලය, ක්‍රීඩා සමාජ මාධ්‍ය

පිටු සකස් කිරීම, නිර්මාණය, සමාජ මාධ්‍ය නඩත්තුව, වෙබ් අඩවි නඩත්තුව සහ සේවා

2,800,000

ප්‍රධාන ලාංජන නිර්මාණය සහ කලා කෘති

11,515,111 -

මත්තල ගුවන් තොටුපලේ නාමය සංවර්ධනය වෙළඳ ප්‍රචාරණ ව්‍යාපාරය

-

4,100,000

මුද්‍රණ ලිපි ද්‍රව්‍ය

-

3,600,000

එකතුව

210,088,015

54,231,197

කෙසේ වෙතත්, 2015 වසරේ සිට, ශක්‍යතා අධ්‍යයන වාර්තාවට අනුව අපේක්ෂිත පිරිවැය වසරින් වසර සියයට 80 කට වඩා පහත වැටීම නිසා නඩත්තු පිරිවැය විශාල ලෙස ඉහළ යාමට පටන් ගෙන තිබේ. මෙය අවසානයේ තීරණාත්මක තත්ත්වයකට මඟ පෑදීය.

2021 වසරේ ගුවන් තොටුපළේ මෙහෙයුම් වියදම රුපියල් බිලියන 2.02 ක් වූ අතර එය මෙහෙයුම් ආදායමට වඩා 21 ගුණයකින් වැඩි බව විගණන වාර්තාවේ දැක්වේ.

සමාලෝචන වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් බිලියන 4.44 ක් වූ අතර 2017 සිට 2021 දක්වා බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය රුපියල් බිලියන 20.59 කි.

මත්තල ගුවන් තොටුපළේ ප්‍රක්ෂේපිත වාර්ෂික මගී ධාරිතාව මිලියනයක් පමණ වුවද, පසුගිය වසර පහ තුළ මුළු මගීන් සංඛ්‍යාව 91,747 ක් පමණක් වූ අතර පසුගිය වසර පහ තුළ මුළු ගුවන් ගමන් සංඛ්‍යාව 2,396 කි.

එසේම ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා වැය කළ ඇමෙරිකානු ඩොලර් මිලියන 247.7 ට සමාන රුපියල් මිලියන 36,564ක් ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගෙන නොමැති බව ද විගණන වාර්තාව මගින් නිරීක්ෂණය වේ.

එසේම, එම චීන එක්සිම් බැංකුවෙන් ලබාගත් ඩොලර් මිලියන 189.8 ක ණය සඳහා පොලී කළමනාකරණ ගාස්තු සහ වගකීම් ගාස්තු සඳහා 2010 සිට 2015 දක්වා රුපියල් 109,484,835 ක්, රුපියල් 172,403,390 ක් සහ රුපියල් 1,707,926,794 ක් භාණ්ඩාගාරයෙන් ගෙවා ඇත.

මීට අමතරව, ණය මුදල වාරික වශයෙන් ගෙවීම 2015 සැප්තැම්බර් මාසයේ සිට ආරම්භ කර ඇති අතර එහි පළමු වාරිකය ඇමෙරිකානු ඩොලර් මිලියන 8.4 ක් ගෙවා ඇත්තේ ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසිනි.

මත්තල ගුවන් තොටුපළේ මූල්‍ය පාඩු

| වර්ෂය | ආදායම (මිලියන) | වියදම (මිලියන) | අලාභය (මිලියන) |
|---|---|---|---|
| 2013 | 48.01 | 3,348.62 | 3,300.61 |
| 2014 | 136.10 | 3,234.78 | 3,098.69 |
| 2015 | 71.10 | 5,527.85 | 5,456.75 |
| 2016 | 48.08 | 3,947.04 | 3,898.97 |
| 2017 | 77.27 | 3,467.36 | 3,390.09 |
| 2018 | 22.54 | 7,103.85 | 7,081.32 |
| 2019 | 16.21 | 2,738.78 | 2,722.56 |
| 2020 | 42.59 | 3,741.18 | 3,698.58 |
| 2021 | 93.47 | 4,504.27 | 4,410.80 |
| 2022 | 78.00 | 21,156.15 | 21,078.15 |
| එකතුව | 633.36 | 58,769.88 | 58,136.52 |

මත්තල ගුවන් තොටුපළ දැනට උපයන ආදායම එහි මෙහෙයුම් වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බව විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති අතර එමඟින් සීමාසහිත ගුවන් තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමට දැවැන්ත ආර්ථික ගැටලු මතු වී තිබේ.

ඒ අනුව මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් 2013 - 2022 කාලය තුළ රුපියල් මිලියන 633.36 (633,364,859.00) ආදායමක් ලැබී ඇති අතර ගුවන් තොටුපලේ වියදම ලෙස රුපියල් මිලියන 58,769.88 (58,769,883,088.00) ක මුදලක් වැය වී ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත හරහා ලබාගත් තොරතුරු මගින් තහවුරු කර ඇත.

මෙවැනි තත්වයක් තුළ 2015 න් පසු සහල් අලෙවි මණ්ඩලය සඳහා ගුවන් තොටුපළේ භාණ්ඩ ප්‍රවාහනය කරන ප්‍රදේශ භාවිතය සඳහා රජයේ අවසරය ලබා දී ඇත. ඉන් අනතුරුව මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වී ගබඩා කරන ස්ථානයක් බවට පත් විය.

මේ අතර මෙම ගුවන් තොටුපළ අලින් ගැවසෙන ප්‍රදේශයක පිහිටීම හේතුවෙන් රාත්‍රි කාලයේදී ඔවුන්ගේ ගමනාගමනය පාලනය කර ගැනීමට නොහැකි විය. 2016 දී වන සතුන් ගුවන් තොටුපළෙන් පලවා හැරීම සඳහා ආරක්ෂක නිලධාරීන්, පොලිසිය සහ ස්වේච්ඡා සේවකයන් 300 ක් යොදවා ඇත. කෙසේ වෙතත්, මෙම යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ වඩාත් ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත්කිරීම සඳහා සංචාරක අමාත්‍යාංශය පස් අවුරුදු සංවර්ධන සැලැස්මක් ආරම්භ කර තිබුණි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා වසරකට මගීන් දස ලක්ෂයක් සහ භාණ්ඩ මෙට්රික් ටොන් 45,000ක් හැසිරවීමට සැලසුම් කර ඇත.

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම විසින් 'ආකර්ශනීය ගමනාන්තයක්' නම් තේමාව යටතේ සකස් කරන ලද මෙම පස් අවුරුදු සැලැස්ම හරහා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ 2025 වන විට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ හා සමානව සක්‍රීය ගුවන් තොටුපළක් බවට පත් කිරීමට අපේක්ෂා කරන ලදී. නමුත් අද වනතුරුත් ගුවන්තොටුපළ ආදායම් උපයන මාර්ගයක් ලෙස ක්‍රියාත්මක කරගත නොහැකි තත්වයක් උදා වී ඇත.

පැමිණි මගීන් සහ ගුවන් ගමන් සංඛ්‍යාව

| වර්ෂය | මගීන් සංඛ්‍යාව | ගුවන් ගමන් ගණන |
|---|---|---|
| 2013 | 36,137 | 760 |
| 2014 | 40,386 | 1,492 |
| 2015 | 6,291 | 522 |
| 2016 | 6,207 | 659 |
| 2017 | 22,972 | 709 |
| 2018 | 3,403 | 355 |
| 2019 | 1,403 | 393 |
| 2020 | 17,544 | 250 |
| 2021 | 32,957 | 361 |
| 2022 | 11,667 | 132 |
| එකතුව | 178,967 | 5,633 |

මෙහිදී රටේ විකල්ප ජාත්‍යන්තර ගුවන් තොටුපළේ අනාගත සංවර්ධනය සඳහා කරන ලද ආයෝජනයක් ලෙස, වැඩිදුර සංවර්ධනය සඳහා, ගුවන් තොටුපළ සඳහා සකස් කර ඇති උපාය මාර්ගික මූල්‍ය අලෙවි සැලසුම්වල උපායශීලී ක්‍රමවේද අනුගමනය කර ඒවායේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම, වැඩි කිරීමට දායක වන පොදු ප්‍රවාහන පහසුකම් ස්ථාපිත කිරීම ගුවන් සේවා, අධිවේගී මාර්ග ඉදිකිරීම කඩිනම් කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය, කර්මාන්ත ශාලා පිහිටුවීම, ජාත්‍යන්තර ගුවන් තොටුපළ වඩා හොඳ ආර්ථික මධ්‍යස්ථානයක්

ලෙස සංවර්ධනය කිරීම සහ සංචාරකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීම වැනි වෙනත් උපාය මාර්ග හදිසි හා අත්‍යවශ්‍ය කටයුත්තක් ලෙස ක්‍රියාත්මක කළ යුතුය. .

# නොරොච්චෝලේ තාප විදුලි ව්‍යාපෘතිය: ශ්‍රී ලංකාව උගුලකට හසු වීද ?

වී. ප්‍රියදර්ශන්

ශ්‍රී ලංකාවේ විදුලි අවශ්‍යතා සපුරාලීම සඳහා ඉදිකරන ලද ලක්විජය බලාගාරය හෙවත් නොරොච්චෝලේ තාප විදුලි බලාගාර ව්‍යාපෘතිය රට අමාරුවේ දමන්නටම චීනයෙන් ලැබුණු තෑග්ගක් ලෙස සැලකිය හැකිය.

එපමනක් නොව, එමඟින් ශ්‍රී ලංකාවේ දැනට පවතින විදුලි බිල වැඩිවීම කෙරෙහි ද විශාල බලපෑමක් ඇති කොට ඇත. නොරොච්චෝලේ බලාගාරය හේතුවෙන් ඒ අවට ප්‍රදේශයේ ස්වභාවික සම්පත්වලට, ජනතාවගේ සෞඛ්‍යයට හා පරිසරයටද විශාල හානියක් සිදු කරන අතර විදුලි බලාගාර නිතර ඇනහිටීමෙන් විදුලි ඉල්ලුම සපුරාලීමට නොහැකි වන අතර ඒ සඳහා නාස්තිකාර වියදම් සිදුකිරීමටද සිදුව ඇත.

යථාර්ථය නම් මෙය දිගුකාලීන සමාජ හා පාරිසරික ගැටලුවකි. බොහෝ රටවල් ශ්‍රී ලංකාව වැනි රටවල මෙවැනි වැඩසටහන් ක්‍රියාත්මක කරන්නේ තම අයුතු අරමුණු ඉටු කර ගැනීම සඳහා ය.එපමණක් නොව මෙම නිෂ්ඵල ව්‍යාපෘතිය ශ්‍රී ලංකාව විශාල ණය උගුලක සිරකොට ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පනත හරහා ඉල්ලාගත් තොරතුරු වලින් ගම්‍යමාන වේ. ශ්‍රී ලංකාවේ සිදු කෙරෙන විදේශීය ණය සංවර්ධන ව්‍යාපෘති බොහොමයක් චීනයේ ණය ව්‍යාපෘති වීමද සැලකිල්ලට ගත යුතු කරුණකි.

පුත්තලම දිස්ත්‍රික්කයේ පාලාවි - කල්පිටිය ප්‍රධාන මාර්ගයේ සිට මීටර් 100 ක පමණ දුරින් වෙරළ තීරයේ හෙක්ටයාර් 95 ක භූමි ප්‍රමාණයක නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය පිහිටා ඇත.

නොරොච්චෝලේ තාප බලාගාර ව්‍යාපෘතිය චීන සමූහාණ්ඩුවේ අපනයන හා ආනයන බැංකුවේ සහාය ඇතිව ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයේ මුලපිරීමෙන් ක්‍රියාත්මක වී ඇත.

එය ශ්‍රී ලංකාවේ පළමු ගල් අඟුරු තාප බලාගාරය වන අතර දැනට ක්‍රියාත්මක වන විශාලතම විදුලි බලාගාරය ද වේ.

චීනයේ එක්සිම් බැංකුවෙන් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයෙන් ඩොලර් මිලියන 1346 ක ණය මුදලක් ලබාගෙන නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදිකර ඇත. මෙම ණය මුදල ගෙවීමේ වගකීම ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය භාරගෙන නොමැති අතර එය මහා භාණ්ඩාගාරය විසින් භාරගෙන ඇත. එබැවින් මෙම නොරොච්චෝලේ තාප බලාගාර ව්‍යාපෘතිය මහා භාණ්ඩාගාරයටද බරක් වී ඇත.

මේ ආකාරයට ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මේ වන විට රුපියල් බිලියන 516 ක මුදල් හිඟයකට මුහුණ දී සිටී.විදුලි උත්පාදන පිරිවැය කළමනාකරණය කිරීම සඳහා විදුලි ගාස්තු කලින් කලට නැවත සකස් නොවීම හේතුවෙන් විදුලිබල මණ්ඩලය දැවැන්ත මූල්‍ය අර්බුදයකට මුහුණ දී සිටියි.

චයිනා මැෂිනරි ඉංජිනියරින් කෝපරේෂන් (ඎයසබ් ඒජයසබැරහ ැබටසබැැරසබට ඎදරචදරඑසදබ -ඎඑැක) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් වල ප්‍රධාන හවුල්කරු වේ. බලාගාරයේ ඉදිකිරීම් කටයුතු පවා සිදු කරණ ලද්දේද චීන ජාතිකයන් විසින් වන අතර ඒ සඳහා යොදාගත් උපකරණ සහ අමුද්‍රව්‍ය පවා චීනයෙන්ම ගෙන්වන ලදී.

නොරොච්චෝලේ තාප බලාගාරයේ සමස්ත සැලසුම වන්නේ මෙගාවොට් 900ක විදුලිය නිපදවිය හැකි තාප බලාගාර තුනක් පිහිටුවීමයි.

ශ්‍රී ලංකාවේ ජල විදුලි නිෂ්පාදනයට දැරීමට සිදුවන වියදමට වඩා තාප විදුලිය නිෂ්පාදනයට දැරිය යුතු වියදම අඩු වන බව නොරොච්චෝලේ තාප බලාගාර ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කළ පාර්ශවයන්ගේ සාධාරණීකරණය ලෙස එදා සැලකිණි.

නමුත් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ඉල්ලා ගත් තොරතුරුවලට අනුව, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් ගල් අඟුරු මිලදී ගැනීම

සඳහා 2018 වර්ෂයේදී රුපියල් මිලියන 38,823.24 ක්ද , 2019 වර්ෂයේදී රුපියල් මිලියන 46,565.53 ක්ද , 2020 වර්ෂයේදී රුපියල් මිලියන 42,804.88 ක්ද , 2021 වර්ෂයේදී රුපියල් 47,310.66 ක්ද , 2022 වර්ෂයයේදී රුපියල් මිලියන 135,125.74 ක්ද වියදම් කර ඇති බව තහවුරු වී තිබේ.

මේ අනුව ගල් අඟුරු මිලදී ගැනීම් සඳහා වැය කරන මුදල් සෑම වසරකම වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. මෙමගින් නිපදවන විදුලිය සහ ඉදිරියේදී වැයවන මුදල අතර විශාල පරතරයක් පෙන්නුම් කරන බවට සැකයක් නැත. එහි බලපෑම දැන් විදුලි ගාස්තු වැඩිවීමට ද හේතුවක් වී ඇති බව ජනතාවටද තේරුම් ගොස් ඇත.

චීනයේ එක්සිම් බැංකුව සහ ශ්‍රී ලංකාව අතර අත්සන් කර ඇති මිලදී ගැනීමේ ණය ගිවිසුමට අනුව ණය ආපසු ගෙවීමේ කාලය වසර 15ක් වන අතර එම ණය මුදල වසරකට වාරික දෙකක් ලෙස ගෙවීමට නියමිතය.

මෙම බලාගාරය මෙරට විදුලි ඉල්ලුමෙන් සියයට පනහක් 50% ක් සපුරාලන බව පැවසෙන අතර එහි විදුලි නිෂ්පාදනයේදී නිතර සිදුවන තාක්ෂණික දෝෂ හා ඇනහිටීම් සහ දැරිය නොහැකි නිෂ්පාදන පිරිවැය ශ්‍රී ලංකාව අර්බුදකාරී තත්වයක් නිර්මාණය කිරීමට සමත් වී ඇත.

පසුගිය 2018 වසරේ සිට 2022 වසර දක්වා නොරොච්චෝලේ තාප බලාගාරයෙන් ලබන්නා වූ ලාභයට වඩා පිරිවැය ඉතාමත් වැඩි බව දැකගත හැකිය. එබැවින් මෙම තාප බලාගාරය පවත්වාගෙන යාමෙන් අනාගතයේ කිසිදු ප්‍රතිලාභයක් අත් නොවන බව පැහැදිලිය.

චීනය විසින් ලංකාවට ඉදිකර ඇති මෙම තාප බලාගාරය බොහෝ දෙනෙකු දකින්නේ ලංකාවේ ආර්ථිකයට දරාගත නොහැකි, තාක්ෂණික ගැටලු රැසක් සහිත අලුත්වැඩියා ද කළ නොහැකි අර්බුදයක් ලෙසිනි.

තාප බලාගාරයෙන් පිටවන අපද්‍රව්‍ය අවසර ලත් ප්‍රමිතීන් ඉක්මවා ගොස් ඇති අතර එමෙන්ම නිතර සිදුවන ඇනහිටීම්, කඩින් කඩ අලුත්වැඩියාව, අනපේක්ෂිත ලෙස අළු විවෘත වළවල්වල එකතු කර තිබීම වැනි අර්බුද රැසක් මෙහි දක්නට ලැබේ.

නොරොච්චෝලේ බලාගාරය මුල් කාලයේ ගැටලුවක් නොමැතිව ක්‍රියාත්මක වුවද පසුව බලාගාරයේ ජනන යන්ත්‍ර නිතර අක්‍රිය වීම සාමාන්‍ය තත්ත්වයට පත් විය. එහි අලුත්වැඩියාව සඳහා චීනයෙන් ඉංජිනේරුවන් ගෙන්වීමට සිදුව ඇත. මෙලෙස විශාල වශයෙන් මුදල් වැය කරන විදේශ ණය සංවර්ධන ව්‍යාපෘති රට තව තවත් විනාශය කරා ගෙන යනු ඇති බවට සැකයක් නැත.

විදේශ ණය සංවර්ධනයට මුවා වී දේශපාලකයන්ගේ සහ ඔවුන්ට සමීප හිතවතුන්ගේ සාක්කු පුරවාගැනීම නම් සිදුවී ඇති අතර පාලකයන් රටේ සුබසිද්ධිය හෝ ජනතා සුබසිද්ධිය තකා කිසිදු සැලසුමක් ක්‍රියාත්මක නොකරන බවද මනාව වැටහේ.

මේ ආකාරයට පසුගිය 2021 වසරේදී පමණක් නොරොච්චෝලේ තාප බලාගාරය 15 වතාවක් අක්‍රිය වී ඇති අතර 2022 දී 6 වතාවක් අක්‍රිය වී ඇති බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ලබාගත් දත්ත මගින් අනාවරණය වී තිබේ. කාලයාගේ ඇවෑමෙන් මෙය කුමන ආකාරයේ ප්‍රතිවිපාක ඇති කරාවීද ? යන ප්‍රශ්නාර්ථය ඉතුරු වී ඇත.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සේවකයන් 910 දෙනෙකු සේවය කරන අතර ඔවුන් සියලු දෙනාම පුහුණු ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් බව තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත මගින් ලබා ගත් තොරතුරු මගින් අනාවරණය වී ඇත.

මේ අනුව, 2021 වසරේදී පමණක් නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය 15 වතාවක් බිඳ වැටී ඇත. මෙම අලුත්වැඩියාවන් සඳහා වැය කරන ලද මුදල් ලැබුණු ආකාරය හෝ ලබා දුන්නේ කොතැනින්ද යන්න පිළිබඳව තොරතුරු, තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ඉල්ලා සිටියද ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් තොරතුරු ලබා දී නැති නමුත් 2022 වසරේ බලාගාරයේ සිදුවූ බිඳවැටීම් හයක් සඳහා වූ වියදම් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත.

එහි විස්තර පහත වගුවේ දක්වා ඇත.

එවැනි තත්ත්වයක් තුළ නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් නිපදවන විදුලිය පිළිබඳවද සතුටුදායක වන්නට නොහැකිය. නොරොච්චෝලේ බලාගාරය වැනි විදේශ ණය සංවර්ධන ව්‍යාපෘති ශ්‍රී ලංකාව ණය උගුලක සිර කරන සියුම් මෙහෙයුම් ලෙස බලන්නට සිදුව ඇත.

ලක්විජය බලාගාරය ලෙසින්ද හැඳින්වෙන නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ශ්‍රී ලංකාවේ සමස්ත විදුලි නිෂ්පාදනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නිෂ්පාදනය කරන්නේද යන්නද සැක සහිතය.

එසේම නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයෙන් පිටවන විෂ වායු, අම්ල සහ ගල් අඟුරු අළු නිසා ප්‍රදේශයේ වෙසෙන ජනතාවට මෙන්ම පරිසරයටද විශාල තර්ජනයක් එල්ල වී ඇත.

මෙම බලාගාරයෙන් පරිසරයට එල්ල වන තර්ජනය පිළිබඳව පරිසරවේදීන් මුල සිටම අනතුරු අඟවමින් සිටිති.

පරිසර විද්‍යාඥයින් පවසන පරිදි බලාගාරය ආසන්නයේ ශාක දැනටමත් හානි පිළිබඳ සලකුණු පෙන්නුම් කිරීමට ආරම්භ වී තිබේ. මෙම වායු විමෝචනය හේතුවෙන් උස ගස්වල කොළ කහ පැහැයට හැරීමට පටන් ගෙන ඇත. එළ වල වෙනස්කම් සිදුවී ඇත.

එසේම මෙම නිසා සාගර ප්‍රදේශවල ද ආම්ලිකතාවය අධික වෙමින් ඇත. එබැවින් අනාගතයේදී මෙවැනි හානිකර ගල් අඟුරු බලාගාර ශ්‍රී ලංකාවේ යළි ස්ථාපිත

කිරීම පරිසර පද්ධතියට තර්ජනයක් බවට අනතුරු ඇඟවීම් මතුව තිබේ.

බලාගාරයක් ඝන අපද්‍රව්‍ය, තාප අපද්‍රව්‍ය සහ උණු වතුර විශාල ප්‍රමාණයක් ජනනය කරයි, මෙමගින් ජල සහ පරිසර දූෂණය සිදු වේ. මෙය දිගුකාලීන පාරිසරික බලපෑම් ඇති කරයි.

ලක්විජය විදුලි බලාගාරයෙන් පිටවන වායු විමෝචනය (ඉපසිසදකි) පරිසරයට සහ ප්‍රාදේශීය ජනතාවට සැලකිය යුතු අහිතකර බලපෑම් ඇති කර ඇත.

ලක්විජය බලාගාරයේ ප්‍රධාන බලශක්ති ප්‍රභවය ගල් අඟුරු ය. එය ක්ෂය වෙමින් පවතින සම්පතකි. ගල් අඟුරු ක්ෂය වීම ගෝලීය වශයෙන් බලපා ඇති සංසිද්ධියකි. බලශක්ති අවශ්‍යතා සඳහා පොසිල ඉන්ධන මත යැපෙන සියලුම රටවලට මෙහි බලපෑම දැනෙමින් තිබේ.

බලාගාරයක් බොයිලර් ජලය, කන්ඩෙන්සර් සිසිලන ජලය වැනි විවිධ මෙහෙයුම් සඳහා භාවිතා කරනු ලබන්නේ මුහුදු ජලයයි. අධික ජල විසර්ජන අනුපාතය නිසා එය සාගර ජීවීන්, ක්ෂුද්‍ර ජීවීන් ඇතුළු එම ජීවීන්ගේ බිත්තර විනාශ වීමට හේතු වන අතර එය සාගර ජීවීන්ගේ අභිජනනය නිසියාකාරයව සිදු නොවී ඔවුන්ගේ වර්ගයා වඳ වී යාමටද හේතු විය හැක.

සාගර ජීවීන් හා විශේෂයෙන් මුහුදු කැස්බෑවන් බලාග ාරය ආශ්‍රිත මුහුදු ප්‍රදේශය අසල දකින්නට නොලැබෙන බව ප්‍රදේශවාසීන්, ධීවරයින් සහ සමුද්‍ර පර්යේෂකයන් පවසති. මුහුදු කැස්බෑ විශේෂ හතක් අතුරින් විශේෂ පහක්ම පුත්තලම - කල්පිටිය වෙරළාසන්න වෙරළ තීරයේ බෝ වන බව ජනතාව පවසති.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ ක්‍රියාකාරීත්වයේ දී නිපදවන අළු සහ වායු විමෝචනය ප්‍රධාන ගැටලු ලෙස සැලකේ. අළු විවෘතව බැහැර කිරීමද කනස්සල්ලට කරුණකි. මෙම අළු මයික්‍රෝන 10 ට වඩා කුඩා බැවින් ඒවා සුළඟින් පහසුවෙන් රැගෙන යන අතර කෘෂිකාර්මික ඉඩම්, ප්‍රදේශවාසීන්ගේ නිවාස, ජල මූලාශ්‍ර අපවිත්‍ර කර ජනතාවට විවිධ රෝග ඇති කිරීමට සමත් වී ඇත.

2015 වර්ෂයේදී වයඹ පළාත් පරිසර අධිකාරිය මගින් ලක්විජය තාප විදුලි බලාගාරය සඳහා ප්‍රථම පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කරන ලදී. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ කිසිදු සම්බන්ධයක් නොතිබූ අතර 2017/2018 වසර සඳහා බලපත්‍රය අලුත් කිරීම සඳහා 2017 ජුනි 14 දින පළාත් පරිසර අධිකාරිය වෙත පැමිණ අයදුම්පත ඉදිරිපත් කළද 2018 මැයි 10 වන දින දක්වා පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කර නොමැත.

පරිසර ආරක්ෂණ බලපත්‍රය නිකුත් කිරීමේ අරමුණ ඉටුකර ගැනීම සඳහා පළාත් පරිසර අධිකාරිය බලාග ාරයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොමැති අතර අනෙකුත් වගකිවයුතු සංවිධානවල අකාර්යක්ෂමතාව හේතුවෙන් අහිතකර පාරිසරික බලපෑම් ඇති වී ඇති බව නිරීක්ෂණය වූ බව 2019 මාර්තු 29 විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී ඇත.

නොරොච්චෝලේ බලාගාරය ආශ්‍රිත ප්‍රදේශවල නිවාසවල වෙසෙන කුඩා දරුවන් සහ වැඩිහිටියන් රැසකට චර්ම රෝග වැළඳී ඇති බවත්, එය බලධාරීන් විසින් සැලකිල්ලට නොගත් බවත් කියමින් ජනතාව කනස්සල්ල පළ කර සිටිති.

තාප බලාගාරය ආශ්‍රිතව ජීවත් වන බොහෝ පිරිසක් පිළිකා රෝගයෙන් පීඩා විඳිති. බොහෝ දරුවන්ගේ සමේ කුෂ්ඨ සහ බිබිලි ඇති වී ඇත. අලුත උපන් බිළිඳුන් පවා මෙම නිසා අනාරක්ෂිත තත්වයකට පත්ව ඇත. කලාපයේ ළමුන් සහ වැඩිහිටියන් ඇදුම වැනි ශ්වසන රෝග වලට ගොදුරු වී ඇත. ගල් අඟුරු දූවිලි ආශ්වාස කිරීමෙන් බ්රොන්කයිටිස්, නියුමෝනියාව, ඇදුම, එම්පිසීමාව සහ හෘද රෝග ඇති විය හැකි බවට ප්‍රදේශ වැසියන් බිය වෙති.

එසේම මෙම ප්‍රදේශයේ ජනතාව පානීය ජලය ලබාගැනීමටද දැඩි දුෂ්කරතාවකට මුහුණ පා සිටින අතර පානීය ජලය සඳහා මුදල් ගෙවීමට සිදුව ඇති බැවින් ඔවුන් දුෂ්කරතාවට පත්ව සිටිති. එම ප්‍රදේශය ආශ්‍රිත භූගත ජලය ද කහ පැහැයෙන් යුක්ත වේ. විශේෂයෙන්ම කරඹ ප්‍රදේශය ඇතුළු තාප බලාගාරය ආශ්‍රිත ප්‍රදේශවල වෙසෙන ජනතාව සෝමාලියාවේ ජීවත්වන ජනතාව හා සමාන තත්වයකට පත්ව ඇත.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන විටදී ඉඩම් අහිමිවීම, පරිසර දූෂණය හා සෞඛ්‍ය ගැටලු යන ප්‍රධාන කරුණු තුනක් මුල් කර ගනිමින් ප්‍රදේශවාසීන් විසින් විරෝධතා රැසක් මෙහෙයවන ලදී.

ජනතා අදහස්වලට ඇහුම්කන් නොදුන් පාලකයින් නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මේ වන විට මෙම බලාග ාරය හේතුවෙන් එම කලාපය දැවැන්ත පාරිසරික හා සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී සිටිනවා පමණක් නොව රටද ණය උගුලක සිරවී ඇත.

නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය හේතුවෙන් සමුද්‍ර සම්පතට, පරිසරයට සහ මනුෂ්‍යත්වයට එල්ල වී ඇති තර්ජන පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ කළ අනතුරු ඇඟවීම් රජය කනකට නොගැනීම කණගාටුවට කරුණකි. සාම්බූර්හි ජනාකීර්ණ ප්‍රදේශයේ ද මෙවැනි තාප විදුලි බලාගාර ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා උත්සාහයන් ගන්නා ලදී. ප්‍රදේශවාසීන්ගේ විරෝධය සහ මාධ්‍ය බලපෑම් හේතුවෙන් ව්‍යාපෘතිය අත්හැර දමන ලදී.

චීනය විසින් "එක් තීරයක්, එක් මාවතක්" ( ඊ්කඑ 'බා ඍඳා ඡබසඑස්එසඩැ ) ව්‍යාපෘතියේ කොටසක් ලෙස පාකිස්ථානය, ඉන්දුනීසියාව, බංග්ලාදේශය, සර්බියාව, කෙන්යාව සහ සිම්බාබ්වේ ඇතුළු රටවල ගල් අඟුරු බලාගාර ව්‍යාපෘති කිහිපයක ආයෝජනය කර ඇත. ඉන් එකක් ශ්‍රී ලංකාවේ නොරොච්චෝලේ තාප විදුලි බලාග

ාර ව්‍යාපෘතියයි.

චීන ආයෝජන විසින් ශ්‍රී ලංකාවේ ඉදිකළ අනෙකුත් ව්‍යාපෘති මෙන්ම, මෙම නොරොච්චෝලේ තාප විදුලි බලාගාර ව්‍යාපෘතියද රටට බරක් සහ මතභේදාත්මක ප්‍රශ්නයක් බවට පත්ව තිබේ. මෙම තාප විදුලි බලාගාරය ඉදිකළ දා සිට එහි තාක්ෂණික මෙහෙයුම් සහ චක්‍රීය බලපෑම් සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල විය. මෙම ව්‍යාපෘතිය තුළින් රටට කිසිදු සෙතක් නොමැති බවත් ශ්‍රී ලංකාව දූෂණයෙන් පිරුණු දැවැන්ත ණය උගුලක සිරවී ඇති බවත් රජයේ ලේඛන විසින්ම සනාථ කර ඇත.

Free Media Movement - 2023

FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

ISBN 978-624-5909-00-1

9 786245 909001